

# 2017
# වාර්ෂික වාර්තාව

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය





"දියර කිරි භාවිතය මෙරට තුළ ප්‍රචලිත කිරීමට නම් රට කිරිවලින්
ස්වයංපෝෂිත විය යුතුය. ඒ සඳහා අවශ්‍ය සියලු පියවර වත්මන් රජය විසින්
පියවරෙන් පියවර ක්‍රියාවට නංවමින් සිටියි."

# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් සුබ පැතුම් පණිවිඩයක් එක්කරන්නේ හදපිරි සතුටිනි. කලක් තිස්සේ පාඩු ලබමින් පැවති රාජ්‍ය ආයතනයක් නැවත ලාභ ලබන ආයතනයක් බවට පත්කරලීමේ කොටස්කරුවෙකු වීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් මා තුළ පවතින්නේ අභිමානයකි.

පාඩු ලබන ආයතනයක් ලාභ ලබන මට්ටම කරා දියුණු කිරීම අතිශය දුෂ්කර කාර්යයකි. එය එක මොහොතකින්, එක තීරණයකින් කළ හැකි දෙයක් නොව දීර්ඝකාලීන විධිමත් වැඩපිළිවෙලක අග්‍ර ඵලයකි. එහිදී නොසිතූ අත්දැකීම් මෙන්ම විවිධ කණ්ඩායම්වල අනිසි බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස අකටයුතුකම්වලට මුහුණ දීමට සිදු විය හැකිය. එම බාධක, අභියෝග හමුවේ සියල්ල ජයග්‍රහණය කරමින් මෙම ආයතනය ඉහළටම ඔසවා තබන්නට අපට හැකි වී තිබේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ලාභ ලබන ආයතනයක් බවට පත්කරලීමේ කාර්යභාරයට එහි අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමුඛ සෙසු කාර්ය මණ්ඩලය සුවිශේෂී දායකත්වයක් සැපයූ බව මෙහිලා විශේෂයෙන් සිහිපත් කළ යුතුය. ඔවුන්ගේ කැපවීම නොවන්නට මෙම ආයතනය තවමත් පාඩු ලබන ආයතනයක් ලෙස රජයට අනවශ්‍ය වැය බරක් වනු නොඅනුමානය.

රට හදන 'සෞභාග්‍යයේ දැක්ම' රාජ්‍ය ප්‍රතිපත්තිය තුළින් ක්‍රියාවට නංවනු ලබන නව ව්‍යාපෘතීන් හරහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විවිධ දිශානතීන් ඔස්සේ ස්වකීය කාර්යභාරය පුළුල් පරාසයක් තුළ ක්‍රියාවට නංවමින් සිටියි. විශේෂයෙන් කිරි ගොවීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම තුළ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට හැකියාව ලැබී ඇත. විවිධ පළාත් අනුව කිරි ලීටරයකට ගෙවන මුදලේ විෂමතාවයක් දක්නට තිබුණු අතර, මේ වනවිට එම විෂමතාවය ඉවත්කර සෑම කිරි ගොවියෙකුටම සමාන මිලක් ලබා දීමට පියවර ගන්නැයි අතිගරු ජනාධිපතිතුමා අදාළ පාර්ශවවලට උපදෙස් ලබා දී ඇත. කිරි ලීටරයක් සඳහා රුපියල් සියයක මුදලක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා තිබීම කිරි ගොවීන්ට ලබාදුන් විශාල සහනයකි.

දියර කිරි භාවිතය මෙරට තුළ ප්‍රචලිත කිරීමට නම් රට කිරිවලින් ස්වයංපොෂිත විය යුතුය. ඒ සඳහා අවශ්‍ය සියලු පියවර වත්මන් රජය විසින් පියවරෙන් පියවර ක්‍රියාවට නංවමින් සිටියි. කිරි ගොවීන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, නව තාක්ෂණය ලබාදීම වැනි උපක්‍රම තුළින් ගොවියා සවිබල ගැන්විය යුතුය. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වසරෙන් වසර ප්‍රගතිය වෙත පිය නඟනු දැකීම මාගේ අපේක්ෂාවයි. ඒ සඳහා ආයතනයේ සියලුදෙනාට කෘෂිකර්ම අමාත්‍යවරයා වශයෙන් මාගේ හෘදයාංගම සුබ පැතුම් එක් කරමි.

මහින්දානන්ද අලුත්ගමගේ,
කෘෂිකර්ම අමාත්‍ය.



“කිරෙන් සපිරි රටක්” නිර්මාණය කිරීමේ මා හැගි කර්තව්‍යයට ජාතික පශු සම්පත් සංවර්ධන පසු සම්පත් සංවර්ධන මණ්ඩලයට තව තවත් සක්‍රියව දායක වීමට හැකියාව ලැබේවායි මේ මොහොතේ මම ප්‍රාර්ථනා කරමි.

# ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

"කිරෙන් සපිරි රටක්" සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්තිය යථාර්ථයක් බවට පත් කිරීමට දැවැන්ත කාර්යභාරයක් ඉටු කළ හැකි ආයතනයක් වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අප අමාත්‍යාංශය යටතට ගැසට් කිරීම පිළිබඳව මම ප්‍රථමයෙන් අතිගරු ජනාධිපතිතුමාට මාගේ ස්තූතිය පුදකරමි. රටේ වැදගත් රාජ්‍ය ආයතන පාඩු ලබන තත්ත්වයට ඇද දමමින් ඒවා පුද්ගලීකරණය කිරීමට පිඹුරුපත් සැකසූ පසුගිය පාලන සමයේ අඳුරු සෙවණැලි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙතද වැටී තිබුණි. ඒ අනුව 2019 වසර වන විට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සමස්ත අලාභය රුපියල් මිලියන 369.7 කි.

කෙසේ වෙතත් මේ අඳුරු අගාධයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගොඩගැනීමට දැවැන්ත කැපකිරීමක් සිදු කරන වත්මන් සභාපති මහාචාර්ය මංජුල පී මාගමගේ මහතා, උප සභාපතිතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂක මණ්ඩලයටත් අප අපගේ කෘතවේදීත්වය පිරිනමන්නෙමු. 2021 වසරේ අගෝස්තු මාසය වන විට මණ්ඩලයේ සමස්ථ ලාභය රුපියල් මිලියන 169.2 බවට පත් කර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබී තිබේ.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට විශාල අඩුපාඩුවක්ව පැවති තෘණ සංරක්ෂණ කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අමාත්‍යාංශයක් ලෙස පළමු වරට රාජ්‍ය අයවැය හරහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 250ක මුදලක් ලබාදීමට අපට හැකිවීම පිළිබඳවද අප නිහතමානීව සතුටු වෙමු. ඒ යටතේ පොලොන්නරුව ගොවිපළෙහි අක්කර 500 ක භූමියක වාරි ජලය සහ වැසි ජලය යටතේ තෘණ සංවර්ධනය කොට යන්ත්‍රානුසාරයෙන් සයිලේජ් කිරීමට මණ්ඩලය කටයුතු යොදමින් සිටී. එමෙන්ම මණ්ඩලයේ පාඩු ලැබූ ගොවිපල සංඛ්‍යාව ක්‍රමිකව අඩු කර ගැනීමට වත්මන් පාලන අධිකාරියට හැකියාව ලැබී තිබේ. එනම් 2019 වන විට පාඩු ලැබූ ගොවිපල සංඛ්‍යාව 17ක් වන අතර මේ වන විට එම සංඛ්‍යාව 10 දක්වා අඩු වී ඇත. නව ආර්ථික ක්‍රමෝපායන් පිළිබඳව සැලකිල්ලක් දක්වන වත්මන් පාලනාධිකාරිය උඩරට කලාපයේ ගොවිපල වල අර්තාපල් වගා කිරීමේ ව්‍යාපෘතියක් ද ආරම්භ කළේය.

සෑම විටම ජාතික ප්‍රතිපත්තිය යථාර්ථයක් බවට පත් කිරීමට කැපවන පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2021 වසරේ ඔක්තෝම්බර් මාසය වන විට කොම්පෝස්ට් මෙට්‍රික් ටොන් 2700ක් පමණ නිෂ්පාදනය කිරීමට ද සමත් වී තිබේ. එමෙන්ම පසුගිය වසර දෙකක කාලය තුළ නව අලෙවිසැල් පහක් ද ජාතියට දායක කිරීමට නව පාලන අධිකාරියට හැකියාව ලැබී තිබීම විශේෂත්වයකි. රටේ කිරි අවශ්‍යතාවය සැපිරීම සඳහා ඉහල තත්වයේ කිරිදෙනුන් ජනිත කරවීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සිදුකර ගෙන යනු ලබයි. පාඩු ලබමින් තිබූ ආයතනයක් ලාභ ලබන මට්ටමට රැගෙන එහි ගොවිපල සංවර්ධනය කිරීමටත් අතිරේක ආදායම් මාර්ග උත්පාදනය කිරීමටත් මණ්ඩලය ගනු ලබන කැපකිරීම මෙහිලා අප අගය කළ යුතුමය. යටිතල පහසුකම් දියුණු කිරීම යටතේ 2020 වසරේදී රිදියගම ගොවිපල වෙත නව කේන්ද්‍රගත විසිරි ජල පද්ධති හතරක් හඳුන්වා දී තිබෙන අතර එහි තෘණ වගා කිරීමේ ධාරිතාව අක්කර 1080ක් දක්වා ඉහළ නංවා ඇත.

අනාගත ආයෝජන ලෙස ලෝක බැංකු විශේෂ ආධාර යටතේ ධාන්‍ය ගබඩාකරණ පහසුකම් ආරම්භ කිරීමට ද මණ්ඩලය පියවර ගෙන තිබේ. එනයින් රිදියගම, වීරවිල, ඔයාමඩුව සහ පොලොන්නරුව යන ගොවිපලවල් වල මෙට්‍රික් ටොන් පන්සීය බැගින් ධාන්‍ය ගබඩා කරන පහසුකම් වර්තමානයේ ඉදිවෙමින් පවතී. තවද ඌන උපයෝජිත සෑම බිම් අඟලක්ම වඩා ඵලදායි නිෂ්පාදන කාර්යය සඳහා යොදා ගැනීම මෙම කාලය තුළ අත්කරගත් ප්‍රතිලාභයක් ලෙස පෙන්වා දිය හැක..

"කිරෙන් සපිරි රටක්" නිර්මාණය කිරීමේ මා හැගි කර්තව්‍යයට ජාතික පශු සම්පත් සංවර්ධන පසු සම්පත් සංවර්ධන මණ්ඩලයට තව තවත් සක්‍රීයව දායක වීමට හැකියාව ලැබේවායි මේ මොහොතේ මම ප්‍රාර්ථනා කරමි.

රාජ්‍ය අමාත්‍ය ඩී. බී. හේරත්,
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය.



අපේම හැකියාවන්, සම්පත් හඳුනාගෙන ජාතික වැඩපිළිවෙළක් සඳහා කටයුතු කිරීම
සඳහා අප අතර ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමයි

# සභාපතිතුමාගේ පණිවිඩය

2019 දෙසැම්බර් - 2022 දෙසැම්බර් යන වසර සඳහා වත්මන් සභාපතිවරයා ලෙස 2017 වසර සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාවට පණිවිඩයක් ලබාදීමට හැකිවීම ගැන මම ඉමහත් සතුටට පත් වෙමි. මා නොදන්නා විවිධ හේතූන් මත මණ්ඩලය සිය වාර්ෂික මූල්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද කර ඇත, නමුත් 2019 දෙසැම්බර් මාසයේදී මා සභාපති ලෙස පත් කළ පසු මාගේ ප්‍රධාන ප්‍රමුඛතාවයක් වූයේ 2017 සිට 2019 දක්වා වසර සඳහා ප්‍රමාද වූ වාර්ෂික මූල්‍ය වාර්තා සම්පූර්ණ කිරීමයි. පැහැදිලි මූල්‍ය සංඛ්‍යලේඛන නොමැතිව රාජ්‍ය ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීම පහසු කාර්යක් නොවේ. 2017 වර්ෂය සඳහා විගණනය කරන ලද අවසන් ගිණුම් සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් මූල්‍ය අංශයට සහ ඉදිරිපත් කිරීමට නියමිත මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම පිළිබඳව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා හා මෙහෙයුම්) වෙත මම ස්තූතිවන්ත වෙමි. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට 2015-2019 කාලය තුළ මණ්ඩලයෙහි දුර්වල මූල්‍ය කාර්ය සාධනය තිබියදීත්, 2020 ආරම්භයේ සිට 2022 දක්වා, ශ්‍රී ලංකාවේ ලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන් අතරට මෙම ආයතනය පරිවර්ථනය කිරීමෙන් අප විශාල ප්‍රගතියක් ලබා ඇත. විගණනය නොකළ ගිණුම්වලට අනුව, 2020 සහ 2021 වර්ෂවලදී  මණ්ඩලය බදු ගෙවීමට පෙර මිලියන 5.9ක් සහ මිලියන 18ක ලාභයක් උපයා ඇති බව සඳහන් කිරීම වටී. 2015-2019 කාලය තුළ මාසික මෙහෙයුම් අලාභය රුපියල් මිලියන ගණනක් වූ ආයතනයක, මාසික වැටුප් ගෙවීම සඳහා බැංකු වලින් ණය  ගැනීමට සිදුවීම (දුර්වල මුදල් ප්‍රවාහය හේතුවෙන්) යථාර්ථවාදී සහ ප්‍රායෝගික අවශ්‍යතාවයක් විය. එමනිසා කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් තුළින් මෙම තත්ත්වය මඟහරවා ගැනීමට ප්‍රවේශ වීම ඉතා අත්‍යාවශ්‍ය   කටයුත්තක් විය.

අපේ රටේ ආර්ථිකයේ ශක්තිය පදනම් වී ඇත්තේ 7 වැනි විධායක ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" සහ කෘෂි කර්මාන්තයේ නියැලි සිටියද මෑත අතීතය වනතුරු නිසි දිරිගැන්වීමක් සිදු නොවූ එහෙත් ජාතික ආර්ථිකයට දායකත්වයක් දක්වන කෘෂි කාර්මික හා සත්වපාලන ක්ෂේත්‍රයේ නියැලි සිටින බහුතර ශ්‍රම බලකාය මත පදනම් වු කෘෂිකාර්මික ව්‍යුහය මතය. අපි 2021-2025 සඳහා ආයතනික සැලැස්ම සකස් කළ අතර, පශු සම්පත් අංශයේ විශේෂයෙන් කිරි නිෂ්පාදනය, පශු සම්පත් අභිජනනය සහ වැවිලි අංශය පිළිබඳ "සෞභාග්‍යයේ දැක්ම" හි දක්වා ඇති රජයේ ප්‍රතිපත්තිය තුලින් අප විසින් අදාල මාර්ගෝපදේශයන් ලබා ගැනීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකාව උසස් ප්‍රමිතියෙන් යුත් කිරි කර්මාන්තයට අවශ්‍ය සියලුම ස්වභාවික සම්පත්වලින් ආශිර්වාද ලබා ඇතත් අප විසින් වාර්ෂිකව නිෂ්පාදනය කරන්නේ ජාතික කිරි අවශ්‍යතාවයෙන් 35%ක් පමණි. පිටිකිරි ආනයනය සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 70ක් පමණ වැය වේ. ඉහළ නිෂ්පාදනයක් ලබා ගත හැකි කිරි ගවයින් ලෙස දේශිය සතුන් උසස් කිරීම සම්බන්ධයෙන් නිසි ලෙස අභිජනනය කිරීමේ ප්‍රතිපත්තිමය අස්ථාවරත්වය සහ අඩු මිලට ගොවිපල තුල පෝෂ්‍ය ආහාර   නිෂ්පාදනය කිරීම ජාතික කිරි නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා අවධානය යොමු කළ යුතු ප්‍රධාන ගැටලු වේ. එබැවින් මණ්ඩලයේ සතුන්ගේ ජානමය අගය වැඩි දියුණු කිරීමට සහ සත්ව පෝෂණය සම්බන්ධයෙන් විද්‍යාත්මක ප්‍රවේශයක්  සඳහා  ප්‍රමුඛත්වය ලබා  දී ඇත.

ලෝක ආහාර මිල ගණන් විශේෂයෙන් තිරිඟු, බඩ ඉරිඟු, සහල් සහ කිරි නිෂ්පාදනවල මෑතකාලීන වැඩිවීම් සංවර්ධනය වෙමින් පවතින රටවලට අහිතකර ලෙස බලපා ඇත. **COVID-19** වසංගතය ලෝක සමකාලීන ආර්ථික ගෘහ නිර්මාණ ශිල්පය වෙනස් කර ඇති අතර එහිදී නායකයින්ට තත්ත්වය තක්සේරු කිරීමට සහ **COVID-19** හි ප්‍රතිඵල ලෙස දුර්වල ආර්ථිකයන් යථාතත්ත්වයට පත් කිරීම සඳහා නවක්‍රම හඳුන්වා දීමට සිදුවී ඇත. මණ්ඩලය විසින් මෑතකදී ආරම්භ කරන ලද සූක්ෂම ආහාර සංරක්ෂණ ක්‍රමෝපායන්, පශු සම්පත් සහ වැවිලි ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා මෙම තත්වයෙන් වාසිදායක ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සයිලේජ් බේල් නිෂ්පාදන, නව කෙන්ද්‍රගත වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීම සහ උපාය මාර්ගික සැලසුම් සහිත රාජ්‍ය  පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යපාර ඇතුළු සූක්ෂම ආහාර සංරක්ෂණ උපාය මාර්ග භාවිතා කළ හැකිය. අපට අවශ්‍ය වන්නේ අපේම හැකියාවන්, සම්පත් හඳුනාගෙන ජාතික වැඩපිළිවෙළක් සඳහා කටයුතු කිරීම සඳහා අප අතර ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමයි.ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් හෙක්ටයාර 12,000 ක භූමි ප්‍රමාණයක වටු බිත්තරයේ සිට සූර්ය බලය නිෂ්පාදනය දක්වා විවිධ ක්‍රියාකාරකම් සිදු කර ඇත. අපගේ ආයතනික සැලැස්ම තුළ, අපගේ මූලික ක්‍රියාකාරකම් කඩිනම්  කිරීමේ අවශ්‍යතාවය අපි අවධාරණය කර ඇත්තෙමු. පශු සම්පත් හා කෘෂිකාර්මික අංශවල ජාතික හා ජාත්‍යාන්තර ප්‍රමිතීන් ළඟා කර ගැනීමට අපි සැලසුම් කරමු. මෙම ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීමෙන් අපගේ ඉහළ නිෂ්පාදන මට්ටම් කරා ළඟා විය හැකි බව මම විශ්වාස කරමි.මණ්ඩලයෙහි අමාත්‍ය වරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, සහකාර සාමාන්‍යාධිකාරී, ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්, සියලුම ගොවිපල කළමනාකරුවන් ඇතුළු වාර්ෂික වාර්තා කමිටුවේ කණ්ඩායම් සාමාජිකයින්ට, මෙම කර්තව්‍යයට විවිධ අකාරවලින් දායක වු අයට මම ස්තූතිවන්ත වෙමි.

ශ්‍රී ලංකාව කිරිවලින් ස්වයංපෝෂිත කිරීමට එක්ව කටයුතු කරමු.
උණුසුම් සුබ පැතුම් සමග,

මහාචාර්ය මංජුල පී. එස්. මාගමගේ,
සභාපති.





"හොඳම දේ අපෙන්" යන තේමාව පදනම් කරගෙන පාරිභෝගිකයින් වෙත ළඟාවීමට මනා විභවයන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව ඇත

# නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවිඩය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යනු රටේ ජාතික කිරි නිෂ්පාදනය ඉහල දැමීමට සාධනය වන ආයතනයකි. එය ප්‍රායෝගිකව දේශීය කිරි ගොවියන්ට අභිජනන එළදෙනුන්, පෝෂණ ගුණාත්මය වැඩි තෘණ දඬු සහ සත්ව පාලන දැනුම බෙදාහරින අර්ධරාජ්‍ය කේන්ද්‍රයකි.

දිනක් වයසැති බ්‍රොයිලර් පැටවුන්,බිත්තර සඳහා සුදුසු කිකිළි පැටවුන් ගොවීන් වෙත සාධාරණ මිලකට බෙදාහරින ක්‍රියාදාමයක් ද අප සතුව පවතී. එමගින් රටේ සත්ව ප්‍රෝටීන අවශ්‍යතාවයට යම් පිටුවහලක් වනු ඇත.

මණ්ඩලයට අයත් විශාල පරිමාණයේ කිරි නිෂ්පාදන ගොවිපලවල් කිහිපයක් උඩරට පළාතේ පිහිටා ඇත. කිරි නිෂ්පාදනයට අමතරව එමගින් උඩරට එළවළු වගාව සහ විශේෂයෙන් දේශීය බීජ අල නිෂ්පාදනයද කරනු ලබයි. එමගින් එම ප්‍රදේශවල අල වගාවන් කරනු ලබන ගොවීන්ට බීජ අල ලබාදීමට අමතරව පාරිභොගිකයින් සඳහා කෑම අල ලබා දීම ද කරගෙන යනු ලබයි. මීට අමතරව කිරි ආහාර වශයෙන් සෙට් යෝගට්, පානීය යෝගට්, කිරි ටොෆි, මී කිරි, එළුකිරි, නැවුම් එළකිරි (**Fresh Milk**) පාරිභෝගිකයන් අතර ඉතා ප්‍රචලිත ය. ඒ සඳහා දැඩි ඉල්ලුමක් ද පවතී. ගුණාත්මයෙන් පිරිපුන් මණ්ඩලයේ නැවුම් එළකිරි සඳහා විදේශිකයින් බොහෝමයක් පැමිණෙන සංචාරක හෝටල්වලින් පවා හොඳ ඉල්ලුමක් පවතී.

පොල් ත්‍රිකෝණයට අයත් ගොවිපලවල පොල් නිෂ්පාදනයට අමතරව එමගින් පිරිසිදු පොල් තෙල් නිෂ්පාදනය කරනු ලබයි.

මේ වනවිට අධ්‍යක්ෂක මණ්ඩලය මගින් යෝජණා කර ඇති සංවෘත බ්‍රොයිලර් කුකුල් නිවාස දෙක මගින් ඉදිරියේදී මණ්ඩලය තුළ බ්‍රොයිලර් කුකුල් මස් නිෂ්පාදනය තවදුරටත් වැඩිකළ හැකි බව විශ්වාස කරමි.

ඉහත කරුණු සළකා බැලීමේදී සත්ව පාලනය සහ කෘෂිකර්මය එකට බැඳුණු ආයතනයක් වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය රට තුළ ඉතා හොඳ නිෂ්පාදන බෙදාහරින න්‍යෂ්ඨියක් ලෙස සඳහන් කරමි. එම නිෂ්පාදන බෙදාහැරීම සඳහා මණ්ඩලය සතු ගොවිපලවල පිහිටුවා ඇති අලෙවිසැල් සහ අනෙකුත් කිරි අලෙවිසැල් ජාලය මනා පිටුවහලක් වනු ඇත. "හොඳම දේ අපෙන්" යන තේමාව පදනම් කරගෙන පාරිභෝගිකයින් වෙත ලඟාවීමට මනා විභවයන්, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව ඇත. ගරු සභාපතිතුමාගේ නියාමනය යටතේ සාර්ථක ගමනක් මේ දක්වා පැමිණ ඇත. ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය ලබා දුන් සහයෝගය ඉතා අගයකොට සළකමි. එසේම රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන්ද ඒ සඳහා සහය විය. මණ්ඩලය මීට වඩා ඉදිරියට රැගෙන යා හැකි බව මා තරයේ විශ්වාස කරමි.

ඒ.පී. සුමනසිරි,
නියෝජ්‍ය සභාපති.



# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ප්‍රතිපාදනවලට අනුකූලව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණයට අදාළව ඔවුන්ගේ වගකීම් පිළිගනී.

වාර්තාවට ඇතුළත් කර ඇති 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර අඛණ්ඩව යෙදී ඇති බවත් මුල්‍ය ප්‍රකාශන සැකසීමේදී අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රමිතින් අනුගමනය කර ඇති බවත් අධ්‍යක්ෂකවරු තහවුරු කරති. මෙම ප්‍රමිතින්ගෙන් සියලුම ද්‍රව්‍යමය අපගමනයන් තිබේ නම්, ඒවා අනාවරණය කර පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කරන ලද විනිශ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ සහ විචක්ෂණශීලී ය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මුල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ප්‍රමාණවත්ව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගිණුම් වාර්තා පවත්වාගෙන යන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කරයි. වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මුල්‍ය ප්‍රකාශන මගින් 2017 දෙසැම්බර් 31 වන දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් (විෂය මතය) ලබා දෙන බව සහතික කිරීම සඳහා ඔවුන්ගේ වගකීම ද ඔවුහු තහවුරු කරති.

කළමනාකරණය විසින් ස්ථාපිත කර ඇති ප්‍රචලිත අභ්‍යන්තර පාලන පද්ධති අභ්‍යන්තර විගණන, මූල්‍ය සහ වෙනත් පාලනයන්ගෙන් සමන්විත වන බව අධ්‍යක්ෂවරු තහවුරු කරති. එසේ සැලසුම් කර ඇති පරිදි සියලු වත්කම් ආරක්ෂා කර ඇති බවට සාධාරණ සහතිකයක් ඇති අතර ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන සහ අක්‍රමිකතා ඉදිරිපත් කිරීම හෝ සාධාරණ කාලයක් තුළ අනාවරණය කර ඇත.

ඉදිරි කාලය තුළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව සිය මෙහෙයුම් දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, මෙම මුල්‍ය ප්‍රකාශන සැකසීමේදී අඛන්ඩ පැවැත්මේ පදනම භාවිතා කර ඇති බවත් අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

අධ්‍යක්ෂවරුන් විසින් විගණකාධිපතිවරයාට තම වගකීම් ඉටු කිරීම සඳහා සුදුසු සහ අවශ්‍ය යැයි සලකන සමාලෝචන සහ පරීක්ෂණ සිදු කිරීමට සෑම අවස්ථාවක්ම ලබා දී ඇත.

අධ්‍යක්ෂවරුන් තම දැනුම අනුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම්, සියලු දායක මුදල් සහ බදු ශේෂ පත්‍ර දිනට ආයතනය විසින් ගෙවා ඇති බව තහවුරු කරයි.

මණ්ඩලය වෙනුවෙන්,

මහාචාර්ය මංජුල පී.එස්. මාගමගේ
සභාපති/අධ්‍යක්ෂක - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය.





# හැඳින්වීම සහ ඉතිහාසය



ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ 1973 දී පිහිටුවන ලදී. එහි ක්ෂේත්‍ර මෙහෙයුම් 1974 දී ආරම්භ කරන ලදී. 1977 දී මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය නැවත සංශෝධනය කරන ලද අතර එහිදී ප්‍රධාන වශයෙන් දේශීය ගව ගහණය අඩුවීම නැවැත්වීම සඳහා මෙන්ම කිරි නිෂ්පාදනය, බර ඇදීම යන කරුණු සඳහා සූක්ෂම ක්‍රමය යටතේ එළගවයින්ගේ ආරය ඉහළ නැංවීමට දැඩි අවධානයක් යොමු කරමින් නිෂ්පාදනය අඩු අභිජනනය කලහැකි ගැහැණු සතුන්ගෙන් පැටවුන් ලබාගැනීම සඳහා පමණක් නඩත්තු කිරීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය ලෙස සංශෝධනය කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ පුළුල් පරමාර්ථය වනුයේ ග්‍රාමීය ගොවීන්ගේ සමාජ-ආර්ථික මට්ටම ඉහළ නංවාලීමයි.අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම,මණ්ඩලයට අයත් පොල් වගාවන් නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම, පශු හා කෘෂිකාර්මික අගය එකතු කළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සහ ඒකාබද්ධ භෝග සහ සත්ව පාලන කළමණාකරණය පිළිබඳ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් වැනි වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇති ඉහත අරමුණු ලඟාකරගැනීම සඳහා මණ්ඩලයට අයත් ගොවිපල මඟින් එම දේශගුණික කලාපයන්ට ගැලපෙන පරිදි සත්ව අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර විවිධ කෘෂි දේශගුණික කලාප වල සිටින ගොවීන්ට අවශ්‍ය සේවා සැපයීම සිදු කරනු ලැබේ.

ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රජයට පැවරී ඇති ඉඩම් වල දේශීය ගව වර්ග ඉහළ කිරි නිෂ්පාදන විභවයක් ඇති ගව වර්ග ලෙස උසස් කිරීම පිණිස ගොවිපලවල් පිහිටුවීම සඳහා මණ්ඩලය වෙත භාරදෙන ලදී. මේ අනුව ඉහත ක්‍රියාකාරකම් යටතේ දැනට පොල් ත්‍රිකෝණයේ පොල් ඉඩම් හෙක්ටයාර 4686ක් ලැබී ඇත. වර්තමානයේදී මණ්ඩලයට අයත් පොල් වගා කර ඇති ගොවිපල වල දේශීය ගවයන් ඉහළ විභවයක් සහිත සහිවාල් සහ යුරෝපීය ගව වර්ග සමඟ අභිජනනය කිරීම සිදු කෙරේ.

තවද,1992 වර්ෂය තුළ,සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (**DAPH**) විසින් කළමනාකරණය කරන ලද ගොවිපළවල් දහතුනක් මණ්ඩලය වෙත භාර දෙන ලදී. මෙම ගොවිපළවල් මූල්‍ය හිඟයෙන් පෙළුණු අතර දිරාපත් වූ තත්ත්වයක පැවතුණි.මෙම ගොවිපළ යළි නගා සිටුවීම සඳහා මණ්ඩලයට විශාල මුදලක් ආයෝජනය කිරීමට සිදු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය ද්‍රවශීලතා ගැටළුවලට ද මුහුණ දුන්නේය. මෙම මූල්‍ය වගකීම් ඉටු කිරීමට, මණ්ඩලයට බැංකුවලින් ණය ගැනීමට සිදු විය. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ ගොවිපළ  පවරා ගැනීමෙන් පසුව මණ්ඩලය සතුව දැනට ඉඩම් හෙක්ටයාර 12,527ක් පවතී.

මණ්ඩලය දැනට සත්ව ගොවිපළ 30 ක් සහ පුහුණු මධ්‍යස්ථාන 02 ක් පවත්වා ගෙන යනු ලැබේ. වර්තමානයේදී පශු සම්පත් කෙෂ්ත්‍රයේ නුමුහුන් සත්ව වර්ග ඇති කරනු ලබන එකම රාජ්‍ය ආයතනය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වන බැවින් මෙය ජාතික සම්පතක් ලෙස සැලකිය හැකිය.

# ප්‍රතිපත්තිය

අපගේ ගොවීන්ට දේශීය හා ජාත්‍යන්තර වෙළඳපළ සමඟ තරඟ කිරීමේ හැකියාව ලබාදීමේ අරමුණ පෙරදැරි කොට දේශීය ඉල්ලුම තෘප්තිමත් කිරීමට සහ ග්‍රාමීය ආදායම ඉහළ නැංවීම  පිණිස සත්ව නිෂ්පාදන වල නිෂ්පාදනය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම. (මූලාශ්‍රය: රාජ්‍ය ආයෝජන සැලැස්ම 2017-2020, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව)

# දැක්ම

පශු සම්පත් තුළින් ඉසුරුමත් දිවිපෙවෙතක් උදෙසා ගුණාත්මක සත්ව හා කෘෂි නිෂ්පාදන දැයට දායාද කරන දේශයේ පශු සම්පත් නිපැයුම්කරු වීම.

# මෙහෙවර

පශු සම්පත් හා කිරි ආශ්‍රිත නිෂ්පාදනයෙන් දේශීය ස්වයංපෝෂිත කරලීමේ ජාතික මෙහෙවරට උරදෙනු වස් නවීන තාක්ෂණය හා නවෝත්පාදන ක්‍රම තුළින් ගුණාත්මක සත්ව කෘෂිකාර්මික හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගෙන යාමට ජාතික පශු සම්පත් මණ්ඩලය කැපවී සිටී.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ
# ප්‍රධාන අරමුණු

01. නවීන අභිජනන ශිල්පීය ක්‍රම සහ පශු සම්පත් කලමනාකරණ ශිල්පීය ක්‍රම වල නවීනතම දැනුම භාවිතා කරමින් වඩා හොඳ පශු සම්පත් කළමණාකරණ පිළිවෙත් අනුගමනය කරමින් ප්‍රශස්ථ සත්ව ගහණයක් පවත්වා ගෙන යාම සඳහා සත්ව ගහනයේ ගුණාත්මක බව වැඩිදියුණු කරීම.

02. නව තාක්‍ෂණය විශේෂඥතාව මනා ලෙස ප්‍රාග්ධනය කළමණාකරණය කිරීම වියදම් පාලනය මණ්ඩලයට අයත් ගොවිපල වල ඵලදායීතාව ඉහළ නැංවීම හා වෙළඳපළ උපාය මාර්ග අනුගමනය කිරීම තුළින් දේශිය වෙළඳපල අනුපාතය ඉහළ නැංවීම මඟින් මණ්ඩලයේ ලාභදායීතාව ඉහළ නැංවීම.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ
# අරමුණු

01. දේශීය සත්ව පාලනයේ නියුතු ගොවීන් වෙත අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම වැඩි කිරීම.

02. පශු සම්පත් හා කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි කිරීම.


03. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් අලෙවිසැල් වරලත් අලෙවිසැල් සහ සුපිරි වෙළඳසැල් ජාලය හරහා මණ්ඩලයේ සත්ව හා කෘෂි නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදන වල අලෙවිය වැඩි කිරීම.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතු ගොවිපල සහ පුහුණු මධ්‍යස්ථාන

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගොවිපළ 30ක් සහ පුහුණු මධ්‍යස්ථාන 02ක් පවත්වාගෙන යයි. මැණික්පාලම, බෝපත්තලාව, ඩයගම සහ රොසිටා ගොවිපල උඩරට කලාපයේ ක්‍රියාත්මක වන අතර මහබේරියතැන්න, කරඳගොල්ල සහ හාරගම මැදරට කලාපයට අයත් ගොවිපල වේ. තවද, මරඳවිල, මැල්සිරිපුර, බෙලිගම, පොළොන්තලාව, ආඬිගම, ගල්පොකුණ, කොවුල්වැව, නාරංගල්ල, හොරකැලේ, මාටින්, රුක්අත්තන, සිරිංගපාත, මාරවිල, වැලිසර සහ මිරිස්වත්ත යන ගොවිපළවල් පොල් ත්‍රිකෝණයේ පිහිටා ඇත. ඊට අමතරව වියලි කලාපයේ ගොවිපල 08 ක් ඇත. ඒවා පොළොන්නරුව, ඔයාමඩුව,පරසන්ගස්වැව, වැලිකන්ද, කොට්ටුකච්චිය, වීරවිල, රිදියගම සහ නිකවැරටිය ගොවිපල වේ.

මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය සහ පොල් ත්‍රිකෝණයේ පිහිටි පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් දැනට ක්‍රියාත්මක වන පුහුණු මධ්‍යස්ථාන වේ.

# Distribution of Livestock Species and Related Projects in NLDB Farms



# අධ්‍යක්ෂ මණ්ඩලයේ කෙටි පැතිකඩ



## මහාචාර්ය මංජුල පී.එස්.මාගමගේ,

## සභාපති

මහාචාර්ය මංජුල පී.එස්.මාගමගේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයෙකු ලෙස 2019 දෙසැම්බර් 20 වැනි දින පත් කරන ලදී.

ඔහු 2000 දී ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨයෙන් පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ **(BVSc)** උපාධිය ලබාගත් අතර,2011 දී ජපානයේ කෝබේ විශ්ව විද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ ජෛව සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුවෙන් ප්‍රජනක කායික විද්‍යාව, අන්තරාසර්ග විද්‍යාව සහ ප්‍රජනක ජෛව තාක්ෂණවේදය පිළිබඳ ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධිය ලබා ගත්තේය. ඔහුගේ ආචාර්ය උපාධි අධ්‍යයනයෙන් පසුව 2013-2014 දී මහාචාර්ය ඇන්ඩ්‍රියා එස්.කුප්ගේ උපදේශනය යටතේ ඇමරිකා එක්සත් ජනපදයේ නෙබ්‍රස්කා ලින්කන් විශ්ව විද්‍යාලයේ ප්‍රජනක කායික විද්‍යාව සෛල අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය පිළිබඳ පශ්චාත් ආචාර්ය උපාධිය ලබා ගත්තේය. පසුව ඔහු හයිද්‍රාබාද්හි ජාතික සත්ව ජෛව තාක්ෂණ ආයතනයේ සිටින අතරතුර ඉන්දීය රජයෙන් 2016 දී ඉන්දියානු විද්‍යා පර්යේෂණ ශිෂ්‍යත්වය ඔහු වෙත පිරිනමන ලදි.

2017 මුල් භාගයේදී ඔහු ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්ව විද්‍යාලයේ කොන්කෝඩ් මහ රෝහලේ **ANZAC** පර්යේෂණ ආයතනයේ සිටින අතර ඕස්ට්‍රේලියානු රජය ඔහුට වඩාත්ම කීර්ති මත් ව්‍යාපාර සාමාජිකත්වය ප්‍රදානය කර ඇති ඔහු 2000 වසරේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයේ සායනික අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කෙටි කාලයක් ගත කිරීමෙන් පසු 2001 වසරේ රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨයේ පශු සම්පත්නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පශු සම්පත් නිෂ්පාදන පිළිබඳ සහකාර කථිකාචාර්ය ලෙස සම්බන්ධ වු අතර පසුව 2003දී සබරගමුව විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය (පරිවාස) තනතුරට උසස් කරන ලද අතර ඉන් පසුව ඔහු 2011 දී ජ්‍යෙෂ්ඨ කථිකා-චාර්යවරයා ලෙස පශු සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුවට ආපසු එනතෙක් 2005-2011 දක්වා ජපානයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලැබීය.

වර්තමානයේ ඔහු කෘෂිකර්ම විද්‍යා පීඨ වල මෙන්ම උපාධි අධ්‍යයන පීඨයේ උපාධි අපේක්ෂකයින්ට සහ උපාධි සිසුන්ට උගන්වමින් සිටී.ඔහු සබරගමුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආරම්භක සම්බන්ධීකාරකවරයා විය. ඔහු 2019 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි පශු සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ මහාචාර්යවරයා ලෙස උසස් කරන ලදි.මෙම අන්තර් දෙපාර්තමේන්තු වගකීම් හැරුණු විට ඔහුගේ ඉගැන්වීම් සහ පර්යේෂණයන්හි මානව-සත්ව අන්තර් සම්බන්ධතා අධ්‍යනයන් පුළුල් ලෙස ප්‍රත්‍යක්ෂ වේ.ජෛව තාක්ෂණය හා ජෛව රසායන විද්‍යාව, ප්‍රජනක ජීව විද්‍යාව, සත්ව සෞඛ්‍යය සහ සනීපාරක්ෂාව, ගොවිපල සතුන්ගේ ව්‍යුහ විද්‍යාව සහ කායික විද්‍යාව යන ප්‍රධාන ක්ෂේත්‍ර වලින් ඔහුගේ වර්තමාන ඉගැන්වීම සමන්විත වේ.

ඔහු 2016 ගිම්හාන වැඩසටහනෙහි සත්ව අභිජනන වැඩසටහන යටතේ උසස් ජෛව රසායන විද්‍යාව, ප්‍රජනන ජෛව තාක්ෂණය සහ අණුක ජීව විද්‍යාව සම්බන්ධයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ බොස්ටන්හි සමුද්‍ර ජීව විද්‍යාගාර **(MBL)** හි පුහුණුව ලබා ඇති මහාචාර්ය මාගමගේ මහතා **MBL** හි **FIR** යන තනතුරද දරමින් සිටී. **MBL** යනු නොබෙල් ත්‍යාගලාභීන් 60 කට අධික සංඛ්‍යාවක් ආරම්භයේ සිට එකම වහලක් යට සේවය කරන ලොව වඩාත්ම ප්‍රසිද්ධ සහ කීර්තිමත් පර්යේෂණාගාරයයි.ඔහු දේශීය මෙන්ම ජාත්‍යන්තරව ඉහළ බලපෑමක් සහිත පර්යේෂණ සඟරා වල ලිපි 35 කට වඩා ප්‍රකාශයට පත් කර ඇති අතර දේශීය හා ජාත්‍යන්තරව වියුක්ත ප්‍රකාශන 100කට අධික ප්‍රමාණයක් ප්‍රකාශයට පත්කර ඇත.

ඔහු ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ 7 වැනි පීඨාධිපතිවරයා ලෙස 2018-2021 පත් කිරීමට පෙර පශු සම්පත් නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වු අතර දැනට ඉදිවෙමින් පවතින කෘෂිකර්ම පීඨ සංකීර්ණය සඳහා නව වැඩ කටයුතු ආරම්භ කිරීමට සහ මුල්ගල් තැබීමට මූලික විය. මහාචාර්ය මාගමගේ මහතා 2021-2024 වසර සඳහා කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යාව සඳහා කොළඹ විශ්ව විද්‍යාල ආයතනයේ කළමණාකරණ මණ්ඩලයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කල සාමාජිකයෙකු ලෙසද සේවය කරමින් සිටි.කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ සහ සත්ව ආහාර උපදේශක කමිටුවේ ජාතික සත්ව අභිජනන කමිටු සාමාජික වැනි ජාතික කමිටු කිහිපයකටද ඔහුගේ ජාතික සේවය ලබා දෙනු ලබයි.



## ඒ.පී. සුමනසිරි මහතා.

**නියෝජ්‍ය සභාපති,අධ්‍යක්ෂ.**

ඒ.පී.සුමනසිරි මහතා 2020 ජනවාරි මස සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයෙකු ලෙස පත් කරන ලදි.

ඔහු 1994 දී ශ්‍රී ලංකා රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයෙන් කෘෂිකර්මය පිළිබඳ උපාධිය ලබා ගත්තේය.

ඔහු ක්‍රිස්ටල් ස්ප්‍රින්ග් (පුද්ගලික) සමාගමේ කුකුළු ගොවිපළ කළමණාකරණය පිළිබඳ වසර 2ක පළපුරුද්දක්ද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අඹේවෙල ගොවිපලේ කිරි ගොවිපල කළමණාකරණය පිළිබඳ වසර 4 ක පළපුරුද්දක්ද ලබා ඇත. තවද ඔහුට අඹේවෙල පශු සම්පත් සමාගමේ කිරි ගොවිපල කළමණාකරණය, පට්ටිපොල පශු සම්පත් සමාගමේ අර්තාපල් වගා කළමණාකරණය සහ අඹේවෙල ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගමෙහි බඩ ඉරිඟු වගා කළමණාකරණය පිළිබඳව වසර 13ක පළපුරුද්දක්ද ඇත. ඉහත කරුණු හැරුනු විට ඔහු නවසීලන්තයේ කිරි ගොවිතැන් කළමනාකරණය පිලිබඳ වසර 5 ක පළපුරුද්දක් ඇති අතර නුවරඑළිය ග්‍රෑන්ඩ් හෝටලයේ උපදේශකයෙකු ලෙස සේවය කර ඇත.



## රාජ්පාල් කේ.ඔබේසේකර මහතා.

**අධ්‍යක්ෂ.**

ඔහු 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

ඔහු හැටන් නැෂනල් බැංකුවේ (පුද්ගලික) හිටපු අධ්‍යක්ෂශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියෝජ්‍ය සභාපති, ශ්‍රී ලංකා ඩිස්ට්ලරීස් සමාගම පී.එල්.සී හි අධ්‍යක්ෂ, මඩොල්සිම වැවිලි පී.එල්.සී හි අධ්‍යක්ෂ, බලංගොඩ වැවිලි පී.එල්.සී හි අධ්‍යක්ෂ, ලංකා මිල්ක් ෆුඩ්ස් **(CWE)** පීඑල්සී හි අධ්‍යක්ෂ, සීමාසහිත අඹේවෙල පශු සම්පත් සමාගමේ අධ්‍යක්ෂ, අඹේවෙල ප්‍රොඩක්ට්ස් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ,සීමාසහිත පට්ටිපොල පශු සම්පත් සමාගමේ අධ්‍යක්ෂ, ලංකා ඩේරීස් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ, ඩැනිෂ් ඩේරි ප්‍රොඩක්ට්ස් ලංකා හි අධ්‍යක්ෂ, ස්ටැෂන් වැවිලි කළමණාකරණ සේවා (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති,ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ, ලංකා හෝටල් සහ රෙසිඩන්ස් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ ද වේ.



## එච්.ඒ.ආර්.කේ. වික්‍රමතිලක මහතා.

**අධ්‍යක්ෂ.**

ඔහු 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

වර්තමානයේ ඔහු මර්කන්ටයිල් නැව් සමාගම පී.එල්.සී,රෝයලි පවර් (පුද්ගලික) සමාගම, රෝයලි හෝම්ස් ඇන්ඩ් ලෑන්ඩ් (පුද්ගලික) සමාගම, සිලෝන් ඉකෝ ස්පයිසස් (පුද්ගලික) සමාගම සහ සිලෝන් ඉකෝ ෆීල්ඩ්ස් (පුද්ගලික) සමාගම හි සභාපතිවරයා ලෙස කටයුතු කරයි. ඔහු කොළඹ ඩොක්යාර්ඩ් පී.එල්.සී හි අධ්‍යක්ෂ සහ විගණන කමිටු සභාපති වන අතර තවත් සමාගම් කිහිපයක අධ්‍යක්ෂකවරයෙකු වන අතර විවිධ ආයතන වල ඉහළ කළමණාකරණ තනතුරු වල වසර 35 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධිය ලබාගත් අතර නෝර්වේ ඔස්ලෝ හි නෝර්වීජියානු නාවික ඇකඩමියේ වෘත්තීය නැව්ගත කිරීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගත්තේය. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකි.



## ආසිරි එම්. ඉද්දමල්ගොඩ මහතා.

**අධ්‍යක්ෂ**

ආසිරි එම්. ඉද්දමල්ගොඩ මහතා 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. මේ වනවිට ඔහු **DFCC** බැංකුවේ ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙකු සහ පාරිභෝගික බැංකු සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ප්‍රධානියෙකු ලෙස කටයුතු කරයි. ඔහු 2007 සිට 2014 දක්වා කාලසීමාව සඳහා ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ ධූරය දැරීය. ඔහු ඇමරිකාවේ ඇලබාමා හි ජැක්සන්විල් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් **MBA** උපාධියක් ලබා ඇත.



## බී.ඒ.පී.කේ.කේ. ගුණවර්ධන මහතා.

**අධ්‍යක්ෂ**

බී.ඒ.පී.කේ.කේ. ගුණවර්ධන මහතා 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

දැනට ඔහු Accmart Motors & (Pvt) Ltd හි කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන අතර අලෙවිකරණය, විකුණුම්, සැපයුම් කළමනාකරණය, බෙදාහැරීම සහ ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධයෙන් වසර 30 කට වැඩි කළමනාකරණ පළපුරුද්දක් ඇත.

ඔහු අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් (SLIM) ඇති අතර ඔහු ජපානයේ ව්‍යාපාරයක් කළමනාකරණය කරමින් සිය වෘත්තීය ජීවිතයෙන් වසර 15කට ආසන්න කාලයක් ගත කළේය.



## වයි. පී. සුමනාවතී මහත්මිය.

**අධ්‍යක්ෂ**

වයි. පී. සුමනාවතී මහත්මිය 2020 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇති අතර ඇය භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස කටයුතු කරයි.

# ප්‍රධාන කළමනාකරණ නිළධාරීන්



**ඒ.එම්.පී.ඒ. අධිකාරි මහතා.**
සාමාන්‍යාධිකාරී



**එම්.ඩී.කරුණාතිලක මහතා.**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සංස්ථා සහ මෙහෙයුම්)



**එම් ඩී ඩබ්ලිව් ධර්මරත්න මහතා.**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(පශු සම්පත් සහ වැවිලි සංවර්ධනය)



**පශු වෛද්‍ය. කේ.ජී.ජේ.එස් දිස්නක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(පශු)



**එච්.ඩබ්ලිව්.එස්. ප්‍රේමරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(කලාපීය)



**එම්.ජේ විජේරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(කලාපීය)



**ආර්.ඩබ්ලිව්.එම්.කේ.ඩී.එන්. අමුණුගම මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(කලාපීය)



**පී.ඒ.ජේ.එස්. පතිරණ මහතා.**
සහකාර සාමාන්‍යාධිකාරී
(කලාපීය)



**එන්.ජී. නිමලසිරි මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී(වැඩ බලන)
(කලාපීය)



එස්.ඒ.එස්. තෙවරප්පෙරුම මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරිණී
(මානව සම්පත් හා පාලන)



ටී.කේ.විදානපතිරණ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී
(වැඩ ආවරණය කිරීම්)



රුවන් තිලකසිරි මහතා
කළමනාකරු
(මූලය)



එච්.පී.එස්. ගුණරත්නමැණිකේ මහත්මිය
කළමනාකාරිණී
(අලෙවි)



එම්.කේ.කේ රෝශිනි මහත්මිය
සහකාර කළමනාකාරිණී
(අධීක්ෂණ හා මෙහෙයුම්)



එන්.ඩබ්.ඒ.එන්.යූ. වීරසිංහ මහත්මිය
සහකාර කළමනාකාරිණී
(මූලය)



එස්.ඩී.එම්.එන්. පුෂ්පකුමාර මහතා
සහකාර කළමනාකරු
(විගණන)



එන්.ජේ.එස්. කුමුදුනී මහත්මිය
සහකාර කළමනාකාරිණී
(මානව සම්පත්)



පී.කේ.ටී.ද සිල්වා මෙනවිය
සහකාර කළමනාකාරිණී
(ගොවිපල නිශ්පාදන අලෙවි නිළධාරි)



කේ.ආර්.කේ. අමරසේන මහතා
සහකාර කළමනාකරු
(මූලය)





# 2017

# මූල්‍ය සමාලෝචනය


# මූල්‍ය කාර්යය සාධනය

| අයිතමය | 2017 රු.(මිලි) | 2016 රු.(මිලි) | විචලනය | විචල්‍ය ප්‍රතිශතය | ප්‍රධාන සාධක |
|---|---|---|---|---|---|
| මුළු ආදායම | 2,958 | 2,534 | 424 | 17% | ජීව විද්‍යාත්මක වත්කම් වල අගය සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ යාම |
| විකුණුම් පිරිවැය | 2,201 | 2,038 | 163 | 8% | එළගව සහ මීගව ව්‍යාපෘති වල නඩත්තු වියදම් ඉහළ යාම |
| දළ ලාභය | 757 | 497 | 260 | 52% | කිරි ව්‍යාපෘතියේ ජීව විද්‍යාත්මක වත්කම් වල අගය වැඩිවීම |
| බෙදා හැරීමේ වියදම් | 6 | 5 | 1 | 20% | පොල් ආදායම් වැඩිවීම මත ගෙවනු ලබන බ්‍රෝකර් ගාස්තු ඉහළයාම සහ අඩමාන ණය වෙන් කිරීමේ බලපෑම |
| පරිපාලන වියදම් | 898 | 850 | 48 | 6% | සේවක වැටුප් වැඩිවීම සහ අනෙකුත් පරිපාලන වියදම් වැඩිවීම |
| මූල්‍ය පිරිවැය | 178 | 122 | 56 | 46% | බැංකු ණය පොලී සහ වෙලාඩ් ව්‍යාපෘතියේ පොලී වියදම වැඩිවීම |

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ආදායම් සංයුතිය

| අයිතමය | 2017 රු. (මිලි.) | 2017ප්‍රතිශතය |
|---|---|---|
| පොල් සහ කොප්පරා | 706 | 22% |
| එළ හරක් සහ මී හරක් | 1,521 | 48% |
| බිත්තර දමන වාණිජ කිකිළියන් | 51 | 2% |
| වාණිජ බ්‍රොයිලර් කුකුළු | 4 | 0.1% |
| බිත්තර දමන අභිජනන කිකිළියන් | 36 | 1% |
| බ්‍රොයිලර් කුකුළු අභිජනන | 190 | 6% |
| සූකර ව්‍යාපෘතිය | 37 | 1% |
| බැටළුව්‍යාපෘතිය | 19 | 0.6% |
| එළු ව්‍යාපෘතිය | 9 | 0.3% |
| සම්ප්‍රදායික නොවන පශු සම්පත් | 11 | 0.3% |
| වෙනත් විවිධ ව්‍යාපෘති | 263 | 8% |
| කිරි ව්‍යාපෘති | 189 | 6% |
| පශු සම්පත් තක්සේරුව | 160 | 5% |
| උප එකතුව | **3,196** | **100%** |
| (අඩු) -අන්තර් ගොවිපල විකිණීම | 238 | |
| මුළුඑකතුව | **2,958** | |


**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ආදායම් මාර්ග වනුයේ කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වේ. මුලු ආදායමෙන් 48% ලැබුණුයේ කිරි ආශ්‍රිත නිෂ්පාදන වලින් වන අතර පොල් ආශ්‍රිත නිෂ්පාදන වලින් 22% ද, කුකුල් පාලන නිෂ්පාදන වලින් 9% වේ.**



# විකුණුම් පිරිවැය

| අයිතමය | 2017 රු. (මිලි.) | 2017 ප්‍රතිශතය |
|---|---|---|
| පොල් සහ කොප්පරා | 234 | 10% |
| එල හරක් සහ මී හරක් | 1,507 | 62% |
| බිත්තර දමන වාණිජ කිකිළියන් | 54 | 2% |
| වාණිජ බ්‍රොයිලර් කුකුළු | 4 | 0.2% |
| බිත්තර දමන අභිජනන කිකිළියන් | 45 | 2% |
| බ්‍රොයිලර් කුකුළු අභිජනන | 113 | 5% |
| සූකර ව්‍යාපෘතිය | 70 | 3% |
| බැටළුව්‍යාපෘතිය | 28 | 1.1% |
| එළු ව්‍යාපෘතිය | 11 | 0.5% |
| සම්ප්‍රදායික නොවන පශු සම්පත් | 11 | 0.5% |
| වෙනත් විවිධ ව්‍යාපෘති | 223 | 9% |
| කිරි ව්‍යාපෘති | 139 | 6% |
| **උප එකතුව** | **2,439** | **100%** |
| (අඩු) -අන්තර් ගොවිපල විකිණීම | 238 | |
| **මුළුඑකතුව** | **2,201** | |


විකුණුම් පිරිවැය 2017



# ලාභදායීත්වය

| අයිතමය | 2017<br>රු. (මි.) | 2016<br>රු. (මි.) | විචලනය |
|---|---|---|---|
| පොල් සහ කොප්පරා | 472 | 454 | 18 |
| එළ හරක් සහ මී හරක් | 14 | 119 | (105) |
| බිත්තර දමන වාණිජ කිකිළියන් | (3) | 3 | (6) |
| වාණිජ බ්‍රොයිලර් කුකුළු | - | (2) | 2 |
| බිත්තර දමන අභිජනන කිකිළියන් | (9) | 16 | (25) |
| බ්‍රොයිලර් කුකුළු අභිජනන | 77 | 138 | (61) |
| සූකර ව්‍යාපෘතිය | (33) | 2 | (35) |
| බැටළුව්‍යාපෘතිය | (9) | (3) | (6) |
| එළු ව්‍යාපෘතිය | (2) | (3) | 1 |
| සම්ප්‍රදායික නොවන පශු සම්පත් | - | (1) | 1 |
| වෙනත් විවිධ ව්‍යාපෘති | 40 | 28 | 12 |
| කිරි ව්‍යාපෘති | 50 | 53 | (3) |
| පශු සම්පත් තක්සේරුව | 160 | (307) | 467 |
| **මුළුඑකතුව** | **757** | **497** | **260** |

**2017 වර්ෂයේ මිලියන 757 ක දළ ලාභයකුත් 2016 වර්ෂයේ මිලියන 497 ක දළ ලාභයකුත් ජනනය වී ඇති අතර එහි වැඩිම ලාභාන්තිකයක් ජනනය කර ඇත්තේ පොල් ආශ්‍රිත නිෂ්පාදන තුලිනි.**



2017 වර්ෂයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල 31න් 13ක් ලාභ ලබා ඇති අතර එම ලාභය රු.මිලියන 361.4 වේ. ගොවිපලවල් 18ක් අලාභ ලබා ඇති අතර එහි අලාභය රු.මිලියන 320.5ක් වේ. ඒ අනුව ගොවිපල මට්ටමින් රු.මිලියන 40.9ක ලාභයක් වාර්තා කිරීමට හැකියාව ලැබී ඇත. මෙසේ ගොවිපලවල් ලබා දී ඇති මුල්‍ය කාර්යය සාධන දායකත්වය පහත පරිදි වේ.

**ලාභ ලැබු ගොවිපල්**

| අංකය | ගොවිපල | ලාභය රු 2017 |
|---|---|---|
| 1 | ආඬිගම | 23,769,161 |
| 2 | බෙලිගම | 31,329,839 |
| 3 | ගල්පොකුණ | 12,712,767 |
| 4 | හොරකැලේ | 85,876,424 |
| 5 | කරඳගොල්ල | 24,059,849 |
| 6 | කොවුල්වැව | 23,343,226 |
| 7 | මරඳවිල | 64,754,504 |
| 8 | මැල්සිරිපුර | 36,233,062 |
| 9 | මිරිස්වත්ත | 21,465,780 |
| 10 | නාරංගල්ල | 7,693,164 |
| 11 | පොලොන්තලාව | 5,378,548 |
| 12 | රුක්අත්තන | 8,852,008 |
| 13 | සිරිංගපාත | 15,966,832 |
| | **එකතුව** | **361,435,165** |

**අලාභ ලැබු ගොවිපල්**

| අංකය | ගොවිපල | අලාභය රු 2017 |
|---|---|---|
| 1 | බෝපත්තලාව | (48,737,950) |
| 2 | මැණික්පාලම | (132,106,326) |
| 3 | ඩයගම | (31,145,129) |
| 4 | හාරගම | (5,356,150) |
| 5 | කොට්ටුකච්චිය | (2,064,113) |
| 6 | M.L.D.C. | (4,679,370) |
| 7 | මහබේරියතැන්න | (1,478,017) |
| 8 | මාරවිල | (16,752,094) |
| 9 | මාටින් | (12,286,624) |
| 10 | නිකවැරටිය | (11,636,625) |
| 11 | ඔයාමඩුව | (9,600,490) |
| 12 | පරසන්ගස්වැව | (899,333) |
| 13 | පොලොන්නරුව | (12,267,593) |
| 14 | රිදියගම | (8,050,682) |
| 15 | රොසිටා | (12,982,466) |
| 16 | වීරවිල | (5,401,583) |
| 17 | වැලිකන්ද | (3,990,781) |
| 18 | වැලිසර | (1,079,674) |
| | **එකතුව** | **(320,515,002)** |

පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ගොවිපලවල් පොල් ආශ්‍රිත නිෂ්පාදන තුළින් ලාභ ලබා ඇති අතර එක්දින වයසැති බ්‍රොයිලර් කුකුල් පැටවි අභිජනනය කරන ගොවිපලවල් දෙකද ලාභදායීව පවත්වා ගෙන යාමට හැකියාව ලැබී ඇති වියළි කලාපීය කිරිගව ආශ්‍රිත ගොවිපලවල්ද සූකර ව්‍යාපෘතිය ආශ්‍රිත ගොවිපලවල්ද 2017 වර්ෂය තුළ අලාභ ලබා ඇත.

# කෙටි කාලීන මූල්‍ය ස්ථාවරත්වය

| අයිතමය | 2017 රු.(මිලි) | 2016 රු.(මිලි) | විචලනය |
|---|---|---|---|
| මුළු ජංගම වත්කම් | 679 | 769 | 90 |
| මුළු ජංගම වගකීම් | 3,069 | 2,124 | 945 |
| ශුද්ධ කාරක ප්‍රාග්ධනය | (2,390) | (1,355) | (1,035) |
| ජංගම අනුපාතය | 0.22 | 0.36 | (0.14) |

ජංගම අනුපාතය අහිතකර ලෙස වැඩිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ වේලාඩි ව්‍යාපෘතිය සඳහා ලබා දුන් හිග ණය වාරික ප්‍රමාණය මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන අඛණ්ඩව ඉහළ යැමයි. 2020 වර්ෂයේ ආමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව මෙම ව්‍යාපෘතියට අදාල ණය පොළිය ලියා හැරීමත් ණය රාජ්‍ය ආයෝජනයක් බවට පරිවර්තනය කිරීමත් සමගම කෙටිකාලීන මූල්‍ය ස්ථාවරත්වය ඉදිරි වර්ෂ වල යහපත් තත්වයට හැරෙනු ඇත.

# මුදල් ප්‍රවාහය

2016 වර්ෂයේ මෙහෙයුම් තුළින් ජනනය කර ඇති මුදල් ප්‍රවාහය රු.මිලියන 213 වන අතර 2017 වර්ශයේ මෙහෙයුම් තුළින් ජනනය කර ඇති මුදල් ප්‍රවාහය රු.මිලියන 864 වේ. මෙය 305% වර්ධනයක් වේ.

2017 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ගලායෑම් රු.මිලියන 118 වන අතර එය 2016 වර්ෂයේ රු.මිලියන 167 වේ.

# විගණන සහ කළමණාකරන කමිටු වාර්තාව

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි සංවර්ධන කටයුතු කිරීමේදී අවශ්‍ය තීරණ ගැනීම සඳහා විගණන හා කළමණාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය වේ. තවද මණ්ඩලය මුහුණ දෙනු ලබන අවදානම් හා කළමණාකරණ / පරිපාලන සාධක තක්සේරු කිරීමේදි කමිටුව මණ්ඩලයට සහය දෙනු ලැබේ. 2017 වර්ෂය තුල විගණන කමිටු රුැස්වීම් තුනක් (82 සිට 84 දක්වා) පවත්වා ඇත. බාහිර, අභ්‍යන්තර විගණන වාර්තා සහ විමර්ෂන වාර්තා මගින් ඉස්මතු කර ඇති සොයාගැනිම් සහ කරුණු පිළිබදව කමිටුව අවධානය යොමු කර ඇත. 2017 වර්ෂය තුල කමිටුව වසින් මණ්ඩලයේ මුළු ණයගැති ශේෂය පිළිබදව සාකච්ජා කර නිර්දේශ ලබා දී ඇත.

2020 වර්ෂයේදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි විගණන සහ කළමණාකරන කමිටුවට නව කමිටු සාමාජිකයින් පත් කරන ලදි. 2020 සහ 2021 වසර තුළදී, කොවිඩ් වසංගත තත්වයන් යටතේ කමිටුව ක්‍රියාත්මක විමට සිදුවිය. කෙසේ වෙතත් කමිටුව විසින් ඉහත කාළ සිමාව තුළ නියමිත රැස්වීම් පවත්වා ඇත්තේ “යහපාලන මාර්ගෝපදේශ” සහ රජයේ චක්‍රලේඛ වලට අනුකූලවයි. පසුගිය වසර දෙකක කාළය තුළ කමිටුව අභ්‍යාන්තර හා බාහිර විගණන වාර්තා සාමාලෝචන ක්‍රියාත්මක කිරීම සහතික කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කළේය. ඒ අනුව මුල්‍ය හා අභ්‍යන්තර පාලන දුර්වලතා නිවැරදි කිරීමට කමිටුව මණ්ඩලයට සහය වී ඇත. අවසාන වශයෙන් අනාගතයේදි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි තිරසාර සංවර්ධනය සඳහා තීරණ ගැනීම සඳහා මණ්ඩලයට නිර්දේශ ලබා දීමට කමිටුව බලාපොරොත්තු වේ.

විගණන කමිටු සභාපති,
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය.

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපල වල ක්‍රියාත්මක වන පශු සම්පත් සහ වගා ව්‍යාපෘති

| අනු අංකය | ගොවිපල | සත්ත්ව විශේෂය | වර්ගය | භෝග වර්ගය |
|---|---|---|---|---|
| 01 | මැණික්පාලම | එළගව | ජර්සි ෆ්‍රීෂියන් දෙමුහුන් | |
| 02 | ඔයගම | එළගව | ජර්සි | |
| 03 | බෝපත්තලාව | එළගව | ජර්සි ෆ්‍රීෂියන් දෙමුහුන් | |
| 04 | රොසිටා | එළගව | ජර්සි ෆ්‍රීෂියන් දෙමුහුන්, | |
| | | ඌරන් | ඩියුරොක්, ලාජ්වයිට්, ලෑන්ඩ් රේස් | |
| | | එළුවන් | සානන් | |
| | | හාවුන් | නිව්සීලන්ඩ් වයිට්, කැලිෆෝනියා ජයන්ට් | |
| 05 | මරඳවිල | එළගව | සහිවාල් දෙමුහුන් | පොල් |
| | | මීගව | මුරා දෙමුහුන් | |
| 06 | නිකවැරටිය | එළගව | සහිවාල් | |
| | | මීගව | නිලිරවි | |
| 07 | ආඬිගම | එළගව | සහිවාල්, සහිවාල් දෙමුහුන් | පොල්, රබර් |
| 08 | ගල්පොකුණ | එළගව | සහිවාල් දෙමුහුන්, ජර්සි ෆ්‍රීෂියන් දෙමුහුන් | පොල් |
| | | ගම් කුකුළන් | | |
| 09 | කොවුල්වැව | එළගව | සහිවාල් දෙමුහුන් | පොල්, රබර් |
| | | එළුවන් | සානන් | |
| 10 | රුක්අත්තන | එළගව | සහිවාල් දෙමුහුන් | පොල් |
| | | බැටළුවන් | යාපනය දේශීය බැටළුවන් | |
| 11 | නාරංගල්ල | එළගව | සහිවාල් දෙමුහුන් | පොල් |
| 12 | මහබේරියතැන්න | එළගව | ජර්සි ෆ්‍රීෂියන් දෙමුහුන් | පොල් |
| | | ඌරන් | ඩියුරොක්, ලාජ්වයිට්, ලෑන්ඩ් රේස් | |
| | | වාණිජමය බිත්තර දමන කිකිළියන් | ෂේවර් බ්‍රවුන් | |
| 13 | පොලොන්නරුව | මීගව | මුරා | |
| | | ගම් කුකුළන් | | |
| 14 | සිරිංගපාත | එළගව | සහිවාල් දෙමුහුන් | පොල් |
| | | කළුකුන් | නිකලස් | |
| 15 | ඔයාමඩුව | එළගව | සහිවාල් දෙමුහුන් | |
| | | බැටළුවන් | දෙමුහුන් | |
| 16 | මැල්සිරිපුර | එළගව | සහිවාල් දෙමුහුන් | පොල් |
| | | මීගව | මුරා දෙමුහුන් | |
| | | වාණිජමය බිත්තර දමන කිකිළියන් | ෂේවර් බ්‍රවුන්, කෝබ් 500 | |
| 17 | බෙලිගම | එළගව | ජර්සි සහිවාල් දෙමුහුන් | පොල්, රබර් |
| 18 | පරසන්ගස්වැව | එළගව | සැල්වේජ් ඇනිමල් | |
| | | වාණිජමය බිත්තර දමන කිකිළියන් | ෂේවර් බ්‍රවුන් | |
| 19 | පොලොන්තලාව | එළගව | සහිවාල් දෙමුහුන් | පොල් |
| 20 | හාරගම | වාණිජමය බිත්තර දමන කිකිළියන් | ෂේවර් බ්‍රවුන් | පොල් |

| | | | | |
|---|---|---|---|---|
| | | වටුවන් | ජපන් වටුවන් | |
| 21 | මාටින් | ඌරන් | ඩියුරොක්, ලාජ්වයිට්, ලෑන්ඩ් රේස් | පොල් |
| 22 | කොට්ටුකච්චිය | එළුවන් | ජමුනාපාරි, ශ්‍රී ලංකන් බෝයර් දෙමුහුන් | |
| | | බැටළුවන් | දෙමුහුන් | |
| 23 | රිදියගම | එළගව | ජර්සි ප්‍රීෂියන් දෙමුහුන් | පොල් |
| 24 | විරවිල | මීගව | මුරා දෙමුහුන් | |
| 25 | වැලිකන්ද | එළගව | කිලාරි | |
| 26 | රුක්අත්තන | ඌරන් | ඩියුරොක්, ලාජ්වයිට්, ලෑන්ඩ් රේස් | පොල් |
| | | බැටළුවන් | දෙමුහුන් | |
| 27 | වැලිසර | ඌරන් | ඩියුරොක්, ලාජ්වයිට්, ලෑන්ඩ් රේස් | |
| 28 | මිරිස්වත්ත | බ්‍රොයිලර් මව්පිය සතුන් | කෝබ් 500 | පොල් |
| 29 | මාරවිල | බිත්තර දමන මව්පිය සතුන් | සේවර් බ්‍රවුන් | පොල් |
| 30 | කරඳගොල්ල | බ්‍රොයිලර් මව්පිය සතුන් | කෝබ් 500 | |

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පශු සම්පත් සහ භෝග වල පසුගිය කාර්ය සාධනය (2013 සිට 2017 වසර දක්වා)

| කාර්යය | ඒකකය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| **එළගව** | | | | | | |
| මුළු සත්ව ගහණය | ගණන | 7295 | 7309 | 10556 | 10597 | 106683 |
| වසර 02 කට වැඩි වැස්සියන් | ගණන | 1070 | 831 | 9942 | 1135 | 1294 |
| වසර 0 - 2 අතර වැස්සියන් | ගණන | 1910 | 1547 | 2856 | 2909 | 3108 |
| වසරකට අඩු වස්සන් | ගණන | 439 | 445 | 476 | 460 | 358 |
| මුළු උපත් ගණන | ගණන | 3410 | 3078 | 3894 | 4157 | 4496 |
| අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම | ගණන | 2721 | 2002 | 1837 | 1742 | 2496 |
| පරිභව කර ඉවත් කිරීම | ගණන | 738 | 337 | 179 | 370 | 544 |
| මුළු දෙනුන් ගණන | ගණන | 3787 | 4196 | 5057 | 6064 | 5731 |
| කිරෙහි සිටින දෙනුන් | ගණන | 2124 | 2410 | 3154 | 3707 | 3448 |
| කිරෙහි සිටින දෙනුන්ගේ ප්‍රතිශතය | % | 59 | 57 | 57 | 52 | 52 |
| දෙනෙකුගේ දෛනික කිරි නිෂ්පාදනයේ සාමාන්‍යය | ලීටර් | 11.2 | 11.4 | 11.0 | 12.2 | 12.0 |
| කිරි මුරයේ සාමාන්‍යය | දින | 257 | 257 | 296 | 291 | 296 |
| කිරි නිෂ්පාදනය | ලීටර් (මි.) | 8.6 | 10.0 | 10.2 | 17.2 | 14.4 |
| පළමු පැටවා බිහිකරන වයසෙහි සාමාන්‍යය | මාස | 47 | 39 | 40 | 38 | 39 |
| පැටවුන් ප්‍රසූත කිරීමේ පරතරයේ සාමාන්‍යය | දින | 431 | 427 | 434 | 432 | 434 |
| **මීගව** | | | | | | |
| මුළු සත්ව ගහණය | ගණන | 2080 | 2355 | 2408 | 2535 | 2734 |
| වසර 02 කට වැඩි වැස්සියන් | ගණන | 468 | 482 | 622 | 413 | 6689 |
| වසර 0 - 2 අතර වැස්සියන් | ගණන | 464 | 516 | 638 | 7664 | 616 |
| වසරකට අඩු වස්සන් | ගණන | 190 | 253 | 250 | 179 | 154 |
| මුළු උපත් ගණන | ගණන | 601 | 743 | 821 | 773 | 6637 |
| අභිජනනය සඳහා සතුන් නිකුත් කිරීම | ගණන | 285 | 301 | 438 | 318 | 437 |
| පරිභව කර ඉවත් කිරීම | ගණන | 125 | 110 | 63 | 103 | 93 |
| මුළු දෙනුන් ගණන | ගණන | 943 | 982 | 1109 | 1029 | 1100 |
| කිරෙහි සිටින දෙනුන් | ගණන | 4432 | 4492 | 4475 | 399 | 357 |
| කිරෙහි සිටින දෙනුන්ගේ ප්‍රතිශතය | % | 48 | 49 | 50 | 43 | 44 |
| දෙනෙකුගේ දෛනික කිරි නිෂ්පාදනයේ සාමාන්‍යය | ලීටර් | 3.9 | 3.8 | 3.8 | 4.2 | 4.3 |
| කිරි මුරයේ සාමාන්‍යය | දින | 251 | 266 | 248 | 270 | 265 |
| කිරි නිෂ්පාදනය | ලීටර් (මි.) | 0.70 | 0.70 | 0.8 | 0.69 | 0.63 |
| පළමු පැටවා බිහිකරන වයසෙහි සාමාන්‍යය | මාස | 50 | 52 | 50 | 60 | 54 |
| පැටවුන් ප්‍රසූත කිරීමේ පරතරයේ සාමාන්‍යය | දින | 503 | 416 | 451 | 480 | 468 |
| **කුකුළන්** | | | | | | |
| **බ්‍රොයිලර් මව්පිය සතුන්** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | 19,585 | 23,422 | 30,250 | 28,516 | 31,118 |
| ආනයනය කරන ලද සතුන් | | | | | | |
| පිරිමි | ගණන | 2487 | 2613 | 3278 | 1567 | 2905 |
| ගැහැණු | ගණන | 16,540 | 18,402 | 23,188 | 12,780 | 23,478 |
| මුළු බිත්තර නිෂ්පාදනය | මිලියන | 2.53 | 2.53 | 2.73 | 3.74 | 3.5 |
| රැකිය හැකි බිත්තර නිෂ්පාදනය | මිලියන | 2.28 | 2.34 | 2.53 | 3.17 | 3.2 |
| පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය | % | 74 | 80 | 85 | 76 | 77 |
| නිෂ්පාදිත මුළු කුකුළු පැටවුන් | මිලියන | 1.69 | 1.80 | 1.96 | 2.44 | 2.47 |
| **බිත්තර දමන මව්පිය සතුන්** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | 6165 | 5627 | 5912 | 8607 | 7850 |
| ආනයනය කරන ලද සතුන් | | | | | | |
| පිරිමි | ගණන | 750 | 3375 | 375 | 1039 | 623 |
| ගැහැණු | ගණන | 6240 | 3120 | 3120 | 8593 | 4874 |
| මුළු බිත්තර නිෂ්පාදනය | මිලියන | 0.82 | 1.28 | 0.99 | 1.33 | 1.8 |
| රැකිය හැකි බිත්තර නිෂ්පාදනය | මිලියන | 0.66 | 0.992 | 0.74 | 1.07 | 1.3 |
| පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය | % | 74 | 60 | 64 | 59 | 60 |

| **කාර්යය** | **ඒකකය** | **2013** | **2014** | **2015** | **2016** | **2017** |
|---|---|---|---|---|---|---|
| නිෂ්පාදිත මුළු කුකුළු පැටවුන් | මිලියන | 0.23 | 0.28 | 0.21 | 0.31 | 0.39 |
| **වාණිජ කුකුල් මස් නිෂ්පාදනය** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | 0 | 0 | 10,399 | 11,193 | 0 |
| කුකුල් මස් නිෂ්පාදනය | පක්ෂීන් | 0 | 1812 | 15,412 | 46,494 | 4338 |
| **වාණිජ බිත්තර නිෂ්පාදනය** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | 6109 | 50966 | 6443 | 9279 | 10,803 |
| මුළු කිකිළියන් සංඛ්‍යාව | ගණන | 6065 | 5012 | 3900 | 7686 | 8241 |
| බිත්තර නිෂ්පාදනය | මිලියන | 1.24 | 1.26 | 1.05 | 1.03 | 2.5 |
| **වටු බිත්තර නිෂ්පාදනය** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | 165 | 124 | 1084 | 1270 | 2097 |
| මුළු කිකිළියන් සංඛ්‍යාව | ගණන | 165 | 124 | 1009 | 1141 | 1208 |
| බිත්තර නිෂ්පාදනය | ගණන | 23,285 | 28,857 | 26,629 | 84,393 | 221,675 |
| **ගම් කුකුළු බිත්තර නිෂ්පාදනය** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | - | - | - | 2032 | 2542 |
| මුළු කිකිළියන් සංඛ්‍යාව | ගණන | - | - | - | 676 | 1143 |
| බිත්තර නිෂ්පාදනය | ගණන | - | - | - | 106,339 | 257,742 |
| **කළුකුම් බිත්තර නිෂ්පාදනය** | | | | | | |
| මුළු සතුන් ප්‍රමාණය | ගණන | - | - | 262 | 1865 | 850 |
| මුළු කිකිළියන් සංඛ්‍යාව | ගණන | - | - | - | 157 | 353 |
| බිත්තර නිෂ්පාදනය | ගණන | - | - | - | 14,259 | 52,305 |
| **අභිජනනය සඳහා ඌරන් ඇති කිරීම** | | | | | | |
| මුළු සත්ව ගහණය | ගණන | 764 | 727 | 1090 | 2015 | 1549 |
| ඉපදුණු මුළු ඌරු පැටවුන් ප්‍රමාණය | ගණන | 2776 | 3075 | 3347 | 4805 | 2313 |
| ඊරියක වරකට බිහි කරන පැටවුන්ගේ සාමාන්‍යය | ගණන | 9 | 8 | 9 | 8 | 8 |
| නැම්බියක වරකට බිහිකරන පැටවුන්ගේ සාමාන්‍යය | ගණන | 10 | 8 | 7 | 8 | 6 |
| මියගිය ඌරු පැටවුන් | ගණන | 245 | 170 | 184 | 268 | 203 |
| අභිජනනය සඳහා නිකුත් කරන ලද සතුන් | ගණන | 3272 | 2870 | 3325 | 3663 | 2235 |
| **එළුවන්** | | | | | | |
| මුළු සත්ව ගහණය | ගණන | 776 | 762 | 794 | 842 | 919 |
| මුළු උපත් ප්‍රමාණය | ගණන | 408 | 401 | 309 | 363 | 403 |
| පැටවුන් ප්‍රසූත කිරීමේ පරතරය | ගණන | 0.64 | 0.74 | 0.57 | 0.76 | 0.92 |
| මරණ (වැඩිහිටි සහ පැටවුන්) | ගණන | 235 | 131 | 220 | 107 | 168 |
| අභිජනනය සඳහා නිකුත් කිරීම | ගණන | 21 | 138 | 97 | 175 | 116 |
| එළු කිරි නිෂ්පාදනය | ලිටර් | 5617 | 7759 | 11046 | 9056 | 12753 |
| **බැටළුවන්** | | | | | | |
| මුළු සත්ව ගහණය | ගණන | 4358 | 4890 | 4626 | 5571 | 6712 |
| මුළු උපත් ප්‍රමාණය | ගණන | 1887 | 1827 | 1378 | 2168 | 2355 |
| පැටවුන් ප්‍රසූත කිරීමේ පරතරය | ගණන | 1.2 | 0.8 | 1.4 | 1.3 | 0.89 |
| මරණ (වැඩිහිටි සහ පැටවුන්) | ගණන | 195 | 434 | 770 | 181 | 125 |
| අභිජනනය සඳහා නිකුත් කිරීම | ගණන | 652 | 351 | 845 | 753 | 523 |
| **ගොවි පුහුණු වැඩසටහන්** | | | | | | |
| පාඨමාලා | ගණන | 73 | 75 | 49 | 47 | 33 |
| සහභාගි වූවන් ගණන | ගණන | 1806 | 2212 | 1214 | 1091 | 1248 |
| **පොල් නිෂ්පාදනය** | | | | | | |
| ගෙඩි නිෂ්පාදනය | මිලියන | 14.17 | 18.43 | 16.31 | 20.94 | 14.2 |
| කොප්පරා නිෂ්පාදනය | මෙ.ටොන් | 170.78 | 190.10 | 128.6 | 164.4 | 182.2 |

# 2017 වසරේ සිදු කරන ලද ප්‍රධාන සංවර්ධන කටයුතු.

## කිරි ටොෆි නිෂ්පාදනාගාරයක් පිහිටුවීම



ඉහළ තත්වයෙන් යුත් කිරි ටොෆි සාධාරණ මිලකට පාරිභෝගිකයන් වෙත ලබාදීමේ අරමුණින් යන්ත්‍රානුසාරයෙන් කිරිටොෆි නිෂ්පාදනය කරන ඒකකයක් ගල්පොකුණ ගොවිපල තුළ ස්ථාපනය කරන ලදී.මෙම ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් රු.මි. 4.4 මුදලක් වැය කර ඇති.

## "පිබිදෙමු පොළොන්නරුව" ව්‍යාපෘතිය

රජරට නවෝදය වැඩසටහනේ "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තණබිම් වගාව සහ මී ගවයින් ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ජලය සැපයීමේ අරමුණින් කුඩා ප්‍රමාණයේ වැව් 03ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර සමාලෝචිත කාලය තුළ අක්කර 50ක සහ අක්කර 25 ක ධාරිතාවයකින් යුත් වැව් 02ක් ඉදිකර ඇත.

මීට අමතරව පොළොන්නරුව ගොවිපළේ තණබිම් වගාවට ජලය සැපයීම සඳහා ඉසින ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කර ඇති අතර ඒ සඳහා ආයෝජනය රුපියල් මිලියන 11 කි.







පොලොන්නරුව ගොවිපලේ ඉදි කර ඇති කුඩා ජලාශ

# නව ඌරු ගාල් 03ක් ඉදිකිරීම

මාටින් ගොවිපළේ ක්‍රියාත්මක කරන ලද ඌරු අභිජනන ව්‍යාපෘතිය සඳහා නව ඌරු ගාල් තුනක් 03 ඉදිකරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු ආයෝජනය රු. මිලියන 10.43 කි.



# යුරෝපීය වර්ගයේ වැස්සන් සඳහා නව ගවගාලක් ඉදිකිරීම

2017 වසරේ රිදියගම, නාරංගල්ල සහ මහබේරියතැන්න යන ගොවිපළවල ආනයනික ගවයින්ට උපන් යුරෝපීය වර්ගයේ වැස්සියන්ට රිදියගම ගොවිපළේ නවාතැන් ගැනීමට හැකිවන පරිදි අංගසම්පූර්ණ නව ගව ගාල් තුනක් ඉදිකරන ලදී. ව්‍යාපෘතියේ මුළු ආයෝජනය රුපියල් මිලියන 23.63 කි.



## මාටින් ගොවිපලේ මස් සැකසුම් ඒකකයක් පිහිටුවීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක් වන මස් සැකසුම් ඒකකය මාර්ටින් ගොවිපලේ ස්ථාපිත කරන ලද අතර ඒ සඳහා යන්ත්‍රෝපකරණ සවිකර දැනටමත් අවසන් කර ඇත. මෙම ඒකකය තුළින්, ආයතනයේ ලාභදායිත්වය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව අගය එකතු කළ නිෂ්පාදන ලෙස දේශීය වෙළෙඳපොළට ඌරු මස් සහ ඌරු මස් නිෂ්පාදන නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම අරමුණ සඳහා අවශ්‍ය තරබාරු ඌරන් මාර්ටින් සහ හොරකැලේ ගොවිපළවලින් සපයා දෙනු ලැබේ. ව්‍යාපෘතියේ ආයෝජනය රුපියල් මිලියන 5.2 කි.

මීට අමතරව රුපියල් මිලියන 4.4 ක වියදමින් ඌරු මස් හා කුකුල් මස් නිෂ්පාදන ගබඩා කිරීම සඳහා මාටින් සහ මහබේරියතැන්න ගොවිපළවල තවත් අධිශීතකරණ කාමර දෙකක් ඉදිකරන ලදී.

## ඉන්කියුබේටර් ඒකක ඉදිකිරීම

දේශීය වෙළෙඳපොලේ ගම් කුකුළන් සහ කළුකම් සඳහා ඇති ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා ඉන්කියුබේටර් ඒකක 02 ක් ගල්පොකුණ ගොවිපළේ සහ අනෙක සිරිංගපාත ගොවිපළේ ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. සමාලෝචිත කාල සීමාව අවසානයේ දී ඉදිකිරීම් සහ යන්ත්‍රෝපකරණ සවිකිරීම අවසන් කරන ලදී. ආයෝජනය රුපියල් මිලියන 1.5 කි.

## අයිස්ක්‍රීම් සහ කිරි ආශ්‍රිත ආහාර නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම

ආයතනයේ දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 40,000 දක්වා වැඩි කර ඇති අතර ඒවා ප්‍රධාන වශයෙන් නැවුම් කිරි ආකාරයෙන් අලෙවි කෙරේ. ආනයනික සතුන්ගේ නිෂ්පාදන පිරිවැය වඩා ඉහළ වන අතර කිරි ව්‍යාපෘතිවල අපේක්ෂිත ලාභය අඩු වේ. එබැවින් අගය එකතු කළ කිරි නිෂ්පාදන දේශීය වෙළෙඳපොළට හඳුන්වා දීමට තීරණය කරන ලදී. ඒ අනුව වැලිසර ගොවිපළේ අයිස්ක්‍රීම් සහ අනෙකුත් කිරි ආහාර නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගනන් කැඳවා ඇති අතර, එහි මුළු මුදල රුපියල් මිලියන 26ක් සඳහා තෝරාගත් සැපයුම්කරු වෙත කොන්ත්‍රාත්තුව ලබාදී ඇත.

## තණබිම් සංවර්ධනය

කිරි ගවයින්ගේ රළු ආහාර අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2017 වසරේ අක්කර 1,508 ක ඉලක්කයට සාපේක්ෂව සමාලෝචිත කාල සීමාව අවසන් වන විට තෘණ සහ ආහාර අක්කර 925 ක වගා කර ඇත. අතිරික්ත නිෂ්පාදනය සයිලේජ් සහ පිදුරු සඳහා අදාළ ගොවිපලවල සංරක්ෂණය කෙරේ. මෙසේ සංරක්ෂණය කරන ලද තෘණ වියළි කාලවලදී සතුන් පෝෂණය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.

තණබිම් සංවර්ධනය සඳහා මිලදී ගත් බීජ ආනයනය සහ දේශීය මිලදී ගැනීම් මගින් සපුරා ගන්නා ලද අතර, ඒවායේ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | මිලදී ගත් ප්‍රමාණය (කි.ග්‍රෑ) | පිරිවැය (රු.මි.) |
|---|---|---|
| සෝගම් | 5,880 | 10.0 |
| බ්‍රැකේරියා ඩිකැම්බන්ස් | 1,200 | |
| බඩ ඉරිඟු -පොලොන්නරුව, රිදියගම | 7,300 | |
| විජලනය වූ ඇල්ෆා ඇල්ෆා | 48,000 | 3.4 |





## ජංගම විදුලි වැටවල් හදුන්වාදීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ගවයන්, බැටළුවන්, එළුවන් වැනි සතුන් අක්‍රමවත් ලෙස තණකොළ කෑමෙන් වැලැක්වීම සඳහාත්, ශ්‍රම පිරිවැය අවම කර ගැනීම සඳහාත්, සතුන් පෝෂණය කිරීම සඳහා තෘණ ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහාත් ජංගම විදුලි වැට හඳුන්වා දී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.86 ක මුදලක් ආයෝජනය කර ඇත.





රැක්අත්තන ගොවිපලේ යොදාගනු ලබන ජංගම විදුලි වැට

## සංචාරක බංගලා නවීකරණය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ (NLDB) සංචාරක බංගලා මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇත. මෙම වැඩසටහන යටතේ සිරිංගපාත ගොවිපළේ සහකාර සාමාන්‍යාධිකාරී නිල නිවාසය සංචාරක බංගලාවක් බවට පත් කර ඇත.





සිරිංපාත ගොවිපලෙහි සංචාරක බංගලාව

## නව අලෙවිසැල් ඉදිකිරීම

කොවුල්වැව සහ හාරගම ගොවිපලවල අලෙවිය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2017 වසරේ ගොවිපල අලෙවිසැල් දෙකක් ඉදිකරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුළු ආයෝජනය රු. මිලියන 5.8 ක් විය.






හාරගම ගොවිපලෙහි ඉදිකරන ලද නව අලෙවිසැල

## ගව ශුක්‍රාණු ආනයනය කිරීම

ආනයනික කිරි ගවයින්ගේ සිංචන අවශ්‍යතා සපුරාලීම සඳහා ඩෙන්මාර්කයෙන් ගව ශුක්‍ර තරල මාත්‍රා 3,790 ක් ආනයනය කර ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 3.8 ක් වැය කර ඇත.

## ගොවිපල පදනම් කරගත් සංවර්ධන කටයුතු

| අනු අංකය | සංවර්ධන කාර්යය | ආයෝජනය රු. (මිලියන) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1. | මාරවිල ගොවිපල සඳහා මාපිය පරම්පරාවේ බිත්තර දමන කිකිළියන් 5600 ක් ආනයනය කිරීම | 5.1 | 100 |
| 2. | වීරවිල ගොවිපලේ කිරි උණු කිරීමේ ඒකකයක් පිහිටුවීම | 0.5 | |
| 3. | ඩයගම ගොවිපලේ ගවගාල් නවීකරණය | 1.0 | |
| 4. | කොට්ටුකච්චිය ගොවිපලේ එළු ගාල නවීකරණය | 2.0 | |
| 5. | නිකවැරටිය ගොවිපලේ වැව පිරිසිදු කිරීම සහ ඇළ ඉදිකිරීම | 1.0 | |
| 6. | රොසිටා ගොවිපලේ හාවුන් සඳහා නව හා කොටුවක් ඉදිකිරීම | 0.1 | |

## (NLDB) සහභාගීත්වය ලබාදුන් ප්‍රදර්ශන

| ප්‍රදර්ශනය | ස්ථානය | කාලසීමාව |
|---|---|---|
| විවෘත ආර්ථිකයේ 40 වැනි සංවත්සරයට සමගාමීව පැවැත්වූ ප්‍රදර්ශනය | ජාතික තරුණ සේවා මධ්‍යස්ථානය, මහරගම | 2017 අගෝස්තු 27-30 |
| “Lanka Livestock 2017” ප්‍රදර්ශනය | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය | 2017 ජූලි 20-22 |
| ජාතික පශු සම්පත් දිනය නිමිත්තෙන් | පැලැට්ටි ජාන සම්පත් මධ්‍යස්ථානය | 2017 ඔක්තෝම්බර් 08 |
| “Agro Royal” ප්‍රදර්ශනය | කොළඹ රාජකීය විද්‍යාලය | 2017 ජුනි 15-16 |






Lanka Livestock 2017 ප්‍රදර්ශණය





ගරු අමාත්‍යතුමා ප්‍රදර්ශනයට සහභාගි වූ අවස්ථාව






"Agro Royal "ප්‍රදර්ශණය

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ජාතික මට්ටමේ ජයක්

ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය (**CNCI**) විසින් පවත්වනු ලබන ("**Entrepreneur Par Excellence 2017**") වැඩසටහන යටතේ කර්මාන්තකරුවන් ඇගයීම සඳහා වූ රාජ්‍ය අංශයේ තරඟ මාලාවේදී ලංකා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් 03 වැනි ස්ථානය ලබා ගනිමින් කීර්තිමත් ජාතික මට්ටමේ විශිෂ්ටත්වය සහ විශිෂ්ටතා සම්මානයෙන් පිදුම් ලබා ඇත.










අතිගරු ජනාධිපති තුමා අතින් සම්මාන සහතික ලබා ගන්නා අවස්ථාව

# ආයතනික පාලන වාර්තාව

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස පවත්වාගෙන යමින් පවතින අතර එය රටේ පශු සම්පත් නිෂ්පාදනයට සම්බන්ධ විශාලතම රාජ්‍ය ආයතනය වේ. මණ්ඩලයෙහි සේවකයින් බඳවා ගැනීම සහ උසස් කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට අනුව සිදු කෙරේ. දැනට, මණ්ඩලය පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන, සහ කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ .

## අධ්‍යක්ෂ මණ්ඩලය:

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය කළමනාකරණය කරනු ලබන්නේ භාණ්ඩාගාර නියෝජිතයා ඇතුළු විධායක සභාපති සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් 07 කින් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි. මණ්ඩලයේ සභාපතිවරයා ආයතනයෙහි ප්‍රධාන ගණන් දීමේ නිළධාරියාය. (C.F.O)

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන භූමිකාවන්:

- මණ්ඩල ක්‍රියාදාමයන්ට ක්‍රියාකාරීව සහභාගී වී ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- ක්‍රමෝපායික විධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසෙන මෙහෙයුම් තීරණ ගැනීමේදී විශේෂයෙන් කළමනාකරණයට ප්‍රමාණවත් බලතල පැවරීම සහතික කිරීම.
- තීරණ ගැනීම සහ වගවීම සඳහා පහසුකම් සපයන ශක්තිමත් සහ විශ්වාසනීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් සමඟ සංවිධානය ක්‍රියාත්මක වන බවට සහතික විම.
- ගිණුම්කරණ සහ මුල්‍ය වාර්තාකරණ පද්ධතිවල අඛණ්ඩතාව සහතික කිරීම, අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් පාලනය වැනි පාලන පද්ධති, නීති, රෙගුලාසි සහ අදාළ ප්‍රමිතින්ට අනුකූල වීම තහවුරු කිරීම.
- මෙහෙයුම්, පරිපාලන, මූල්‍ය සැකසුම්කරුවන් ඇතුළු ප්‍රධාන ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර ඇති බවට සහ කාලානුරූපව යාවත්කාලීන කරන බවට සහතික විම.
- විගණන කමිටුව සහ වෙනත් අදාළ මණ්ඩල අනුකමිටු ඇතුළුව මණ්ඩල අනුකමිටු පත් කිරීම සහ නිසි ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම.
- මාසික පදනමින් වසරක් තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 12ක් පැවැත්වීම.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය කළමනාකරණය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය රටෙහි විවිධ පළාත්වල පැතිරී ඇති පශු සම්පත් සහ කෘෂිකාර්මික ගොවිපල 32 ක් සාමාන්‍යාධිකාරීවරයාගේ අධීක්ෂණයට යටත්ව කළමනාකරුවන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් යටතේ පාලනය වේ.

## විගණන කමිටු

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි විගණන කමිටුව භාණ්ඩාගාර නියෝජිතයා ඇතුළු විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් 03න් සමන්විත වේ. නිරීක්ෂකයින් ලෙස රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයා සහභාගී වේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් විගණන කමිටුව රැස්වීම් කැඳවන අතර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් වාර්තා පවත්වාගෙන යයි. විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි අභ්‍යන්තර පාලන පද්ධතියේ ගැටළු සම්බන්ධයෙන් නිවැරදි තීරණ ගැනීම සඳහා අදහස් සහ යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමය.

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ එහි අනුබද්ධිත ආයතනයන්හි

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ............ 4

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ............ 5

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය - සමූහය ............ 6

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය - එන්.එල්.ඩී.බී ............ 6

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ............ 8

1. ආයතනික තොරතුරු ............ 9

1.1 වාර්තාකරණ ඒකකය ............ 9

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය ............ 9

2. සකස් කිරීමේ පදනම ............ 9

2.1 අනුකූලතා ප්‍රකාශනය ............ 9

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ............ 9

2.3 මිනුම් කිරීමේ පදනම ------------ 10

2.4 ව්‍යවහාරික හා වාර්තාකරන මුදල් ------------ 10

2.5 විනිශ්චයන් හා ඇස්තමේන්තු භාවිතා කිරීම ............ 10

2.6 ජංගම හා ජංගම නොවන වර්ගීකරණය ............ 10

2.7 හිලව් කිරීම් ............ 11

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ............ 11

3.1 ඒකාබද්ධ කිරීමේ පදනම ............ 11

3.2 විදේශ මුදල් ගනුදෙනු ............ 12

3.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ............ 13

3.3.1 දේපල පිරියත හා උපකරණ ............ 13

3.3.2 තොග ............ 14

3.3.3 ජීව විද්‍යාත්මක වත්කම් ............ 14

3.3.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය ............ 16

3.3.5 මූල්‍ය උපකරණ ............ 16

3.3.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ............ 16

3.3.5.2 මූල්‍ය වත්කම් හානිකරණය ............ 17

3.3.6 මුදල් හා මුදල් සමාන දෑ ............ 17

3.3.7 ප්‍රදාන ............ 17

3.3.8 වගකීම් හා වෙන්කිරීම් ............ 17

3.3.9 සේවක ප්‍රතිලාභ ............ 18

3.3.10 බදු හා ආයෝජන දේපල ............ 19

3.3.10.1 බදු දේපල ............ 19

3.3.10.2 ආයෝජන දේපල ............ 20

3.3.11 හිමිකම ............ 20

3.4 ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ............ 21

3.4.3 ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ අගය වෙනස්වීම ............ 21

3.4.4 රාජ්‍ය ප්‍රදාන ............ 21

3.4.5 ණයගැනුම් පිරිවැය ............ 22

3.4.6 මූල්‍ය වියදම් ............ 22

3.4.7 ආදායම් බදු වියදම් ............ 22

3.5 පසු සිදුවීම් ............ 23

3.6 ආංශික වාර්තාකරණය ............ 23

3.7 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ............ 23

3.8 සංසන්දනාත්මක තොරතුරු ............ 23

3.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ............ 24

3.10 භාවිතාකරන ලද නිදහස්කිරීම් ............ 24

3.11 ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම් ............ 24

4. නැවත සකස්කරන ලද මූල්‍ය ප්‍රකාශන ............ 25

5. නිකුත් කළ නමුත් වාර්තාකරන දිනට බලාත්මක නොවූ ප්‍රමිත ............ 27

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් ............ 28

## ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | | සමූහය | | NLDB | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා** | | **2017 (විගණිත)** | 2016 (නැවත සකස්කරන ලද) | **2017 (විගණිත)** | 2016 (නැවත සකස්කරන ලද) |
| | සටහන් | රු. | රු. | රු. | රු.. |
| ආදායම | **1** | **2,873,233,682** | 2,902,160,242 | **2,797,588,708** | 2,841,823,456 |
| ජීව විද්‍යාත්මක වත්කම්හි සාධාරණ අගය වෙනස්වීම | **2** | **160,141,793** | (306,842,364) | **160,141,793** | (306,842,364) |
| මුළු ආදායම | | **3,033,375,475** | 2,595,317,878 | **2,957,730,501** | 2,534,981,092 |
| විකුණුම් පිරිවැය | **3** | **(2,258,254,130)** | (2,078,523,211) | **(2,200,111,466)** | (2,038,179,661) |
| **දළ ලාභය** | | **775,121,345** | 516,794,667 | **757,619,035** | 496,801,431 |
| වෙනත් ආදායම් | **4** | **50,681,871** | 54,069,301 | **44,233,831** | 49,329,658 |
| රාජ්‍ය ප්‍රධාන | **5** | **-** | 24,729,601 | **-** | 24,729,601 |
| බෙදාහැරීමේ වියදම් | **6.1** | **(6,790,596)** | (5,223,729) | **(6,412,826)** | (4,981,161) |
| පරිපාලන වියදම් | **6.2** | **(935,767,119)** | (892,365,816) | **(898,157,590)** | (849,955,655) |
| වෙනත් වියදම් | **6.3** | **(11,721,077)** | (6,898,522) | **(11,721,077)** | (6,898,522) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | | **(128,475,576)** | (308,894,498) | **(114,438,627)** | (290,974,648) |
| මූල්‍ය පිරිවැය | **7** | **(179,613,563)** | (122,425,560) | **(178,366,130)** | (122,396,709) |
| බදු පෙර ලාභය/(අලාභය) | | **(308,089,139)** | (431,320,058) | **(292,804,757)** | (413,371,357) |
| බදු වියදම් | **8** | **(1,159,390)** | (962,486) | **(243,000)** | (200,000) |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | **(309,248,529)** | (432,282,544) | **(293,047,757)** | (413,571,357) |
| ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකරන වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) අයිතම:: | | | | | |
| සේවක ප්‍රතිලාභ බැඳීම නැවත අගය කිරීම | | **11,525,951** | 10,998,759 | **11,525,951** | 10,998,759 |
| සේවක ප්‍රතිලාභ බැඳීම නැවත අගය කිරීම මත විලම්භිත බදු | | **-** | - | **-** | - |
| **වසර සඳහා බදු පසු වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)** | | **11,525,951** | 10,998,759 | **11,525,951** | 10,998,759 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)** | | **(297,722,578)** | (421,283,785) | **(281,521,806)** | (402,572,598) |

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි
වරහන් තුළ ඇති අගයන්වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.



## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | සමූහය 2017 (විගණිත) රු. | සමූහය 2016 (නැවත සකස් කරන ලද) රු. | NLDB 2017 (විගණිත) රු. | NLDB 2016 (නැවත සකස් කරන ලද) රු.. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත හා උපකරණ | 9 | **3,084,491,051** | 3,214,703,758 | **2,999,249,355** | 3,126,601,659 |
| කෙරීගෙන යන වැඩ | 9 | **46,151,677** | 24,150,397 | **46,151,677** | 24,150,397 |
| බදු දේපළ | 10 | **6,540,400** | 6,628,784 | **-** | - |
| පරිපාලිතයන්හි ආයෝජන | 12.1 | **-** | - | **149,123,327** | 149,123,327 |
| ආශ්‍රිතයන්හි ආයෝජන | 12.2 | **600,000** | - | **600,000** | - |
| ජීව විද්‍යාත්මක වත්කම් - වගාවන් | 11.1 | **803,185,390** | 735,498,425 | **801,363,098** | 734,086,827 |
| ජීව විද්‍යාත්මක වත්කම් - පශු සම්පත් ප්‍රාග්ධන | 11.2 | **1,782,199,128** | 1,675,410,554 | **1,780,871,628** | 1,674,451,054 |
| | | **5,723,167,646** | 5,656,391,918 | **5,777,359,085** | 5,708,413,264 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 13 | **244,425,253** | 311,480,005 | **232,911,741** | 302,365,928 |
| ජීව විද්‍යාත්මක වත්කම් - පශු සම්පත් අලෙවි | 11.3 | **20,154,765** | 32,033,818 | **20,154,765** | 32,033,818 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 14 | **250,387,644** | 197,005,608 | **248,243,306** | 194,730,534 |
| අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවීම් | 15 | **7,831,435** | 13,327,818 | **6,307,685** | 11,792,818 |
| වෙනත් ජංගම වත්කම් | 16 | **85,539,435** | 137,961,349 | **78,801,967** | 131,223,880 |
| කෙටි කාලීන ආයෝජන | 17 | **114,696,859** | 108,098,984 | **61,643,845** | 59,607,421 |
| මුදල් හා මුදල් සමාන දෑ | 18.1 | **31,923,930** | 37,912,107 | **31,085,508** | 37,157,906 |
| | | **754,959,321** | 837,819,689 | **679,148,817** | 768,912,305 |
| **මුළු වත්කම්** | | **6,478,126,967** | 6,494,211,607 | **6,456,507,902** | 6,477,325,569 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| හිමිකම | | | | | |
| සංචිත ප්‍රාග්ධනය | | **576,587,649** | 576,587,649 | **576,587,649** | 576,587,649 |
| රඳවාගත් ඉපයීම් | | **(517,868,726)** | (220,146,148) | **(639,435,001)** | (357,913,195) |
| ප්‍රාග්ධන සංචිත | | **137,872,649** | 130,696,928 | **137,872,649** | 130,696,928 |
| අයහාර සංචිත | | **44,529,422** | 44,529,422 | **44,529,422** | 44,529,422 |
| ප්‍රත්‍යාගණන සංචිත | | **110,731,360** | 110,731,360 | **110,731,360** | 110,731,360 |
| චක්‍රිය අරමුදල | | **37,500,000** | 37,500,000 | **37,500,000** | 37,500,000 |
| | | **389,352,354** | 679,899,211 | **267,786,079** | 542,132,164 |
| පාලනයට යටත් නොවන අයිතිය | | **-** | - | **-** | - |
| | | **389,352,354** | 679,899,211 | **267,786,079** | 542,132,164 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| දිගු කාලීන ණය | 19.1 | **2,873,609,258** | 3,538,324,720 | **2,854,219,896** | 3,538,324,720 |
| පොලී රහිත ණය | | **50,000,000** | 50,000,000 | **50,000,000** | 50,000,000 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 20 | **185,939,188** | 191,671,331 | **184,448,341** | 190,245,814 |
| බදු වත්කම් මත විලම්භිත ආදායම | 21 | **31,458,341** | 32,370,460 | **31,458,341** | 32,370,461 |
| | | **3,141,006,787** | 3,812,366,511 | **3,120,126,578** | 3,810,940,995 |
| **ජංගම වගකීම්** | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 22 | **941,850,779** | 792,325,499 | **1,079,317,680** | 916,320,119 |
| ගෙවිය යුතු ආදායම් බදු | 23 | **1,994,440** | 1,584,878 | **-** | - |
| කෙටි කාලීන ණය | 19.2 | **57,868,479** | 816,280 | **57,868,479** | 816,280 |
| මාස 12 තුළ ගෙවිය යුතු ණය | 19.3 | **1,931,409,086** | 1,207,116,011 | **1,931,409,086** | 1,207,116,011 |
| බැංකු අයිරාව | 18.2 | **14,645,042** | 103,217 | **-** | - |
| | | **2,947,767,826** | 2,001,945,885 | **3,068,595,245** | 2,124,252,410 |
| **මුළු හිමිකම හා වගකීම්** | | **6,478,126,967** | 6,494,211,607 | **6,456,507,902** | 6,477,325,569 |

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ ඇති අගයන්වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කරමි.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂකවරුන් සතු වගකීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට අත්සන් කරන ලදී;

| ............................ | ................................ | ............................ |
|---|---|---|
| **කළමනාකරු - මූල්‍ය** | **සභාපති**<br>**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය** | **නියෝජ්‍ය සභාපති** |

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය - සමූහය

| | පරිපාලකයෙහි හිමිකරුවන්ගේ අයිතිය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංචිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයීම් | ප්‍රග්ධන සංචිත | අයභාර සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | චක්‍රීය අරමුදල | පාලනය ව යටත් නොවන අයිතිය | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය (නැවත සකස් කරන ලද) | 576,587,649 | 201,137,637 | 130,696,928 | 44,529,422 | 110,731,360 | 37,500,000 | - | 1,101,182,996 |
| වර්ෂය සඳහා ලාභය (නැවත සකස් කරන ලද) | - | (432,282,544) | - | - | - | - | - | (432,282,544) |
| වෙනත් විස්තීර්ණ ආදායම් (නැවත සකස් කරන ලද) | - | 10,998,759 | - | - | - | - | - | 10,998,759 |
| ලාභාංශ (නැවත සකස් කරන ලද) | - | - | - | - | - | - | - | - |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** (නැවත සකස් කරන ලද) | 576,587,649 | (220,146,148) | 130,696,928 | 44,529,422 | 110,731,360 | 37,500,000 | - | 679,899,211 |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය (නැවත සකස් කරන ලද) | **576,587,649** | **(220,146,148)** | **130,696,928** | **44,529,422** | **110,731,360** | **37,500,000** | - | **679,899,211** |
| වර්ෂය සඳහා ලාභය (විගණිත) | - | **(309,248,529)** | - | - | - | - | - | **(309,248,529)** |
| වෙනත් විස්තීර්ණ ආදායම් (විගණිත) | - | **11,525,951** | - | - | - | - | - | **11,525,951** |
| ප්‍රාග්ධන සංචිත (විගණිත) | - | - | **7,175,721** | - | - | - | - | **7,175,721** |
| ලාභාංශ (විගණිත) | - | - | - | - | - | - | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** (විගණිත) | **576,587,649** | **(517,868,726)** | **137,872,649** | **44,529,422** | **110,731,360** | **37,500,000** | - | **389,352,354** |

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි
වරහන් තුළ ඇති අගයන්වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය - NLDB

| | සංචිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයීම් | ප්‍රාග්ධන සංචිත | අයභාර සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | චක්‍රිය අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2016 ජනවාරි 01දිනට ශේෂය** (නැවත සකස් කරන ලද) | 576,587,649 | 44,659,403 | 130,696,928 | 44,529,422 | 110,731,360 | 37,500,000 | 944,704,762 |
| වර්ෂය සඳහා ලාභය (නැවත සකස් කරන ලද) | - | (413,571,357) | - | - | - | - | (413,571,357) |
| වෙනත් විස්තීර්ණ ආදායම් (නැවත සකස් කරන ලද) | - | 10,998,759 | - | - | - | - | 10,998,759 |
| ලාභාංශ (නැවත සකස් කරන ලද) | - | - | - | - | - | - | - |
| **2016 දෙසැම්බර් 31දිනට ශේෂය** (නැවත සකස් කරන ලද) | 576,587,649 | (357,913,195) | 130,696,928 | 44,529,422 | 110,731,360 | 37,500,000 | 542,132,164 |
| **2017 ජනවාරි 01දිනට ශේෂය** (නැවත සකස් කරන ලද) | **576,587,649** | **(357,913,195)** | **130,696,928** | **44,529,422** | **110,731,360** | **37,500,000** | **542,132,164** |
| වර්ෂය සඳහා ලාභය (විගණිත) | - | **(293,047,757)** | - | - | - | - | **(293,047,757)** |
| වෙනත් විස්තීර්ණ ආදායම් (විගණිත) | - | **11,525,951** | - | - | - | - | **11,525,951** |
| ප්‍රාග්ධන සංචිත (විගණිත) | - | - | **7,175,721** | - | - | - | **7,175,721** |
| ලාභාංශ (විගණිත) | - | - | - | - | - | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** (විගණිත) | **576,587,649** | **(639,435,001)** | **137,872,649** | **44,529,422** | **110,731,360** | **37,500,000** | **267,786,079** |

අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි
වරහන් තුළ ඇති අගයන්වලින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා | සමූහය 2017 (විගණිත) රු. | සමූහය 2016 (නැවත සකස් කරන ලද) රු. | NLDB 2017 (විගණිත) රු. | NLDB 2016 (නැවත සකස් කරන ලද) රු. |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභය | **(308,089,139)** | (431,320,058) | **(292,804,757)** | (413,371,357) |
| **ගැලපීම්** | | | | |
| දේපල පිරියත හා උපකරණ ක්ෂය | **225,990,882** | 215,678,309 | **220,780,775** | 206,436,865 |
| බදු දේපල ක්‍රමක්ෂය | **88,384** | 88,384 | **-** | - |
| පශු සම්පත් මත වූ අගය අඩුවීම/( වැඩිවීම) | **(160,141,793)** | (135,664,227) | **(160,141,793)** | (135,664,227) |
| අපහරණය මත වූ අලාභය/(ලාභය) දේපල පිරියත හා උපකරණ | **135,323** | (28,772) | **135,323** | (28,772) |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් | **11,683,058** | 12,677,382 | **11,523,543** | 12,028,995 |
| විලම්භිත බදු ආදායම | **(912,122)** | (912,121) | **(912,122)** | (912,121) |
| පොලී වියදම | **179,574,014** | 122,425,561 | **178,326,582** | 122,396,709 |
| තැන්පතු මත පොලී | **(6,168,672)** | (4,569,284) | **(6,168,672)** | (4,569,284) |
| බොල් හා අඩමාණ ණය වෙන්කිරීම් | **1,773,500** | 887,524 | **1,773,500** | 887,524 |
| වගාවන් සඳහා වියදම් | **11,584,366** | 9,188,306 | **11,584,366** | 9,188,306 |
| ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම් | **-** | 9,182,539 | **-** | 9,182,539 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | | |
| තොගයෙහි අඩුවීම/(වැඩිවීම) | **67,054,753** | (103,962,618) | **69,454,188** | (99,293,554) |
| පශු සම්පත් අලෙවි අඩුවීම/(වැඩිවීම) | **11,879,053** | 24,873,027 | **11,879,053** | 24,873,027 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම/(වැඩිවීම) | **(52,358,118)** | (9,441,086) | **(52,500,103)** | (8,762,940) |
| අත්තිකාරම්, තැන්පතු හා කලින් ගෙවීම් අඩුවීම/(වැඩිවීම) | **923,682** | (3,704,029) | **5,485,133** | (5,212,466) |
| වෙනත් ජංගම වත්කම් අඩුවීම/(වැඩිවීම) | **51,821,913** | (57,509,904) | **51,821,913** | (57,509,904) |
| කෙටිකාලීන ආයෝජන අඩුවීම/(වැඩිවීම) | **(2,036,424)** | (1,323,733) | **(2,036,424)** | (1,323,733) |
| වෙළඳ හා අනෙකුත් දෑ (අඩුවීම)/වැඩිවීම | **21,389,853** | 161,727,208 | **34,862,129** | 152,532,742 |
| කෙටිකාලීන ණයගැනීම් (අඩුවීම)/වැඩිවීම | **57,052,199** | (40,818,259) | **57,052,199** | (40,818,259) |
| මාස 12 තුල ගෙවිය යුතු ණය (අඩුවීම)/වැඩිවීම | **724,293,074** | 443,057,842 | **724,293,074** | 443,057,842 |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | **835,537,786** | 210,531,991 | **864,407,907** | 213,117,932 |
| බදු ගෙවීම් | **(749,828)** | (875,166) | **(243,000)** | (464,318) |
| පාරිතෝෂිත ගෙවීම් | **(27,767,519)** | (22,623,427) | **(27,673,334)** | (22,451,157) |
| පොලී ගෙවීම් | **(29,560,310)** | (13,838,998) | **(28,312,877)** | (13,810,147) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **777,460,129** | 173,194,400 | **808,178,696** | 176,392,310 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය (භාවිතා කරන ලද)** | | | | |
| ජංගම නොවෙන වත්කම් මිලදී ගැනීම | **(120,113,193)** | (174,347,654) | **(117,763,488)** | (166,608,172) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | **2,198,425** | - | **2,198,426** | - |
| වගාවන්හි ආයෝජනය | **(79,271,331)** | (90,810,638) | **(78,860,637)** | (90,746,138) |
| පශු සම්පත් ප්‍රාග්ධන වෙනස්වීම් | **53,353,222** | 443,881,760 | **53,721,222** | 444,841,260 |
| ස්ථාවර තැන්පත් මත පොලී | **3,382,487** | 3,884,612 | **3,382,487** | 3,884,612 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | **7,175,721** | - | **7,175,721** | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධමුදල් ප්‍රවාහය** | **(133,274,669)** | 182,608,080 | **(130,146,269)** | 191,371,562 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| බැංකු ණය ලබා ගැනීම | **19,389,362** | - | **-** | - |
| ණය හා කල්බදු පියවීම් | **(684,104,824)** | (351,136,624) | **(684,104,824)** | (351,136,624) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(664,715,462)** | (351,136,624) | **(684,104,824)** | (351,136,624) |
| **මුදල් හා මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **(20,530,002)** | 4,665,856 | **(6,072,398)** | 16,627,248 |
| **ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ** | **37,808,890** | 33,143,034 | **37,157,906** | 20,530,658 |
| **අවසාන මුදල් හා මුදල් සමාන දෑ** | **17,278,888** | 37,808,890 | **31,085,508** | 37,157,906 |

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් දක්වයි.

8



# 1. ආයතනික තොරතුරු

## 1.1 වාර්තාකරණ ඒකකය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ("NLDB" 1972) අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ 1973 දී පිහිටුවන ලද අතර ක්ෂේත්‍රයේ මෙහෙයුම් කටයුතු 1974 දී ආරම්භ කරන ලදී. NLDB, පශු සම්පත් ගොවිපල ප්‍රවර්ධන හා කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. වර්තමානයේදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් පශු සම්පත් සහ භෝග අන්තර්ශ්‍රේණිගත ගොවිපල 30ක් හා පුහුණු මධ්‍යස්ථානයක් කළමනාකරණය කරයි. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය අංක 40,නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 5 යන ස්ථානයේ පිහිටා ඇත.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් තුළ, ජාතික පශු සම්පත් මණ්ඩලය සහ එහි අනුබද්ධිත ආයතනයන්හි මූල්‍ය තොරතුරු (එක්ව ගත් විට "සමූහය" ලෙස සහ තනි තනිව ගත් විට "සමූහ ඒකකය" ලෙසින්) ඇතුළත් වේ.

## 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි (පරිපාලක) හි ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ රටේ පශු සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා දායක වීමේ අරමුණින් යුතුව පශු සම්පත් / භෝග ඒකාබද්ධ ගොවිතැන් පද්ධතියක් සහිත පශු සම්පත් අභිජනන ගොවිපළ නඩත්තු කිරීමයි.

ශ්‍රී ලංකා කුකුළුපාලන සංවර්ධන පුද්ගලික සමාගමෙහි (පරිපාලිත) ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ කෘෂිකර්මය සහ පශු සම්පත් වේ.

# 2. පිළියෙල කිරීමේ පදනම

## 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් නියම කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) සහ (LKASs&) අනුකූලව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙන්වූ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනවලට පහත සඳහන් සංරචක ඇතුළත් වේ:

- ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළින් වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි සහ සමූහයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සපයයි .
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය තුළින් වර්ෂය අවසානයට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සපයයි.

- හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනයෙන් වර්ෂය තුළ සමූහයේ සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි කොටස් හිමියන්ගේ අරමුදල්වල සිදුවූ සියලු වෙනස්කම් නිරූපණය කරයි.

- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට සහ සමූහයට මුදල් හා මුදල් සමාන දෑ උත්පාදනය කිරීමට ඇති හැකියාව සහ එම මුදල් ප්‍රවාහයන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ තොරතුරු පරිශීලකයින්ට සපයයි.

- මූල්‍ය ප්‍රකාශයන්හි සටහන්, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවලින් සමන්විත වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2020 ජූලි 25 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීමට අවසර දෙන ලදී.

## 2.3 මිනුම්කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් අදාළ ගිණුම් සටහන් යටතේ සිදුකර ඇත.මූල්‍ය ප්‍රකාශන සඳහා බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

## 2.4 ක්‍රියාකාරී හා වාර්තාකරණ මුදල්

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම එම ආයතන ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ පවතින ව්‍යවහාරික මුදල් භාවිතා කරමින් මනිනු ලබයි. ('ක්‍රියාකාරී මුදල්'). මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනවල ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ මුදල් වේ. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, සියලුම මුදල් ආසන්නතම දහස දක්වා වැටයීම් කර ඇත.

## 2.5 විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

මෙම ඒකාබද්ධ සහ වෙන්වූ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, වාර්තා කර ඇති වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් සඳහා බලපානු ලබන ප්‍රතිපත්ති යොදා ගැනීමේදී කළමනාකරණය විසින් ඒ සඳහා වන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කර ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන වෙනත් විවිධ සාධක මත ඇස්තමේන්තු සහ ඒ ආශ්‍රිත උපකල්පන පදනම් වී ඇති අතර ඒවායේ ප්‍රතිඵලය පහසුවෙන් නොපෙනෙන ඉදිරියට ගෙන යනු ලබන වත්කම් සහ වගකීම් වල වටිනාකම් පිළිබඳ විනිශ්චයන් සිදු කිරීමේ පදනම වේ.

ඇස්තමේන්තු සහ ඊට අදාළ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල අනාගත සංශෝධන ඒ තුළින් හඳුනාගනු ලැබේ.

### අඛණ්ඩ පැවැත්ම

කළමනාකාරිත්වය විසින් මෙම ව්‍යාපාරය ඉදිරියට කරගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් සිදුකර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් මණ්ඩලය සතු බවට සෑහීමකට පත්වේ.

තවද, සමූහයට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මත අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරීත්වයට හඳුනාගැනීමට ලැබී නොමැත. එබැවින්, අඛණ්ඩව ක්‍රියාත්මක වීමේ පදනම මත සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබේ.

### 2.6 ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

සමූහය විසින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් ජංගම හා ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව ඉදිරිපත් කරයි. ජංගම වත්කමක් යනු සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන විට සහ මූලික වශයෙන් වෙළඳාම සඳහා තබා ගැනීමට හෝ වාර්තා කිරීමේ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන විට හෝ වාර්තාකරණ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වන වගකීමක් හුවමාරු කර ගැනීම හෝ භාවිතා කිරීම සීමා කර ඇති හෝ නොවන මුදල් හෝ මුදල් සමාන දෑ වේ. අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ග කර ඇත.

ජංගම වගකීමක් යනු සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ නිරාකරණය කිරීමට අපේක්ෂා කරන විට සහ මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වනු ලබන අතර එය වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට නියමිත විට හෝ නිරවුල් කිරීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති වාර්තා කළ දිනට පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම් වේ. අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර ඇත.

### 2.7 හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කර ඇති ශුද්ධ මුදල, පිළිගත් මුදල් පියවීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කර පියවීමට අදහස් කරන විට පමණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් විසින් අවශ්‍යතාවයට අනුව ඉඩදී ඇත්නම් හෝ අවසර දී ඇත්නම් හා සමූහයේ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් අනාවරණය කර ඇත්නම් මිස ආදායම් ප්‍රකාශයේ ඇති ආදායම් සහ වියදම් හිලව් කර නොමැත.

## 3.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

ජාතික පශු සම්පත් මණ්ඩලය සහ සමූහය විසින් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් , මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදා ගෙන ඇත.

## 3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

### 3.1.1 ව්‍යාපාර සංයෝජන

සමූහය වෙත පාලනය මාරු කරන විට අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජන සඳහා සමූහය විසින් ගිණුම් පිළියෙල කරයි. අත්පත් කර ගැනීමේදී මාරු කරන ලද ප්‍රතිෂ්ඨාව සාමාන්‍යයෙන් මනිනු ලබන්නේ හඳුනා ගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ වටිනාකමට වේ. එහිදී හටගනු ලබන කීර්තිනාමය, හානිකරණය සඳහා  වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි. කේවල් කළ මිලදී ගැනීමකදී හටගනු ලබන ඕනෑම ලාභයක් ,ලාභ හෝ අලාභ වශයෙන් වහාම හඳුනා ගැනේ. දරන ලද ගණුදෙණු පිරිවැය,ණය හෝ කොටස් සුරැකුම්පත් නිකුතුවට සම්බන්ධ නම් හැර වියදමක් ලෙස හඳුනා ගැනේ.

සමූහය විසින් අත්පත් කර ගැනීමේ දිනයේ දී කීර්තිනාමය මැන බලයි:

- ▪මාරු කරන ලද ප්‍රතිෂ්ඨාවෙහි  සාධාරණ වටිනාකම; එකතු කරයි
- ▪හඳුනා ගන්නා ලද අත්පත් කර ගත් තැනැත්තාගේ සුළු කොටස් හිමියන්ගේ අයිතියෙහි ප්‍රමාණය; එකතු කරයි
- ▪ව්‍යාපාර සංයෝජනය අදියර වශයෙන් අත්පත් කරගනු ලැබුවහොත්, අත්පත් කර ගත් තැනැත්තාගේ පෙර පැවති කොටස් වල සාධාරණ වටිනාකම; අඩු
- ▪අත්පත් කරගන්නා ලද  හඳුනාගත හැකි වත්කම්වල සහ උපකල්පිත වගකීම්වල ශුද්ධ පිළිගත් මුදල (සාමාන්‍යයෙන් සාධාරණ වටිනාකම).
- ▪සලකා බලන ලද ප්‍රතිෂ්ඨාව තුළ පෙර පැවති සබඳතා සමථයකට පත් කිරීම සඳහා ගෙවනලද  මුදල් ඇතුළත් නොවේ. එවැනි ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

### 3.1.2 පරිපාලිතයන්

පරිපාලිත ආයතන යනු  සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය විසින් යම් ආයතනයක් 'පාලනය' කරනු ලබන්නේ, එය ආයතනය සමඟ ඇති සම්බන්ධයෙන් විචල්‍ය ප්‍රතිලාභවලට නිරාවරණය වී ඇත්නම් හෝ එයට අයිතිවාසිකම් තිබේ නම් සහ එම ප්‍රතිලාභවලට ආයතනය කෙරෙහි ඇති බලය හරහා බලපෑම් කිරීමට හැකියාව තිබේනම්ය. පරිපාලිත ආයතනවල මූල්‍ය ප්‍රකාශන පාලනය ආරම්භ වන දින සිට පාලනය නතර වන දිනය දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල, පරිපාලිත ආයතනයන්හි ආයෝජන වටිනාකම ඉදිරියට ගෙන යනු ලබන්නේ, පිරිවැයෙන් හානිකරණයක් ඇතොත් එය අඩුකර ශුද්ධ අයකරගත හැකි අගයට වේ.

### 3.1.3 පාලනයට යටත් නොවන අයිතිය

පාලනයට යටත් නොවන අයිතිය (NCT) මනිනු ලබන්නේ අත්පත් කර ගන්නා දිනයේ දී අත්පත් කර ගන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටසෙනි. පාලනය අහිමි වීමට හේතු නොවන අනුබද්ධිත ආයතනයක් සඳහා සමූහයේ අයිතියේ සිදුවන වෙනස්කම් කොටස් ගනුදෙනු ලෙස ගණන් ගිණුම්ගත කරනු  ලැබේ.

### 3.1.4 අහිමි වූ පාලන අයිතිය

සමූහ ව්‍යාපාරයට පරිපාලිත ආයතනයක පාලනය අහිමි වූ විට, එම පරිපාලිත ආයතනයේ වත්කම් සහ වගකීම් ඉවත් කරනු ලබන අතර හිමිකමෙහි කොටසක් වන සුළු කොටස් හිමියන්ගේ අයිතිය හා ඊට අදාළ අනෙකුත් සංරචකද ඉවත් කරනු ලබයි. ඉන් හටගනු  ලබන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභය තුළ හඳුනා ගැනේ. පාලනය අහිමි වූ විට පූර්ව පරිපාලිත ආයතනයේ රඳවා තබා ඇති ඕනෑම වටිනාකමක් සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.
පසුව, රඳවා තබා ගන්නා ලද ඕනෑම වටිනාකමක් එහි ඇති බලපෑම් මට්ටමට අනුව කොටස් ගිණුම්ගත ආයෝජකයෙකු ලෙස හෝ විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කෙරේ.

### 3.1.5 ආශ්‍රිතයන්

ආශ්‍රිතයන් යනු සමූහයට ඔවුන්ගේ මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි නමුත් පාලනයට යටත් නොවන ආයතන වේ. සමූහය විසින් වෙනත් ආයතනයක ඡන්ද බලයෙන් සියයට විස්සක් සහ පනහක් අතර ප්‍රමාණයක් දරන විට සැලකිය යුතු බලපෑමක් පවතිනු ඇතැයි උපකල්පනය කෙරේ.

ආශ්‍රිතයන් සඳහා ගිණුම් තැබීමේදී හිමිකම් ක්‍රමය භාවිතා කරනු ලබන අතර මූලිකව පිරිවැයට හඳුනාගනු ලබයි. (ආයෝජිත හිමිකම් ගිණුම් තැබීම) සමූහය විසින් ආශ්‍රිතයන්ගේ සිදුකරන ලද ආයෝජනයෙහි සමුච්චිත හානිකරණ අලාභ අඩුකල අත්පත් කර ගැනීමේදී හඳුනාගන්නා ලද කීර්තිනාමය ඇතුළත් වේ.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ පෙළගැස්වීමෙන් පසුව, සැලකිය යුතු බලපෑමක් ඇති වන දින සිට සැලකිය යුතු බලපෑමක් නතර වන දිනය දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට සමූහයේ ආදායම් සහ වියදම්වල කොටස සහ කොටස් ගිණුම්ගත ආයෝජකයන්ගේ කොටස් චලනයන් ඇතුළත් වේ,

පාලනය ස්ථාපිත වන තුරු කොටස් ගිණුම්ගත ආයෝජකයන්ගේ අතිරේක කොටස් අත්පත් කර ගැනීමේදී, ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාවට වඩා ශුද්ධ වත්කම වැඩිවන විට කීර්තිනාමය ලෙස හෝ ශුද්ධ වත්කමට වඩා ගෙවනු ලබන ප්‍රතිෂ්ඨාවට වැඩි වන විට ලාභ හෝ කේවල් මිලදී ගැනීමක් ලෙස ගිණුම්ගත කරයි.

කොටස් ගිණුම්ගත ආයෝජකයෙකු සඳහා සමූහයේ පාඩුවේ කොටස එහි අයිතිය ඉක්මවන විට, එම අයිතිය ඉදිරියට ගෙන යාමේ වටිනාකම (ඕනෑම දිගුකාලීන ආයෝජනයක් ඇතුළුව) ශුන්‍යයට අඩු කරන අතර සමූහයට බැඳීමක් ඇති විට හෝ ආයෝජකයා වෙනුවෙන් ගෙවීම් කර ඇති විටදී හැර සමූහයට ඇති ප්‍රමාණයට හැර තවදුරටත් පාඩු හඳුනා ගැනීම නතර කරනු ලැබේ.

### 3.1.6 වාර්තාකරණ දිනය

පරිපාලක හා පරිපාලිත ආයතනයන්වල මූල්‍ය වර්ෂය එකම දිනෙන් එනම් දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන අතර ආශ්‍රිතයෙහි මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. ඉහත සමාගම්වල සහ පරිපාලකයෙහි වාර්තාකරණ දින අතර පවතින වෙනස මාස තුන නොඉක්මවයි.

### 3.1.7 ඒකාබද්ධ කිරීමේදී ඉවත්වන ගනුදෙනු

ආදායම්, වියදම් සහ ලාභාංශ ඇතුළු අන්තර් සමූහ ශේෂයන් සහ ගනුදෙනු සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබේ. තොග සහ ස්ථාවර වත්කම් වැනි වත්කම් තුළින් හඳුනාගනු ලබන අන්තර්-කණ්ඩායම් ගණුදෙණුවලින් ලැබෙන ලාභ සහ අලාභද සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලැබේ.

### 3.2 විදේශ මුදල් ගනුදෙනු

විදේශ මුදලින් සිදුකරන ගනුදෙනු,සමූහ සමාගමේ එම ගණුදෙනුව සිදුවන දිනයේ පවතින ක්‍රියාකාරී මුදලට අදාළ විනිමය අනුපාතිකය මත පදනම්ව පරිවර්තනය කරනු ලැබේ.

## 3.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

### 3.3.1 දේපල පිරියත හා උපකරණ

(අ) හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණ යනු සේවා සැපයීම සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති සහ වසරකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් භාවිතා කිරීමට අපේක්ෂා කරන ස්පෘශ්‍ය අයිතම වේ. වත්කමක් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් හා එම වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් දේපල,පිරියත සහ උපකරණ ලෙස හඳුනාගනු ලබයි.

**(ආ) මැනීම**

දේපල, පිරියත සහ උපකරණවල අයිතම පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණ අලාභ අඩු කළ පසු අගයට සඳහන් කරනු ලබයි.දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය එහි මිලටගත් වටිනාකම සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම දරන ලද පිරිවැය වලින් සමන්විත වේ. පවතින අයිතම විසුරුවා හැරීම හා ඉවත් කිරීමද ඒවා පිහිටා ඇති ස්ථානවල නැවත ප්‍රතිස්ථාපනය කිරීම වෙනුවෙන් දරන ලද පිරිවැය ද මෙයට ඇතුළත් ය. දේපල, පිරියත සහ උපකරණයන්හි කොටස්වල විවිධ ඵලදායී ජීවිතකාලයන් ඇති විට, ඒවා දේපල පිරියත සහ උපකරණවල වෙනම අයිතම ලෙස ගණන් ගනු ලැබේ.

**(ඇ) පසුකාලීන පිරිවැය**

පසුකාලීනව දරන ලද පිරිවැය වත්කමක ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමට ඇතුළත් කර හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලබන්නේ, එම වත්කම හා සම්බන්ධයෙන් හඳුනාගතහැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇති විට හා එම අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විටදී පමණි. දේපල, කම්හල් සහ උපකරණ සම්බන්ධව දෛනිකව දරන සේවා පිරිවැය ලාභ හෝ අලාභය තුළ හඳුනා ගැනේ.

**(ඈ) ඉවත් කිරීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට ඉවත් කිරීමක් ලෙස හඳුනා ගනී. වත්කම් ඉවත් කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ඉවත් කිරීමේ ශුද්ධ ආදායම සහ වත්කමෙහි ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස ලෙස ගණනය කෙරේ) එම වත්කම ඉවත් කළ වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඇතුළත්කරනු ලබයි.

**(ඉ) ක්ෂය කිරීම**

වත්කමක පිරිවැයෙන් එහි ඇස්තමේන්තුගත සුන් බුන් වටිනාකම ඉවත් කළ පසු අගය සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරාවට ලියා හැරීම ක්ෂය ලෙස ගණනය කරනු ලබන අතර එය සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ. මේ තුළින් වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව පිළිබිඹු කරයි.

වත්කමක් ක්ෂය වීම එය භාවිතයට ගෙන ඇති විට ආරම්භ වන අතර එම වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කර ඇති දිනට හෝ වත්කම ඉවත් කරනු ලබන දිනයට පෙර නතර වේ. කල්බදු කාලය අවසන් වන විට සමූහයට හිමිකාරීත්වය ලැබෙනු ඇති බවට සාධාරණ විශ්වාසයක් නොමැති වටදී කල්බදු වත්කම් කල්බදු කාල සීමාව හෝ වත්කමෙහි ඵලදායී ජීව කාලය යන ඒවායින් අඩුම කාලයේදී ක්ෂය ගණනය කරනු ලබයි.

තනි වත්කම්වල සැලකිය යුතු අයිතමයක් ලෙස තක්සේරු කර ඇති විටකදී සහ එම අයිතමයට වත්කමේ ඉතිරි කොටසට වඩා වෙනස් වූ ඵලදායී ආයු කාලයක් තිබේ නම්, එම අයිතමය වෙන වෙනම ක්ෂය කරනු ලැබේ. වත්මන් සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා දේපල,පිරියත සහ උපකරණවල ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

| වත්කම් පන්තිය | ක්ෂය අනුපාතය |
|---|---|
| කුකුළු කොටු ඇතුළු ගොඩනැගිලි | 5%-10% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10%-15% |
| වතු උපකරණ | 5% |
| මෙවලම් හා උපකරණ | 20%-25% |
| ගෘහ භාණ්ඩ,උපකරණ හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 10%-20% |
| පශු සම්පත් කූඩු හා ඉදිකිරීම් | 5% |
| මෝටර් වාහන | 10%-25% |

(ඊ) ප්‍රතිෂ්ඨාපන පිරිවැය

මූලිකව තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නැවත ලබාගැනීමට හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ (ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශයේ) අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම්, දැරූ විට වියදමක් ලෙස පිළිගැනේ.

(උ) කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට දක්වා ඇත. මේවා ප්‍රාග්ධනිත කිරීමට අපේක්ෂාවෙන් සිටින ගොඩනැගිලි, ප්‍රධාන කම්හල් සහ යන්ත්‍රෝපකරණ ඉදිකිරීමේදී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

සමහර සින්නක්කර ඉඩම්වල හිමිකම වෙනස් කිරීම් තවදුරටත් කරගෙන යමින් පවතී. මෙම ගනුදෙනු ප්‍රධාන ආයෝජන ලෙස සලකන බැවින් මෙය දේපල පිරියත සහ උපකරණ යටතේ අනාවරණය කර ඇත. තවද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සිරිංගපාත ගොවිපළේ අක්කර 35ක් අමාත්‍ය මණ්ඩල නියෝගයක් මත මිල්කෝ සමාගම වෙත ලබා දුන් නමුත් ඉඩමේ වටිනාකම හෝ ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන කටයුතු අවසන් කර නොමැත. එබැවින්, සමාලෝචිත වර්ෂයේ ගිණුම් කාල පරිච්ජේදය තුළ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් ඇතුළත් කර නොමැත.

3.3.2 තොග

තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට මනිනු ලබයි.ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාපාරික කටයුතුවලදී ලබාගත හැකි ඇස්තමේන්තුගත විකුණුම් මිලෙන්, ඇස්තමේන්තුගත නිම කිරීමේ පිරිවැය සහ විකුණුම් වියදම්වල පිරිවැය අඩු කළ පසු අගය වේ.

තොගයෙහි පිරිවැය බරිත සාමාන්‍ය පිරිවැය මත පදනම් වන අතර එම තොග අත්පත් කර ගැනීම සහ ඒවායෙහි පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදම්ද ඇතුළත් වේ.
ගිණුම්කරණ මෘදුකාංග පැකේජය හා සම්බන්ධව සැලකීමේදී, කිරි ව්‍යාපෘතිය යටතේ ඇති තොග අයිතමවල විෂමතා ඇත. මේ සම්බන්ධයෙන් 2017 වර්ෂය තුළ රු.1,841,169.04 ක් උපලබ්ධි නොවූ තොග ගිණුමකට මාරු කර ඇත.2017දෙසැම්බර් 31 දිනට කිරි ව්‍යාපෘතියට අදාළ සමථයකට පත් නොවූ තොගයේ ශේෂය රු. 21,329,925.86 කි.

3.3.3 ජීව විද්‍යාත්මක වත්කම්

ජීව විද්‍යාත්මක වත්කම් වසර අවසානයේදී ඒවායේ සාධාරණ වටිනාකමින් විකිණීමේදී දරන ලද වියදම් අඩු කල පසු අගයට මනිනු ලබයි. මූලික හඳුනාගැනීම් මත සහ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කළ අගයෙහි වෙනස්වීම් හේතුවෙන් ඇතිවන ඕනෑම ප්‍රතිඵලයක් එනම් ලාභයක් හෝ අලාභයක්, එය හටගනු ලබන කාල පරිච්ඡේදය තුළ ලාභය හෝ අලාභයට අය කරනු ලබයි.

සමූහයේ ජීව විද්‍යාත්මක වත්කම් අගයකර දක්වා ඇත. මෙය ජීව විද්‍යා ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ සහාය ඇතිව සමූහය විසින් සකස් කරන ලද ක්‍රමවේදයක් සහ සූත්‍රයක් මත පදනම් වන අතර එමඟින් ජීව විද්‍යාත්මක වත්කම් සඳහා වෙළඳපොළට ආසන්න සාධාරණ වටිනාකමක් අපේක්ෂා කරන අතර සාරාංශයගත සැසඳුම් ප්‍රකාශනයේ ඉදිරියට ගෙන යන කිරි නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳව 11වන පශු සම්පත් සටහනෙහි හි දක්වා ඇත.

(අ) පොල් ව්‍යාපෘති

පොල් ව්‍යාපෘතියෙහි නව රෝපණය හා යටි වගාව යටතේ දරන ලද වියදම් රෝපණය හා වාණිජ අස්වනු නෙළීම අතර වසර හතක කාල පරාසය සැලකිල්ලට ගනිමින් ප්‍රාග්ධනිත කර ඇත. වාණිජ අස්වනු නෙළීම ආරම්භ කර වසර 35ක් තුළ කපා හැරීම සිදු කෙරේ. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස ගිණුම්වල පෙන්නුම් කරන අවසන් තොගයෙන් පොල් නරක් වීම වෙනුවෙන් 3% ක අඩු කිරීමක් අඛණ්ඩව සිදු කරනු ලබයි.

(ආ) තෘණ සංවර්ධනය

තෘණබිම් සංවර්ධන වියදම් රෝපණය හා අස්වනු නෙලන කාලය අතර මාස පහක කාල පරාසය සැලකිල්ලට ගනිමින් ප්‍රාග්ධනිත කරන අතර වසර හතරක කාලයක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

**(ඇ) මේරූ වගාවන්**

**වගාවන් ස්ථාපනය කිරීමේ පිරිවැය සහ පරිණත අවධිය දක්වා දරන ලද වියදම් වත්මන් මූල්‍ය කාලපරිච්ඡේදයේ සිට ක්‍රමක්ෂ කිරීමේ පිරිවැය අඩුකිරීමෙන් පසු ප්‍රාග්ධනීත කරනු ලබයි.**

**ජීව විද්‍යාත්මක වත්කම් මැනීම**
**සමූහයේ ජීව විද්‍යාත්මක වත්කම් පහත සඳහන් නිර්ණායක මත මනිනු ලැබේ.**

**(අ) කුකුළු මස් හැර වෙනත් සතුන්**

**කුකුළු මස් හැර අනෙකුත් සතුන් පහත සඳහන් සාධක සැලකිල්ලට ගනිමින් මණ්ඩලය විසින් තීරණය කරන ලද සම්මත අනුපාතයකට තක්සේරු කෙරේ.**

1. **සජීවී බර**
2. **කිරි දෙන අංකය.**
3. **කිරි නිෂ්පාදනය**
4. **ගැබ් ගැනීම**
5. **ජානමය අගය**

**බැටළුවන්, එළුවන්, ඌරන් සහ හාවුන් සජීවී බර, ජානමය වටිනාකම සහ ගැබ් ගැනීම මත පදනම්ව සම්මත අනුපාතයන්ට අනුව අගය කරනු ලැබේ. තවදුරටත් භාවිතයට ගත නොහැකි සියළු සතුන් බර මත පදනම්ව සම්මත මිල ගණන් යටතේ අගය කරනු ලැබේ. SLPDC හි ගව තොගය සජීවී බරෙහි වෙළඳපල මිලෙන් dress බර ගැලපුම් කිරීමෙන් පසු වටිනාකමට අගය කරයි.**

**(අ) අභිජනන හා වාණිජ කුකුළන්**

**එන්එල්ඩීබී හි අභිජනන හා කිකිළි කාණ්ඩයන්ගෙන් බිත්තර දැමීම ආරම්භ කර ඇති කිකිළියන්ගේ වටිනාකම එම අවස්ථාව දක්වා දරන ලද වියදම් වලින් ක්‍රමක්ෂය අඩුකල පසුවටිනාකමට අගය කරනු ලබන අතර වර්ධනය වන කිකිළියන් කාණ්ඩයෙහි වටිනාකම ඒ වන තෙක් දරන ලද පිරිවැයට අගය කරනු ලබයි. කාලසීමාව සඳහා ක්‍රමක්ෂ කිරීම සහ වර්ධනය වන ස්ථර කාණ්ඩ මේ දක්වා දරන ලද සැබෑ පිරිවැයට තක්සේරු කෙරේ. SLPDC විසින් වාණිජ කුකුළන් පිරිවැයෙන් ක්‍ෂය අඩුකල පසු වටිනාකමට අගය කරයි. මෙම පිරිවැයට වයසක කුරුල්ලන්ගේ දවසේ මූලික පිරිවැය, ආහාර එන්නත් සහ පළමු මාස හය (සති 26) සඳහා ඖෂධ පිරිවැය ඇතුළත් වේ.**

**(ආ) අභිජනන බිත්තර (අභිජනන බිත්තර)**

**NLDB විසින් පහත සූත්‍රය භාවිතා කරමින් අභිජනන බිත්තර පිරිවැය අගය කරනු ලැබේ. මුළු පිරිවැය වසර තුළ නිපදවන ලද පැටවුන් බිහි කළ හැකි බිත්තර සංඛ්‍යාවෙන් බෙදනු ලැබේ. මෙම සම්පූර්ණ පිරිවැයට ආහාරවල පිරිවැය, සෘජු වැටුප් සහ ක්ෂයවීම් ගාස්තු ඇතුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ඇතුළත් වේ.**

**වානිජ කුකුළු බිත්තර**

**වාණිජ කුකුළු බිත්තර උපලබ්දි කර ගත් මිලට අගය කරනු ලැබේ.**

**බී. බ්‍රොයිලර් සහ ස්ථර නොමේරූ තොගය-පිරිවැයට මනිනු ලබයි.**
**බී. සීතල කාමරයේ තබන ලද බිරොයිලර් - උපලබ්දි වටිනාකමට මනිනු ලබයි.**
**a. පොල් හා කෘෂිකාර්මික නිෂ්පාදන - උපලබ්දි වටිනාකමට මනිනු ලබයි**
**b. අඟුරු උපලබ්දි වටිනාකමෙන් 50%ක් මත මනිනු ලබයි**

**(C) වෙනත් තොග**
**අනෙකුත් සියලුම තොග පිරිවාය හෝ ශුද්ධ උපලබ්දි අගයෙන් අඩු අගයට අගය කරනු ලබයි.**
**මණ්ඩලයේ ප්‍රතිපත්ති තීරණයක් ලෙස ගවයින්, මී හරකුන්, එළුවන්, ඌරන් සහ බැටළුවන්ගේ ජීව විද්‍යාත්මක වටිනාකම මත වාර්ෂිකව 10% ප්‍රතිපාදන සලසා ඇත.**

### 3.3.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමූහ ව්‍යාපාරයේ මූල්‍ය නොවන වත්කම්වල ඉදිරියට ගෙන යන ප්‍රමාණයන් පිළිබඳව එක් එක් වාර්තා කරන දිනයන්හිදී හානිකරණය සඳහා යම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා සමාලෝචනය කරනු ලබයි.එවැනි කිසියම් ඇඟවීමක් පවතී නම්, වත්කමෙහි නැවත ලබාගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලබයි.

වත්කමක ඉදිරියට ගෙන යන වටිනාකම හෝ එහි මුදල් උත්පාදනය කිරීමේ ඒකකයට වඩා අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන්නේ නම්, හානිකරණ අලාභයක් ලෙස හඳුනා ගැනේ. මුදල් උත්පාදන ඒකකයක් යනු වෙනත් වත්කම් සහ කණ්ඩායම් වලින් බොහෝ දුරට ස්වාධීන වන මුදල් ප්‍රවාහයන් ජනනය කරන කුඩාම හඳුනාගත හැකි වත්කම් සමූහය වේ.

වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක අයකරගත හැකි පවටිනාකම වන්නේ භාවිතයේ ඇති වටිනාකම හා එහි සාධාරණ වටිනාකමෙන් විකිණීමට වැයවන පිරිවැය අඩුකල පසු අගයෙන් වැඩි අගයයි. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට අගය කරනු ලබන්නේ, මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන පූර්ව බදු අනුපාතයක් භාවිතා කරමිනි. හානිකරණ අලාභයලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

### 3.3.5 මූල්‍ය උපකරණ

#### 3.3.5.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු වන විට සමූහය එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කමක් හඳුනා ගනී. සමූහය ණය සහ ලැබිය යුතු මුදල් සහ නිකුත්කරන ලද තැන්පතු ඒවා ආරම්භ කල දිනයේ දී මුලිකව හඳුනා ගනී.

මූල්‍ය වත්කම තුලින් වලින් මුදල් ප්‍රවාහයක් ලබා ගැනීමේ ගිවිසුම්ගත අයිතිය නොමැති වූ විට හෝ පසුව එම මූල්‍ය වත්කම තුළින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට පවතින හිමිකාරත්වයෙහි අවධානම් හා ප්‍රතිලාභ මාරු කර ඇති විටකදී හෝ හිමිකාරීත්වයේ අවධානම් හෝ ප්‍රතිලාභ මාරු කර නොමැති වුවද පවරන ලැබූ වත්කමෙහි පාලනය හිමි නොවන විට සමූහය විසින් මූල්‍ය වත්කම හඳුනා නොගනී.
මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලබන්නේ සමූහයට එම මුදල් පියවීමට නෛතික අයිතියක් ඇති විට සහ ඒවා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම සාක්ෂාත් කර ගැනීමට අදහස් කරන විට පමණි.
සමූහයට පහත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇත: ණය සහ ලැබිය යුතු මුදල් සහ කල් පිරීමට තබා ඇති ආයෝජන.

a. ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළඳපොලෙහි සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. එවැනි වත්කම් මූලිකව එහි සාධාරණ වටිනාකමට සහ සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය එකතු කර හඳුනා ගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, ණය සහ ලැබිය යුතු මුදල් හානිකරණ අලාභ අඩු කර සඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්‍ෂ කුමයට මනිනු ලබයි. ණය සහ ලැබිය යුතු දේ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්, අදාළ සමාගම්වලින් ගෙවිය යුතු මුදල් සහ මුදල් හා මුදල් සමාන දෑ වලින් සමන්විත වේ.

කෙසේ වෙතත්, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය එවැනි අයිතම සාධාරණ වටිනාකමක් යටතේ ගිණුම්කරණය සඳහා රාජ්‍ය අංශයේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ එකඟතාවයකට පැමිණෙන තෙක් ගිවිසුම්ගත ප්‍රමාණයට සේවක ණය වාර්තා කිරීම සහ ඉදිරිපත් කිරීම දිගටම කරගෙන යයි.
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙ හි ප්‍රතිපත්තිය ලෙස, බොල් ණය ප්‍රතිපාදන පහත පරිදි සිදු කෙරේ:

| | |
|---|---|
| වසර 05ට වැඩි | 100% |
| වසර 3-5 | 50% |
| වසර 1-3 | 20% |
| වර්ෂය තුළදී | 2% |

ඉකල් පිරීම දක්වා තබා ගන්නා මූල්‍ය වත්කම්

කල්පිරීම දක්වා තබා ගන්නා මූල්‍ය වත්කම්,මූලිකව සැලකිය යුතු ගනුදෙනු පිරිවැයක් පවතී නම් සෘජුව ආරෝපණය කළ හැකි ඕනෑම ගනුදෙනු පිරිවැයක් එකතු කර සාධාරණ වටිනාකමට හඳුනා ගැනේ. මූලික හඳුනාග ැනීම් වලින් පසුව කල්පිරීම දක්වා තබා ගන්නා මූල්‍ය වත්කම් හානිකරණ අලාභ අඩු කර සඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ ක්‍රමය මත මනිනු ලැබේ. ස්ථාවර තැන්පතු ආයෝජන කල්පිරීම දක්වා තබා ගන්නා මූල්‍ය වත්කම් යටතේ වර්ගීකරණය කර ඇත.

3.3.5.2 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අඩපණ වී ඇති බවට කිසියම් වෛෂයික සාක්ෂි තිබේද යන්න (NLDB) සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරන අතර, එවැනි හානියක් සිදුවී ඇත්නම්, එම හානිය ගණනය කරනු ලබන්නේ වත්කම් දරණ ප්‍රමාණය සහ වර්තමාන වටිනාකම අතර වෙනස ලබා ගැනීමෙනි. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්රවාහයන් කපා හැරීම.

3.3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ තුළට බැංකු මුදල් සහ කෙටි කාලීන තැන්පතුවල මුදල් ඇතුළත් වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි අරමුණින් සහ සමූහයේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරාව මුදල් සහ මුදල් සමාන දෑ හි අංගයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් වේ. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන, එනම් අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

3.3.7 ප්‍රදාන
3.3.7.1 ප්‍රදාන සඳහා ගිණුම්තැබීම

සමූහය විසින් දරන ලද වියදම් සඳහා ලබා දෙන වන්දියක් වශයෙන් ප්‍රදාන විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ආදායමක් ලෙස හඳුනාගන්නා අතර දරන ලද වියදම් ද එම කාල සීමාව තුළම හඳුනා ගැනේ. වත්කමක පිරිවැය සඳහා සමූහයට ලබාදුන් ප්‍රදාන අදාළ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමානුකූල පදනමක් මත විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

3.3.8වගකීම් හා වෙන්කිරීම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීමට හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කළ දින සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත. ප්‍රතිපාදන සහ වගකීම් යනු අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස හටගන්නා ලද සමූහයට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමේ සම්භාවිතාවක් අවශ්‍ය වන දෑ ලෙස පිළිගනු ලබයි.

වෙලාඩි ණය මහා භාණ්ඩාගාරයේ කොටස් ආයෝජනයක් ලෙස පරිවර්තනය කිරීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශ නියෝජිතයන් සමඟ සාකච්ඡා පවත්වමින් සිටියද, ඒ දක්වා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි ගිණුම් පොත්වල ණය පොලී වෙනුවෙන් ප්‍රතිපාදනය කර ඇත. තවද, මෙම ණය මුදල විදේශ මුදලින්(USD) භාණ්ඩාගාරය විසින් විදේශ ණය දෙන ආයතනයකින් ලබාගෙන ඇතත්, මුදල් උච්චාවචන ගැලපුම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොමැති අතර, එය තවදුරටත් මූල්‍ය වගකීමක් ඇති කරයි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය එකතු කළ අගය බද්දට (VAT) වගකිව යුතු අතර එකතු කළ අගය පනතේ විධිවිධානවලට අනුකූල වේ. ගෙවිය යුතු හෝ අයකරගත හැකි එකතු කළ බදු අගයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පිළිබිඹු වේ.

### 3.3.9 සේවක ප්‍රතිලාභ

(අ) විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

සුදුසුකම් ලත් සියලුම සේවකයින් සඳහා (1983 අංක 12) දරන පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ අවශ්‍ය පරිදි ප්‍රතිලාභ සැලැස්ම සමූහය විසින් සම්මත කර ඇත. ප්‍රතිලාභ සැලැස්ම අරමුදල් රහිත ය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 19 සේවක ප්‍රතිලාභවල මගපෙන්වීම සැලකිල්ලට ගනිමින් සමූහය විසින් පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් රඳා පවතින විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ඇස්තමේන්තු කරයි.

පහත සඳහන් ප්‍රධාන උපකල්පන භාවිතා කරමින් සියලුම ගණනය කිරීම්. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 19 හි නියම කර ඇති සූත්‍ර ක්‍රමය මත සිදු කර ඇත

පැවැත්ම : NLDB සඳහා අඛණ්ඩ පැවැත්මක් ඇත
පොලී අනුපාතය : 11.5%
වැටුප් වර්ධක අනුපාතය : 5.5%
විශ්‍රාමයාමේ වයස : වසර 55
සේවක පිරිවැටුම් අනුපාතය : 1.0%

මණ්ඩලයෙහි ගණනය කිරීමේ සාරාංශය පහත වේ .

2016.12.31 ට පාරිතෝෂික ගණනය කිරීමේ සාරාංශය

| අනු අං. | ආරම්භක ශේෂය | වසර සඳහා අයකිරීම් | පොලිය | ගෙවීම් | ලාභ/අලාභ | අවසන් ශේෂය |
|---|---|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. |
| 1 | 22,685,800 | 1,298,935 | 2,608,867 | (2,629,682) | (1,144,046) | 22,819,874 |
| 2 | 16,128,535 | 1,023,575 | 1,854,781 | (1,341,442) | (635,252) | 17,030,197 |
| 3 | 16,507,931 | 998,886 | 1,898,412 | (3,473,237) | (1,570,080) | 14,361,912 |
| 4 | 19,061,650 | 1,241,821 | 2,192,090 | (2,221,422) | (352,015) | 19,922,124 |
| 5 | 13,020,570 | 802,128 | 1,497,365 | (751,800) | (2,327,822) | 12,240,441 |
| 6 | 12,703,917 | 814,018 | ,460,950 | (2,074,259) | (881,584) | 12,023,041 |
| 7 | 15,636,985 | 908,915 | 1,798,253 | (1,744,161) | (1,416,714) | 15,183,276 |
| 8 | 18,996,955 | 1,198,557 | 2,184,650 | (2,372,105) | (150,376) | 19,857,681 |
| 9 | 19,534,107 | 1,302,234 | 2,246,422 | (1,978,959) | (252,335) | 20,851,469 |
| 10 | 11,959,511 | 987,809 | 1,375,344 | (290,430) | (435,136) | 13,597,098 |
| 11 | 23,599,677 | 1,452,117 | 2,713,963 | (3,573,660) | (1,833,399) | 22,358,698 |
| | **189,835,638** | **12,028,995** | **21,831,097** | **(22,451,157)** | **(10,998,759)** | **190,245,814** |

**පාරිතෝෂික ගණනය කිරීමේ සාරාංශය - 31.12.2017**

| අනු අං | ආරම්භක ශේෂය | වසර සඳහා අයකිරීම් | පොලිය | ගෙවීම් | ලාභ/අලාභ | අවසන් ශේෂය |
|---|---|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. | Rs. | Rs. |
| 1 | 22,819,874 | 1,417,954 | 2,624,286 | (2,334,822) | 1,450,144 | 25,977,435 |
| 2 | 17,030,197 | 1,083,934 | 1,958,473 | (1,592,288) | (124,266) | 18,356,051 |
| 3 | 14,361,912 | 811,709 | 1,651,620 | (1,502,793) | (2,513,719) | 12,808,729 |
| 4 | 19,922,124 | 1,219,312 | 2,291,044 | (3,545,735) | 130,361 | 20,017,106 |
| 5 | 12,240,443 | 594,199 | 1,407,651 | (3,548,623) | (2,097,384) | 8,596,286 |
| 6 | 12,023,041 | 803,584 | 1,382,650 | (1,398,360) | (1,483,128) | 11,327,787 |
| 7 | 15,183,276 | 832,884 | 1,746,077 | (3,548,764) | (664,739) | 13,548,734 |
| 8 | 19,857,682 | 1,121,916 | 2,283,633 | (3,988,008) | (1,681,245) | 17,593,978 |
| 9 | 20,851,469 | 1,194,648 | 2,397,919 | (3,332,173) | (689,324) | 20,422,539 |
| 10 | 13,597,098 | 1,049,803 | 1,563,666 | (886,494) | (1,687,821) | 13,636,253 |
| 11 | 22,358,698 | 1,393,600 | 2,571,250 | (1,995,275) | (2,164,830) | 22,163,443 |
| | **190,245,814** | **11,523,543** | **21,878,269** | **(27,673,334)** | **(11,525,951)** | **184,448,341** |

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්**

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත්-රැකියා සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවන අතර තවත් මුදලක් ගෙවීමට නීතිමය හෝ සාධනීය වගකීමක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා වන දායක මුදල් සඳහා බැඳීම්, ඒවා නියමිත වේලාවට සහ සම්පූර්ණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

**(ඇ) සේවක අර්ථසාධක අරමුදල**

සමූහයෙහි ආයතන සහ සේවකයන් එක් එක් සේවකයාගේ මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව මත පිළිවෙලින් 12% සහ 10% බැගින් සේවක අර්ථසාධක අරමුදලට දායක වේ.

**(ඈ) සේවක භාරකාර අරමුදල**

සමූහයෙහි ආයතන විසින් එක් එක් සේවකයාගේ මූලික වැටුප සහ ජීවන වියදම් දීමනාව මත 3%ක් සේවක භාරකාර අරමුදලට දායක වේ.
ඊපීඑෆ්, ඊටීඑෆ් සහ ඊඑස්පීඑස් වගකීම් සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 80.2 හිඟ මුදලක් තිබේ. එයින් රුපියල් මිලියන 12.70 ක් 2017 මුදල් වර්ෂය තුළ ගෙවීම් කර ඇත.

**3.3.10 බදු හා ආයෝජන දේපල**

**3.3.10.1 බදු දේපල**

කල්බදු දේපල සඳහා හෝ වැඩිදියුණු කිරීමේ පිරිවැය ප්‍රාග්ධනිත කර, කල්බදු වැඩිදියුණු කිරීම් ලෙස අනාවරණය කර, කල් ඉකුත් නොවූ කල්බදු කාලය හෝ වැඩිදියුණු කිරීම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය යන දෙකෙන් අඩු කාලය මත පදනම්ව ක්ෂය කරනු ලැබේ. එන්එල්ඩීබී විසින් ලංකා බැංකුවෙන් මූල්‍ය කල්බදු පදනම මත චංචල වත්කම් ලබාගෙන ඇති අතර එම සියලුම චංචල වත්කම් වසර පහක කාලයක් සඳහා බදු දී ඇත. එන්එල්ඩීබී පහත සඳහන් නිශ්චල දේපල සමහරක් වසර 30 සහ 99 බදු කාල සීමාවන් සඳහා එහි තෙවන පාර්ශ-වයන්ට බදු දී ඇත.

1. බ්‍රාන්ඩික්ස් ඉන්ටිමේට් කම්පැණි ලිමිටඩ්. - (පර්චස් 31ක් වසර 30ක් සඳහා බදු)
2. රාජවෙල ඉඩම - අක්කර 517 ක් වසර 99ක් සඳහා බදු

ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහ ණය දෙන ආයතනවලින් මූල්‍ය ණය ගැනීම් ලබා ගත හැකි වන පරිදි යහපත් අනුපාතයක් පවත්වා ගැනීමට ය.

99 වසරක බදු පදනම මත අනුබද්ධ සමාගමට (SLPDC) ලබා දුන් ඉඩම සඳහා NLDB වෙත කල්බදු කුලී වශයෙන් අත්තිකාරම් මුදලක් ලබා දෙන ලදී. මෙම ශේෂය විවිධ කල්බදු අදායම් යටතේ පෙන්වා ඇති අතර, කොටස් තක්සේරු කිරීමේදී මෙම ගෙවීම සැලකිල්ලට ගත් බැවින් හිඟ මුදල අනුබද්ධ ගිණුමේ ආයෝජනය වෙත මාරු කරන ලදී.

3.3.10.2 ආයෝජන දේපල

ආයෝජන දේපල මූලිකව ගණුදෙණු වියදම් ඇතුළුව පිරිවැයට මිනිනු ලබයි. හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, එම පිරිවැය දරන අවස්ථාවේ පවතින ආයෝජන දේපලක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඉදිරියට ගෙන යන වටිනාකමට ඇතුළත් වන අතර එම ආයෝජන දේපලෙහි දෛනික සේවා කිරීමේ පිරිවැය අන්තර්ගත නොකෙරේ.
මූලික හඳුනාගැනීමෙන් පසුව, සමූහය විසින් ඔවුන්ගේ සියලුම ආයෝජන දේපල, විකිණීම සඳහා තබා ඇති දෑ යන වර්ගීකරණයෙහි නිර්ණායක සපුරාලන අවස්ථාවන්හිදී හැර දේපල, පිරියත සහ උපකරණ සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 අනුව මිනුම් කරනු ලබයි.
ආයෝජන දේපල ඉවත් කර ඇති විට හෝ ආයෝජන දේපල භාවිතයෙන් ස්ථිරවම ඉවත් වූ විට සහ එය බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට ආයෝජන දේපල හඳුනා නොගනී. ආයෝජන දේපලක් අවසන් වීමේදී හෝ බැහැර කිරීමේදී හඳුනා ගන්නා ලද යම් ලාභ සහ අලාභයන් බැහැර කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

3.3.11 හිමිකම

NLDB විසින් ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන සංචිත සහ ආදායම් සංචිත ගොඩනගා ගෙන ඇත්තේ එහි කොටස් ප්‍රතිපාදන ශක්තිමත් කිරීමට සහ ණය දෙන ආයතනවලින් මූල්‍ය ණය ගැනීම් ලබා ගත හැකි වන පරිදි යහපත් අනුපාතයක් පවත්වා ගැනීමට ය.

3.4 ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

3.4.1 ආදායම් හදුනාගැනීම

සමූහය විසින් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතාව සහ එය විශ්වාසදායක ලෙස මැනිමේ හැකියාව මත ආදායම හඳුනාගෙන ඇත. ආදායම මිනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂධාවෙන් වෙළඳ වට්ටම් සහ විකුණුම් බදුවල වටිනාකම අඩුකර සාධාරණ වටිනාකම අනුව ය.
ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

3.4.1.1 භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමෙන් ප්‍රතිලාභ සහ දීමනාවල අඩුකල පසු අගයට මිනිනු ලබයි. සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභයන්ගේ හිමිකාරීත්වය ගැනුම්කරුට මාරු කරීමේදී ප්‍රතිෂ්ඨාව ආවරණය කර ගැනීමේ සම්භාවිතාවක් පවතින විට, භාණ්ඩ වලට අදාල ඒ ආශ්‍රිත පිරිවැය සහලැවිය හැකි ප්‍රතිලාභ ලබා දීම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකි නම් සහ තවදුරටත් මෙම භාණ්ඩ සම්බන්ධයෙන් අඛණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් නොමැති විට ආදායම හඳුනා ගැනේ. ඉන්වොයිස් වටිනාකමෙන් තැරැව්කාර ගාස්තු, විකුණුම් වියදම් සහ ආදායමට අදාළ අනෙකුත් බදු අඩුකල පසු වටිනාකමට ආදායම හඳුනා ගැනේ.

ගොවිපල නිෂ්පාදන විකුණුම්

හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත පැවරූ විට විකුණුම් හඳුනා ගැනේ.

3.4.1.2 ලාභාංශ ආදායම

කොටස් හිමියාගේ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කර ඇති විට ආයෝජන වලින් ලැබෙන ලාභාංශ ආදායම පිළිගනු ලැබේ.

#### 3.4.1.3 කුලී ආදායම

කුලී ආදායම උපචිත පදනම මත ලාභ හා අලාභ තුළ හඳුනා ගැනේ.

#### 3.4.1.4 පොලී ආදායම

පොලී ආදායම උපචිත පදනම මත සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හා අලාභ තුළ හඳුනා ගැනේ.

#### 3.4.2වෙනත් මෙහෙයුම් ආදායම්

දේපල, පිරියත සහ උපකරණඉවත් කිරීමේ ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් ආදායමෙන් ඉදිරියට ගෙන යනු ලබන මුදල සමඟ සංසන්දනය කිරීමෙනි. මේවා ලාභ අලාභවලට ඇතුළත් වේ.

#### 3.4.3 ජීව විද්‍යාත්මත වත්කම්හි සාධාරණ අගය වෙන්කිරීම්

ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් හේතුවෙන් හටගන්නා ලාභ හෝ අලාභ ලාභඅලාභ ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

#### 3.4.4 රාජ්‍ය ප්‍රදාන

ආයතනයේ අරමුණ ලෙස ප්‍රධාන වශයෙන් දේශීය ගොවීන් වෙත සහන මිලට පශු සම්පත් සහ අභිජනන ද්‍රව්‍ය නිකුත් කිරීමට එන්එල්ඩීබී හට බලකෙරෙන බැවින් ආදායම් ප්‍රවේශය යටතේ සලකා බැලිය හැකි සංවර්ධන ක්‍රියාකාරකම්වලට අදාළ රජයේ ප්‍රදාන වශයෙන් ගණනය කෙරේ.

#### 3.4.5 ණය ගැණුම් පිරිවැය

ණය ගැනීම් පිරිවැය, ඒවා දරනු ලබන කාල සීමාව තුළ වියදමක් ලෙස හඳුනා ගැනෙන අතර අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගත වන සුදුසුකම්ලත් වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා වන සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය එම වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරයි.

ප්‍රාග්ධනීකරණය නොකරන ලද ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාල සීමාව තුළ වියදම් ලෙස හඳුනාගෙන ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් කෙරේ.
ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැය වටිනාකම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 23 ණය ගැනීමේ පිරිවැය' අනුව තීරණය වේ.

#### 3.4.6 මූල්‍ය වියදම්

මූල්‍ය පිරිවැයට ණය ගැනීම් සඳහා වන පොලී වියදම් සහ අයිරා සඳහා වන පොලී ඇතුළත් වේ.
සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ නොහැකි ණය ගැනීමේ පිරිවැය සඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හෝ අලාභ හඳුනා ගැනේ.

#### 3.4.7ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම වත්මන් සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම ව්‍යාපාර සංයෝජනයකට හෝ හිමිකමෙහි කොටසක් වශයෙන් සෘජුවම පිළිගත් අයිතමවලට හෝ වෙනත් විස්තීරණ ආදායමකට අදාළ ප්‍රමාණයට හැර ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

**(අ) වත්මන් බදු වියදම**

බදුකරණය සඳහා වෙන්කිරීම් බදු සඳහා ගලපන ලද වර්ෂය සඳහා වන ලාභය මතය පදනම්ව 2006 අංක 10දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඊට කරන ලද සංශෝධන මත සිදු කරයි.

වත්මන් බද්ද වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බද්ද සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු හෝ ලැබිය යුතු බදු සඳහා යම් ගැලපීම් වලින් සමන්විත වේ. එය මනිනු ලබන්නේ වාර්තා කරන දිනයේ පනවන ලද හෝ පසුව පනවන ලද බදු අනුපාත භාවිතා කරමිනි. වත්මන් බද්දට ලාභාංශ වලින් පැන නගින ඕනෑම බද්දක් ද ඇතුළත් වේ. වත්මන් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලබන්නේ යම් නිර්ණායක සපුරා ඇත්නම් පමණි.

බදු ගණනයට අනුව බදු ගෙවිය හැකි ආදායම එන්එල්ඩීබී සඳහා ශුන්‍ය වන බැවින් ආදායම් බදු සඳහා ප්‍රතිපාදන මූල්‍ය වර්ෂය තුළ සපයා නොමැත.

ආර්ථික සේවා ගාස්තු ප්‍රධාන ආදායම් බදු වගකීමට හිලව් කල හැක. එන්එල්ඩීබී කිසිදු ආදායම් බදු වගකීමකට බැඳී නොසිටින බැවින්, ආර්ථික සේවා ගාස්තු ආදායම්හි වියදමක් ලෙස සැලකිය යුතුය. 2011 වසර දක්වා ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු රු.17,494,747ක් 2015 මුදල් වර්ෂයේ වියදම් ලෙස ලියාහැර ඇත.

**(ආ) විලම්බිත බදු**

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම්හි ඉදිරියට ගෙනයන ප්‍රමාණයන් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්භිත බදු හඳුනාගෙන ඇත.

විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ වත්කම් භාවිතා කරමින් අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට පමණි. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය ලබා ගැනීමට තවදුරටත් සම්භාවිතාවක් නොමැති තරමට අඩු කරනු ලැබේ.

හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම නැවත තක්සේරු කරනු ලබන අතර ඒවා භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට හඳුනා ගැනේ.

විලම්බිත බද්ද මනිනු ලබන්නේ ඒවා ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් සඳහා යෙදවීමට අපේක්ෂා කරන බදු අනුපාතවලින්, වාර්තා කරන දිනයේ පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත භාවිතා කරමිනි.. විලම්බිත බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලබන්නේ යම් නිර්ණායක සපුරා ඇත්නම් පමණි.
ශේෂ පත්‍රයේ දිනය වන විට වෙනස් බදු වගකීමක් හඳුනාගෙන නොමැත. මෙය සමුච්චිත බදු පාඩු හේතුවෙන්, එන්එල්ඩීබී විලම්බිත බදු වත්කම් හඳුනා නොගනී.

**3.5 පසු සිදුවීම්**

සියලුම තොරතුරු පසු වාර්තා කිරීමේ සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.
මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක ගැලපීම හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන කිසිදු තත්වයක් වාර්තා කළ දින සිට මතු වී නොමැත.

**3.6 ආංශික වාර්තාකරණය**

අංශයක් යනු අනෙකුත් අංශ වලට වඩා වෙනස් අවදානම් සහ ප්‍රතිලාභ වලට යටත් අදාළ නිෂ්පාදන හෝ සේවා සැපයීමේ (ව්‍යාපාරික අංශය) හෝ යම් ආර්ථික පරිසරයක් තුළ (භූගෝලීය අංශය) නිෂ්පාදන හෝ සේවා සැපයීමේ යෙදී සිටින සමූහයේ කැපී පෙනෙන සංරචකයකි.
එන්එල්ඩීබී මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ විමධ්‍යගත ගිණුම්කරණ පද්ධතියක් සමඟින් වන අතර එහිදී එක් එක් ගොවිපල මෙහෙයුම් අංශයක් ලෙස සැලකේ. එබැවින් ලාභ හා අලාභ ප්‍රකාශය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සැකසීමේදී සෑම මෙහෙයුම් අංශයක්ම සැලකිල්ලට ගනී.

### 3.7 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මිලක් අය කරන්නේද යන්න නොසලකා, එක් පාර්ශ්වයකට අනෙක් පාර්ශ්වයේ මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති /තීරණ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් පාලනය කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් අනාවරණය කර ඇත.

NLDB හි අධ්‍යක්ෂවරුන් කිසිවකුට වාර්තා කරන දිනට මණ්ඩලය සමඟ කොන්ත්‍රාත්තු සහ හෝ යෝජිත කොන්ත්‍රාත්තු ගැන උනන්දුවක් නොතිබුණි.

NLDB හි පූර්ණ අනුබද්ධ සමාගමේ සභාපතිවරයා ද වන සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපතිවරයාට භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව මාසික දීමනාවක් ගෙවනු ලබන අතර එන්එල්ඩීබී සම්බන්ධ කිසිදු සමාගමකින් ඔවුන්ට වෙනත් ගෙවීමක් සිදු නොකෙරේ.

සහභාගී වූ දින සඳහා ප්‍රවාහන දීමනාවක් සමඟ පහත සාමාජිකයින්ට මණ්ඩල ගාස්තු, විගණන සහ කළමනාකරණ ගාස්තු ගෙවනු ලැබේ:

1) ඒ.ජී.නිශාන්ත මහතා
2) ඒ.පුංචිහේවා මහතා
3) සුමිත් වීරසූරිය මහතා
4) කේ.කේ.වනස්ජී මහතා

### 3.8සංසන්දනාත්මක තොරතුරු

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යෙදී ඇති අතර වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය සෑම තැනකම නැවත සකස් කර ඇති පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩවලට අනුකූල වේ.

### 3.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -7 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' අනුව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ 'වක්‍ර ක්‍රමය' භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත. මුදල් සහ මුදල් සමාන දෑ කෙටි කාලීන, ඉතා ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වන අතර ඒවා ව්‍යවහාර මුදල් වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ වෙනස්වීම් වල නොසැලකිය යුතු අවදානමකට යටත් වේ.
ගෙවන පොලිය මෙහෙයුම් මුදල් ප්‍රවාහය ලෙසත් ලැබෙන පොලිය ආයෝජන මුදල් ප්‍රවාහය ලෙසත් වර්ග කෙරේ.

### 3.10 භාවිතාකරන ලද නිදහස් කිරීම්

SLFRS 1 ප්‍රථම වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම සහ නිර්දේශිත පරිචයන් ප්‍රකාශය මගින් ඇතැම් SLFRS හි ප්‍රත්‍යාවර්තී යෙදුමෙන් යම් යම් නිදහස් කිරීම් සඳහා ඉඩ සලසයි.

### 3.10.14.1 NLDB විසින් පහත නිදහස් කිරීම් භාවිතා ඇත.

සාධාරණ වටිනාකමක් හෝ සලකා බලන ලද පිරිවැය ලෙස නැවත තක්සේරු කිරීම
කෝප් නියෝගයට අනුව, එන්එල්ඩීබී හි මෝටර් රථ නැවත තක්සේරු කර ඇති අතර සාධාරණ වටිනාකම ගිණුම්වල ඉදිරිපත් කර ඇත. වෘත්තීය තක්සේරුකරුවෙකු ලෙස සැලකෙන රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කිරීම සිදු කරන ලදී. සින්නක්කර දේපල, පිරියත සහ උපකරණ පිරිවැය ආකෘතිය භාවිතා කරමින් (LKAS) වලට අනුකූලව සකස් කරන ලද මූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුළ ඉදිරියට ගෙන යනු ලැබේ. සාධාරණ වටිනාකම සැලකූ පිරිවැය ලෙස භාවිතා කිරීමට එන්එල්ඩීබී තෝරා ගෙන ඇත.

### 3.11 ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වත්මන් වගකීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැඳීම් වේ. සමූහයේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල අනාවරණය කර ඇත. විවිධ හේතූන් මත එන්එල්ඩීබී ට එරෙහිව උසාවියෙහි නඩු පවරා ඇතත්,ඒවා තවමත් මූලික අදියරේ පවතින බැවින් ප්‍රතිපාදන සකස් කිරීමට හෝ වගකීම් හඳුනා ගැනීමට නොහැකි විය.
මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන, වාර්තා කරන දිනට අසම්භාව්‍ය වගකීම් නොමැත.

**NLDB වෙනුවෙන් පෙනී සිටින නීතිපතිවරයාගේ අදහස වන්නේ මෙම අවස්ථාවෙහිදී කිසිදු නඩුවක ප්‍රතිඵලය හෝ විභව වගකීම තක්සේරු කළ නොහැකි බවයි. එබැවින් ගිණුම්වල ප්‍රතිපාදන අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ශේෂ පත්‍ර දිනයෙන් පසු**

**නඩු දෙකක් සඳහා අනෙක් පාර්ශවය වෙත රු.මිලියන 3.1ක් ගෙවීමට එන්එල්ඩීබී වෙත තීන්දුවක් ලැබී ඇත.**

## 4.මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීම

**සටහන් 4.1 සහ 4.2 මගින් 2017.12.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ 2015.12.31 සහ 2016.12.31 දිනට නැවත සකස් කරන ලද අගයන් සඳහා කරන ලද ගැලපීම් පිළිබඳ විස්තර පෙන්වයි.**

**සටහන් 4.3 සහ 4.4 මගින් 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ 2015.12.31 සහ 2016.12.31 දිනට නැවත සකස් කරන ලද මුදල් ප්‍රමාණයන් සඳහා කරන ලද ගැලපුම් විස්තර පෙන්වයි.**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

| **4.1** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නැවත සඳහන් කළ අගයන් | **2015.12.31** දිනට |
|---|---|
| | රු. |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව පශු සම්පත් ප්‍රාග්ධනය | 2,076,697,227 |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම | (154,511,506) |
| **මූල්‍ය ප්‍රකාශන අනුව පශු සම්පත් ප්‍රාග්ධන ශේෂය (නැවත සකස්කල)** | **1,922,185,721** |
| | |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව දේපල, පිරියත සහ උපකරණ | 3,102,557,187 |
| ක්ෂයවීම් අධිගණනය | 20,005 |
| **මූල්‍ය ප්‍රකාශන අනුව දේපල, පිරියත සහ උපකරණ (නැවත සකස්කල)** | **3,102,577,192** |
| | |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ, අනෙකුත් ලැබිය යුතු මුදල් හා අත්තිකාරම් | 203,674,871 |
| ලියාහල ආර්ථික සේවා ගාස්තු | (17,494,747) |
| වර්ෂය සඳහා අර්ධ සුබෝපභෝගී බද්ද | (274,000) |
| **මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ, අනෙකුත් ලැබිය යුතු මුදල් හා අත්තිකාරම් (නැවත සකස්කල)** | **185,906,124** |
| | |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් හා මුදල් සමාන දෑ | 20,530,577 |
| ඩයගම වියදම් නිවැරදි කිරීම | 80 |
| **මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් හා මුදල් සමාන දෑ (නැවත සකස්කල)** | **20,530,657** |

| **4.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නැවත සඳහන් කළ අගයන් | **2016.12.31** දිනට |
|---|---|
| | **Rs.** |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව පශු සම්පත් ප්‍රාග්ධනය | 2,252,283,752 |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම 2015 | (154,511,506) |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම 2016 | (423,320,709) |
| පශු සම්පත් අගයකිරීම වර්ගකිරීමේ වැරැද්ද | (563) |
| ඩයගම වියදම් නිවැරදි කිරීම | 80 |
| **මූල්‍ය ප්‍රකාශන අනුව පශු සම්පත් ප්‍රාග්ධන ශේෂය (නැවත සකස්කල)** | **1,674,451,054** |
| | |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව දේපල, පිරියත සහ උපකරණ | 3,150,269,830 |
| ක්ෂයවීම් අධිගණනය 2015 | 20,005 |
| ක්ෂයවීම් අධිගණනය 2016 | 462,221 |
| **මූල්‍ය ප්‍රකාශන අනුව දේපල, පිරියත සහ උපකරණ (නැවත සකස්කල)** | **3,150,752,056** |

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

| | |
|---|---|
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ, අනෙකුත් ලැබිය යුතු මුදල් හා අත්තිකාරම් | 212,699,281 |
| ලියාහල ආර්ථික සේවා ගාස්තු | (17,494,747) |
| 2015 වර්ෂය සඳහා අර්ධ සුබෝපබෝගී බදු | (274,000) |
| 2016 වර්ෂය සඳහා අර්ධ සුබෝපබෝගී බදු | (200,000) |
| **මූල්‍ය ප්‍රකාශන අනුව වෙළඳ, අනෙකුත් ලැබිය යුතු මුදල් හා අත්තිකාරම් (නැවත සකස්කල)** | **194,730,534** |

**4.3** ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනෙය් නැවත සඳහන් කල අගයන්

| | **2015.12.31 වර්ෂය** |
|---|---|
| | **Rs.** |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය | 34,840,105 |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම | (154,511,506) |
| ඩයගම වියදම් නිවැරදි කිරීම | 80 |
| ක්ෂයවීම් අධිප්‍රතිපාදනය | 20,005 |
| ලියාහල ආර්ථික සේවා ගාස්තු | (17,494,747) |
| වර්ෂය සඳහා අර්ධ සුබෝපබෝගී බදු | (274,000) |
| **මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය (නැවත සකස්කල)** | **(137,420,063)** |

**4.4** ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනෙය් නැවත සඳහන් කල අගයන්

| | **2016.12.31 වර්ෂය** |
|---|---|
| | **Rs.** |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය | 9,487,129 |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම | (423,320,707) |
| ක්ෂයවීම් අධිප්‍රතිපාදනය | 462,221 |
| වර්ෂය සඳහා අර්ධ සුබෝපබෝගී බදු | (200,000) |
| **මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය (නැවත සකස්කල)** | **(413,571,357)** |

**4.3** ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනෙය් නැවත සඳහන් කල අගයන්

| | **2015.12.31 වර්ෂය** |
|---|---|
| | **Rs.** |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය | 34,840,105 |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම | (154,511,506) |
| ඩයගම වියදම් නිවැරදි කිරීම | 80 |
| ක්ෂයවීම් අධිප්‍රතිපාදනය | 20,005 |
| ලියාහල ආර්ථික සේවා ගාස්තු | (17,494,747) |
| වර්ෂය සඳහා අර්ධ සුබෝපබෝගී බදු | (274,000) |
| මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය (නැවත සකස්කල) | **(137,420,063)** |

**4.4** ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනෙය් නැවත සඳහන් කල අගයන්

| | **2016.12.31 වර්ෂය** |
|---|---|
| | **Rs.** |
| විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය | 9,487,129 |
| පශු සම්පත් අගයකිරීමේ ගැලපීම | (423,320,707) |
| ක්ෂයවීම් අධිප්‍රතිපාදනය | 462,221 |
| වර්ෂය සඳහා අර්ධ සුබෝපබෝගී බදු | (200,000) |
| මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය (නැවත සකස්කල) | **(413,571,357)** |

## 5.නිකුත් කරන ලද නමුත් වාර්තාකරණ දිනට බලාත්මක නොවූ ප්‍රමිත

**මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිකුත් කර ඇති නමුත් වාර්තා කරන දිනට බලාත්මක නොවූ නව ප්‍රමිති සහ ප්‍රමිති සංශෝධන ගණනාවක් අදාළ කර නොමැත. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පහත ගිණුම්කරණ ප්‍රමිති අදාළ කර නොමැති අතර අදාළ ක්‍රියාත්මක වන දිනවලදී මෙම ප්‍රමිතීන් අදාළ කිරීමට සමාගම සැලසුම් කරයි.**

**SLFRS 9 "මූල්‍ය උපකරණ" 2018 ජනවාරි 01 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ**

**ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 39 හි පවතින මාර්ගෝපදේශය වෙනුවට 2014 දී නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 -මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මැනීම 2018 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා බලාත්මක වේ.**
**ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි අවසාන අනුවාදය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 39 ප්‍රතිස්ථාපනය කරන මූල්‍ය උපකරණ - මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ මැනීම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 හි සියලුම පෙර අනුවාදය. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 මූල්‍ය උපකරණය සඳහා ගිණුම්කරණයේ අංශ තුනම එකට ගෙන එයි, එනම් වර්ගීකරණය සහ මිනුම්, හානිකරණ ගිණුම්කරණය.**
**සමූහය සහ එන්එල්ඩීබී එහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මෙම ප්‍රමිතීන්ගේ බලපෑම හඳුනා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී. සම්මතය ක්‍රියාත්මක කිරීමේ බලපෑම තවමත් අවසන් කර නොමැත.**

SLFRS 5- පාරිභෝගිකයින් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම 2018 ජනවාරි 01 වැනි දින හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාලසීමාවන් සඳහා බලපැවැත්වේ.

SLFRS- 15 මගින් ආදායමලෙස හඳුනා ගන්නේ කොපමණ ප්‍රමාණයක්ද සහ කවදාද, යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. ආයතන විසින් ආදායම හඳුනා ගත යුත්තේ කවදාද සහ කුමන වටිනාකමකින්ද යන්න තීරණය කිරීමට පියවර පහක ආකෘතියක් යොදනු ඇත. ආයතනයක් විසින් භාණ්ඩ හා සේවාවල අයිතිය පාරිභෝගිකයෙකුට හිමිවීමට අපේක්ෂා කරන ප්‍රමාණයට පැවරීමේදී හෝ ආයතනයක් ලෙස ආදායම හඳුනා ගන්නා බව ආකෘතිය සඳහන් කරයි.

SLFRS 15 දැනට පවතින ආදායම් හඳුනාගැනීමේ මඟපෙන්වීම ප්‍රතිස්ථාපනය කරයි,"ආදායම" පිළිබඳ LKAS 18 සහ 'ඉදිකිරීම් කොන්ත්‍රාත්තු' පිළිබඳ LKAS 11 සහ "පාරිභෝගික පක්ෂපාතිත්ව වැඩසටහන්" පිළිබඳ IFRIC 13, IFRIC 15 "නිශ්චල දේපල ඉදිකිරීම සඳහා ගිවිසුම්", 8 "නිශ්චල දේපල"

18. ගනුදෙනුකරුවන්ගෙන් වත්කම්" සහ SIC 31 "ආදායම් - වෙළඳ ප්‍රචාරණ සේවා සම්බන්ධ භාණ්ඩ හුවමාරු ගනුදෙනු"

සමූහය සහ NLDB එහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මෙම ප්‍රමිතීන්ගේ බලපෑම හඳුනා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී. ප්‍රමිතය ක්රියාත්මක කිරීමේ බලපෑම තවමත් අවසන් කර නොමැත.

SLFRS 16 - "කල්බදු" 2019 ජනවාරි 01 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

SLFRS 16 මගින් ශේෂ පත්‍ර මූල්‍ය කල්බදු සහ ශේෂ පත්‍රය නාවන මෙහෙයුම් කල්බදු අතර වෙනස හඳුනා ගන්නා බදුකරුවන් සඳහා පවතින ද්විත්ව ගිණුම්කරණ ආකෘතිය ඉවත් කරයි. ඒ වෙනුවට වත්මන් මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ගිණුම්කරණ ආකෘතියක් ඇත.

සමූහය සහ එන්එල්ඩීබී එහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මෙම ප්‍රමිතීන්ගේ බලපෑම හඳුනා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී. ප්‍රමිතය ක්රියාත්මක කිරීමේ බලපෑම තවමත් අවසන් කර නොමැත.

SLFRS 16 - "කල්බදු"- 2019 ජනවාරි 01 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලාත්මක වේ.

SLFRS 16 මගින් ශේෂ පත්‍ර මූල්‍ය කල්බදු සහ ශේෂ පත්‍රය නාවන මෙහෙයුම් කල්බදු අතර වෙනස හඳුනා ගන්නා බදුකරුවන් සඳහා පවතින ද්විත්ව ගිණුම්කරණ ආකෘතිය ඉවත් කරයි. ඒ වෙනුවට වත්මන් මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන තනි ශේෂ පත්‍ර ගිණුම්කරණ ආකෘතියක් ඇත.

සමූහය සහ NLDB එහි මූල්‍ය ප්‍රකාශන කෙරෙහි මෙම ප්‍රමිතීන්ගේ බලපෑම හඳුනා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී. ප්‍රමිතය ක්රියාත්මක කිරීමේ බලපෑම තවමත් අවසන් කර නොමැත.

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමූහය 2017 | සමූහය 2016 | NLI 2017 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **1 ආදායම** | | | |
| විකුණුම්-ප්‍රධාන ව්‍යාපෘතිය | **2,607,723,141** | 2,626,975,349 | **2,538,535,024** |
| විකුණුම්-අනෙකුත් ව්‍යාපෘති | | | |
| කිරි ව්‍යාපෘතිය | **186,020,817** | 196,591,940 | **186,020,817** |
| වරලත් | **3,002,961** | 4,066,722 | **3,002,961** |
| ඕලයිට් | **-** | 1,086,555 | **-** |
| අලෙවිසැල් | **76,486,763** | 73,439,676 | **70,029,906** |
| | **2,873,233,682** | 2,902,160,242 | **2,797,588,708** |
| **2 ජීව විද්‍යාත්මක වත්කම්හි සාධාරණ අගය** | | | |
| කිරි ආශ්‍රිත පශු සම්පත්වල සාධාරණ අගයෙන් විකිණුම් වියදම් අඩුකල පසු වෙනස්වීම තුළින් හටගත් ලාභය | **160,141,793** | (306,842,364) | **160,141,793** |
| | **160,141,793** | (306,842,364) | **160,141,793** |
| **3 විකුණුම් පිරිවැය** | | | |
| විකුණුම් පිරිවැය ප්‍රධාන ව්‍යාපෘතිය | **(2,054,226,034)** | (1,871,814,166) | **(2,000,512,005)** |
| විකුණුම් පිරිවැය - සුළු ව්‍යාපෘති | | | |
| කිරි ව්‍යාපෘතිය | **(136,436,919)** | (145,019,597) | **(136,436,919)** |
| වරලත් | **(2,265,489)** | (3,019,078) | **(2,265,489)** |
| ඕලයිට් | **-** | (714,627) | **-** |
| අලෙවිසැල් | **(65,325,688)** | (57,955,743) | **(60,897,053)** |
| | **(2,258,254,130)** | (2,078,523,211) | **(2,200,111,466)** |
| **4 වෙනත් ආදායම්** | | | |
| ආයෝජන දේපල මත වූ ආදායම | **963,821** | 1,363,821 | **963,821** |
| සේවක ණය පොලී | **1,997,774** | 2,157,049 | **1,997,774** |
| තැන්පතු පොලී | **11,270,121** | 8,758,762 | **6,168,672** |
| කිරි ව්‍යාපෘති ආදායම | **8,964,861** | 10,439,721 | **8,964,861** |
| ඉවත්කිරීමේ ලාභය | **1,128,418** | - | **-** |
| වෙනත් ආදායම් | **26,356,876** | 31,349,948 | **26,138,703** |
| | **50,681,871** | 54,069,301 | **44,233,831** |
| **5 රාජ්‍ය ප්‍රදාන** | | | |
| සූකර ව්‍යාපෘතිය | - | 1,324,279 | - |
| ජංගම හා ජාතික ආහාර වැඩසටහන | - | 3,587,641 | - |
| රිදියගම ව්‍යාපෘතිය | - | 17,998,972 | - |
| ජීව වායු ඒකකය | - | 1,818,709 | - |
| | - | 24,729,601 | - |
| **6 මෙහෙයුම් වියදම්** | රු. | රු. | රු. |
| **6.1 බෙදාහැරීමේ වියදම්** | | | |
| අලෙවි වියදම් | **(56,695)** | - | **-** |
| තැරැව්කාර වියදම් | **(3,080,642)** | (3,077,710) | **(3,080,642)** |
| බොල්ණය | **(1,773,500)** | (887,524) | **(1,773,500)** |
| කිරි ව්‍යාපෘතිය | **(1,261,246)** | (761,197) | **(1,261,246)** |
| වරලත් ව්‍යාපෘතිය | **(18,816)** | - | **(18,816)** |
| අලෙවි සැල | **(278,622)** | (254,730) | **(278,622)** |
| වෙනත් බෙදාහැරීමේ වියදම් | **(321,075)** | (242,568) | **-** |
| | **(6,790,596)** | (5,223,729) | **(6,412,826)** |



| | | | | |
|---|---|---|---|---|
| **6.2 පරිපාලන වියදම්** | | | | |
| ගොවිපල පරිපාලන හා පොදු වියදම් | **(740,222,958)** | (686,489,582) | **(702,613,429)** | (644,079,421) |
| ප්‍රධාන කාර්යාලය | **(138,320,048)** | (134,700,229) | **(138,320,048)** | (134,700,229) |
| කිරි ව්‍යාපෘතිය | **(51,300,040)** | (55,308,668) | **(51,300,040)** | (55,308,668) |
| වරලත් ව්‍යාපෘතිය | **(626,896)** | (1,038,241) | **(626,896)** | (1,038,241) |
| අලෙවි සැල | **(5,297,177)** | (5,549,929) | **(5,297,177)** | (5,549,929) |
| වාර්ෂික ප්‍රසාද දීමනා | - | (9,182,539) | - | (9,182,539) |
| ඩිලයිට් ව්‍යාපෘතිය | - | (96,628) | - | (96,628) |
| | **(935,767,119)** | (892,365,816) | **(898,157,590)** | (849,955,655) |
| **6.3 වෙනත් වියදම්** | | | | |
| ගොවිපල කුඩා ව්‍යාපෘති සඳහා වූ වියදම් | **(4,024,158)** | (3,431,755) | **(4,024,158)** | (3,431,755) |
| ගොවිපල වෙනත් වියදම් | **(7,696,919)** | (3,466,767) | **(7,696,919)** | (3,466,767) |
| | **(11,721,077)** | (6,898,522) | **(11,721,077)** | (6,898,522) |
| **7 මූල්‍ය පිරිවැය** | | | | |
| බැංකු අයිරා පොලී | **(301,520)** | (645,870) | **(149,759)** | (645,870) |
| ලීසිං පොලී | **(4,188,148)** | (4,040,649) | **(4,188,148)** | (4,040,649) |
| බැංකු ණය පොලී | **(24,811,548)** | (8,904,531) | **(23,778,221)** | (8,904,531) |
| වෙලාඩ් ණය පොලී | **(128,135,435)** | (86,755,464) | **(128,135,435)** | (86,755,464) |
| පාරිතෝෂික මත පොලී | **(21,878,269)** | (21,831,098) | **(21,878,269)** | (21,831,098) |
| මූල්‍ය ගාස්තු | **(298,643)** | (247,948) | **(236,298)** | (219,097) |
| | **(179,613,563)** | (122,425,560) | **(178,366,130)** | (122,396,709) |
| **8 බදු වියදම** | | | | |
| **බදු වියදමෙහි ප්‍රධාන සංරචක** | | | | |
| **8.1 වර්තමාන ආදායම් බදු** | | | | |
| වර්තමාන ආදායම් බදු ගාස්තු | **916,390** | 762,486 | | |
| **8.2 අධර් සුකෝප්පබෝගී බදු** | | | | |
| අධර් සුකෝප්පබෝගී බදු ගාස්තු | **243,000** | 200,000 | **243,000** | 200,000 |
| **8.3 විලම්භිත බදු** | | | | |
| විලම්භිත බදු ගාස්තු /ආපසු ගෙවීම්) | - | - | - | - |
| ලාභ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කරන ලද බදු ආදායම | **1,159,390** | 962,486 | **243,000** | 200,000 |

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන වල සටහන්

## 9 දේපල පිරියත හා උපකරණ

### 9.1 දේපල පිරියත හා උපකරණ - සමූහය (විගණිත)

| | සින්නක්කර අයිතිය | | | | | | | | බදු අයිතිය | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් | ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍ර | වතු උපකරණ | කාර්යාල උපකරණ | වෙනත් උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | මෝටර් වාහන | මෝටර් වාහන | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පිරිවැය හෝ අගයකිරීම මත | | | | | | | | | | | |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 375,483,228 | 1,691,953,843 | 657,394,714 | 926,824,706 | 41,622,216 | 3,894,725 | 24,247,665 | 281,744,866 | 84,147,746 | 24,150,397 | **4,111,464,106** |
| අත්පත්කර ගැනීම් | - | 73,626,327 | 13,951,003 | 5,658,158 | 1,058,344 | 69,875 | 527,446 | 3,220,760 | - | 22,001,280 | **120,113,193** |
| ඉවත් කිරීම | - | (3,382,688) | (45,424) | (579,024) | - | - | (164) | (2,464,172) | - | - | **(6,471,472)** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **375,483,228** | **1,762,197,482** | **671,300,293** | **931,903,840** | **42,680,560** | **3,964,600** | **24,774,947** | **282,501,454** | **84,147,746** | **46,151,677** | **4,225,105,827** |
| සමුච්චිත ක්ෂය | | | | | | | | | | | |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | - | (443,188,592) | (142,812,848) | (104,221,955) | (32,855,145) | (2,970,531) | (15,755,712) | (116,272,944) | (14,532,224) | - | **(872,609,951)** |
| ක්ෂය | - | (78,268,452) | (61,742,711) | (45,103,469) | (2,898,781) | (212,239) | (1,895,979) | (27,559,977) | (8,309,275) | - | **(225,990,883)** |
| ඉවත් කිරීම | - | 1,761,629 | 45,424 | 579,024 | - | - | - | 1,751,658 | - | - | **4,137,735** |
| ගැලපීම් | - | - | - | - | - | - | - | (210,999) | 210,999 | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **(519,695,415)** | **(204,510,135)** | **(148,746,400)** | **(35,753,926)** | **(3,182,770)** | **(17,651,691)** | **(142,292,262)** | **(22,630,500)** | - | **(1,094,463,099)** |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 375,483,228 | 1,248,765,251 | 514,581,866 | 822,602,751 | 8,767,071 | 924,194 | 8,491,953 | 165,471,922 | 69,615,522 | 24,150,397 | 3,238,854,155 |
| **2017දෙසැම්බර් 31 දිනට ශේෂය** | **375,483,228** | **1,242,502,067** | **466,790,158** | **783,157,440** | **6,926,634** | **781,830** | **7,123,256** | **140,209,192** | **61,517,246** | **46,151,677** | **3,130,642,728** |

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන වල සටහන්

## 9 දේපල පිරියත හා උපකරණ (ඉදිරියට)

### 9.2 දේපල පිරියත හා උපකරණ - එන්එල්ඩීබී (විගණිත)

| | සින්නක්කර අයිතිය | | | | | | | | බදු අයිතිය | කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉඩම් | ගොඩනැගිලි | පිරියත හා යන්ත්‍ර | වතු උපකරණ | කාර්යාල උපකරණ | වෙනත් උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | මෝටර් වාහන | මෝටර් වාහන | | |
| | රු.. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පිරිවැය හෝ අගයකිරීම මත | | | | | | | | | | | |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 338,483,228 | 246,935,358 | 628,980,281 | 926,824,706 | 36,781,629 | 17,703,893 | 1,378,713,559 | 260,711,476 | 84,147,746 | 24,150,397 | **3,943,432,273** |
| අත්පත්කර ගැනීම් | - | 19,920,126 | 13,521,790 | 5,658,158 | 1,058,344 | 495,828 | 53,706,202 | 1,401,760 | - | 22,001,280 | **117,763,488** |
| ඉවත් කිරීම | - | (3,242,241) | (45,424) | (579,024) | - | (164) | (140,447) | (1,214,172) | - | - | **(5,221,472)** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **338,483,228** | **263,613,243** | **642,456,647** | **931,903,840** | **37,839,973** | **18,199,557** | **1,432,279,314** | **260,899,064** | **84,147,746** | **46,151,677** | **4,055,974,289** |
| සමුච්චිත ක්ෂය | | | | | | | | | | | |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | - | (95,977,365) | (117,673,881) | (104,221,955) | (28,271,470) | (9,676,077) | (324,550,495) | (97,776,750) | (14,532,224) | - | (792,680,217) |
| ක්ෂය | - | (12,246,076) | (61,111,035) | (45,103,469) | (2,660,269) | (1,469,517) | (64,812,813) | (25,068,321) | (8,309,275) | - | (220,780,775) |
| ඉවත් කිරීම | - | 1,621,182 | 45,424 | 579,024 | - | - | 140,447 | 501,658 | - | - | 2,887,735 |
| ගැලපීම | - | - | - | - | - | - | - | (210,999) | 210,999 | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **-** | **(106,602,259)** | **(178,739,492)** | **(148,746,400)** | **(30,931,739)** | **(11,145,594)** | **(389,222,861)** | **(122,554,412)** | **(22,630,500)** | **-** | **(1,010,573,257)** |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | 338,483,228 | 150,957,993 | 511,306,400 | 822,602,751 | 8,510,159 | 8,027,816 | 1,054,163,064 | 162,934,726 | 69,615,522 | 24,150,397 | 3,150,752,056 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **338,483,228** | **157,010,984** | **463,717,155** | **783,157,440** | **6,908,234** | **7,053,963** | **1,043,056,453** | **138,344,652** | **61,517,246** | **46,151,677** | **3,045,401,032** |

| දෙසැම්බර් 31 දිනට | සමූහය 2017 Rs. | සමූහය 2016 Rs. | NLDB 2017 Rs. | NLDB 2016 Rs. |
|---|---|---|---|---|
| **10 බදු දේපල** | | | | |
| **ජනවාරි 01 දිනට ශේෂය** | **6,628,784** | 6,717,168 | - | - |
| වර්ෂය සඳහා කුම ක්ෂය | **(88,384)** | (88,384) | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **6,540,400** | 6,628,784 | - | - |

ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම විසින් 1982 ඔක්තෝබර් 01 දිනැති ගිවිසුම මඟින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිදහස් අයිතිය යටතේ පවතින බණ්ඩිරිප්පුව ලුණුවිල ඉඩම වසර 99ක් සඳහා ලබාගෙන ඇත.

**11 ජීව විද්‍යාත්මක වත්කම්**

11.1 වගාවන්

**සමූහය**

| | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ දරන ලද වියදම් | ලාභඅලාභ සඳහා ගලපන ලද අගය | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පොල් යටි වගාව/නව වගාව | 683,214,052 | 57,961,190 | (4,276,185) | **736,899,057** |
| තෘණ ස්ථාපිත කිරීමේ වියදම් | 29,147,027 | 16,209,781 | (7,286,757) | **38,070,051** |
| කජු වගා කිරීමේ වියදම් | 1,356,806 | - | (21,424) | **1,335,382** |
| රබර් වගා කිරීමේ වියදම් | 20,409,766 | 4,519,543 | - | **24,929,309** |
| වෙනත් වගා වියදම් | 1,370,774 | 580,817 | - | **1,951,591** |
| | 735,498,425 | 79,271,331 | (11,584,366) | **803,185,390** |

**NLDB**

| | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ දරන ලද වියදම් | ලාභඅලාභ සඳහා ගලපන ලද අගය | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| පොල් යටි වගාව/නව වගාව | 681,802,453 | 57,763,260 | (4,276,185) | **735,289,528** |
| තෘණ ස්ථාපිත කිරීමේ වියදම් | 29,147,027 | 16,209,781 | (7,286,757) | **38,070,051** |
| කජු වගා කිරීමේ වියදම් | 1,356,807 | - | (21,424) | **1,335,383** |
| රබර් වගා කිරීමේ වියදම් | 20,409,766 | 4,519,543 | - | **24,929,309** |
| වෙනත් වගා වියදම් | 1,370,774 | 368,053 | - | **1,738,827** |
| | 734,086,827 | 78,860,637 | (11,584,366) | **801,363,098** |

## 11.2 පශු සම්පත් ප්‍රාග්ධන

| | | | | |
|---|---|---|---|---|
| ගවයින්/මීගවයින් | **450,499,806** | 363,646,982 | **450,499,806** | 363,646,982 |
| එළුවන් | **10,378,384** | 10,120,082 | **10,378,384** | 10,120,082 |
| ඌරන් | **36,529,486** | 26,055,435 | **36,529,486** | 26,055,435 |
| බැටළුවන් | **77,505,760** | 64,274,841 | **76,178,260** | 63,315,341 |
| හාවන් | **320,050** | 271,013 | **320,050** | 271,013 |
| තාරාවන් | **-** | 35,700 | **-** | 35,700 |
| කුකුළන් | **9,824,720** | 20,353,301 | **9,824,720** | 20,353,301 |
| බ්‍රොයිලර් | **41,043,131** | 16,450,195 | **41,043,131** | 16,450,195 |
| වෙනත් | **275,615** | 220,000 | **275,615** | 220,000 |
| ආනයනික ගවයින් | **1,348,014,194** | 1,337,722,191 | **1,348,014,194** | 1,337,722,191 |
| 10% අඩු කිරීම | **(192,192,018)** | (163,739,186) | **(192,192,018)** | (163,739,186) |
| | **1,782,199,128** | 1,675,410,554 | **1,780,871,628** | 1,674,451,054 |

## 11.3 පශු සම්පත් අලෙවි

| | | | | |
|---|---|---|---|---|
| ගවයින්/මීගවයින් | **3,392,382** | 2,693,680 | **3,392,382** | 2,693,680 |
| ඌරන් | **12,677,730** | 6,225,285 | **12,677,730** | 6,225,285 |
| වටුවන් | **1,076,223** | 574,971 | **1,076,223** | 574,971 |
| තාරාවන් | **88,501** | 1,185 | **88,501** | 1,185 |
| කුකුළන් | **4,526,940** | 4,114,314 | **4,526,940** | 4,114,314 |
| බ්‍රොයිලර් | **-** | 19,316,280 | **-** | 19,316,280 |
| 10% අඩු කිරීම | **(1,607,011)** | (891,897) | **(1,607,011)** | (891,897) |
| | **20,154,765** | 32,033,818 | **20,154,765** | 32,033,818 |

## 11.2.1 ජීව විද්‍යාත්මක වත්කම් වෙනස්වීම - පශු සම්පත්

| | | | | |
|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | **1,890,269,261** | 2,145,672,248 | **1,889,309,761** | 2,145,672,248 |
| එකතුකිරීම | **710,189,346** | 520,746,998 | **709,821,346** | 519,787,498 |
| ඉවත්කිරීම | **(604,305,685)** | (776,149,985) | **(604,305,685)** | (776,149,985) |
| උපලබ්ධි නොවූ ලාභ | **(193,799,029)** | (182,824,889) | **(193,799,029)** | (182,824,889) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,802,353,893** | 1,707,444,372 | **1,801,026,393** | 1,706,484,872 |

## 12 පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල ආයෝජන

| දෙසැම්බර් 31 දිනට | | NLDB | |
|---|---|---|---|
| | | **2,017** | 2,016 |
| | | රු. | රු. |
| **12.1 පරිපාලිතයන්හි ආයෝජන** | **කොටස් හිමිකම** | | |
| ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම | 100% | **149,123,327** | 149,123,327 |
| | | **149,123,327** | 149,123,327 |

මණ්ඩලය විසින් 51%ක හිමිකම වෙනුවෙන් රු. 15,995,171ක් ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාමරීක හා පශු සම්පත් සංවර්ධන පුද්ගලික සමාගමෙහි (ලැයිස්තුගත නොවූ ආයෝජන) ආයෝජනය කර තිබුණි. ලිබියාවේ 49% කොටස් හිමිකමක් පැවති ලිබියන් විදේශ ආයෝජන සමාගම 2014 මැයි මස 07 වන දින රු.මි.140ක ප්‍රතිෂයාවකට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට මාරු කරන ලදී.ඉන්පසු ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට සමාගමෙහි 100% අයිතියක් පැවතුණි. එමෙන්ම එම සමාගමේ නමද ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන සමාගම ලෙස 2014 ජූලි 03 වන දින සිට බලාත්මක වන පරිදි වෙනස් කරන ලදී. 2014 වර්ෂයේ සිට මෙම ආයෝජනය පිරිවැයට වාතර්‍ා කර ඇත.

| දෙසැම්බර් 31 දිනට | සමූහය | | NLDB | |
|---|---|---|---|---|
| | **2,017** | 2,016 | **2,017** | 2,016 |
| | රු. | රු. | රු. | රු. |
| **12.2 ආශ්‍රිතයන්හි ආයෝජන** | | | | |
| මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම | **600,000** | - | **600,000** | - |
| | **600,000** | - | **600,000** | - |

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් රු.600,000ක මුදල මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ 600,00ක හිමිකම් කොටස් ලබා ගැනීමේ අරමුණින් 2016 අගෝස්තු 12 වන දින ආයෝජනය කර තිබුණි . මෙම ආයෝජනය 20%-50% අතර (27%ක අයිතිය) වන බැවින් ආශ්‍රිතයන්හි සිදුකරන ලද ආයෝජනයක් ලෙස සලකනු ලබයි. කෙසේ වෙතත් කොටස් සහතිකයේ සඳහන් වන්නේ 2017 දෙසැම්බර් 22 වේ. එතෙක් මෙය ආයෝජනය වෙනුවෙන් කරන ලද අත්තිකාරම් ගෙවීමක් ලෙස ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණි.

මෙම ආයෝජනය මූලිකව පිරිවැයට හඳුනාගනු ලබයි. ඉහත දැක්වූ සමාගමෙහි මෙම කොටස් ආයෝජනය දින 10ක් පමණක් පැවති අතර එහි මූල්‍ය වර්ෂය සෑම වසරකම මාතර්‍ 31 දිනෙන් අවසන් වේ. එම නිසා මෙම ආයෝජනය 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය ක්‍රමය සැලකිල්ලට ගනිමින් ගිණුම් තබනු ලබයි.

| දෙසැම්බර් 31 දිනට | සමූහය | | NLDB | |
|---|---|---|---|---|
| | **2017** | 2016 | **2017** | 2016 |
| | රු. | රු. | රු. | රු. |
| **13 තොග** | | | | |
| පොල් කොප්පරා | **91,363,035** | 168,125,794 | **91,363,035** | 168,125,794 |
| සුළු නිෂ්පාදන තොග | **14,608,609** | 10,755,993 | **14,608,609** | 10,755,993 |
| වැවිල් වියදම - අභිජනනය | **7,220,722** | 5,576,784 | **-** | - |
| වැවිල් වියදම – කුකුළන් | **2,285,685** | 1,010,005 | **-** | - |
| ආහාර තොග | **1,337,990** | 1,237,641 | **-** | - |
| ගොවිපළ හා ප්‍රධාන කායර්‍ාලයෙහි අනෙකුත් තොග | **127,609,212** | 124,773,788 | **126,940,097** | 123,484,141 |
| | **244,425,253** | 311,480,005 | **232,911,741** | 302,365,928 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **14** | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | | |
| | වෙළඳ හා වෙනත් ණයගැතියෝ | **220,828,116** | 185,004,640 | **220,678,272** | 184,854,796 |
| | අඩුකලා: බොල්ණය හා | **(49,318,143)** | (47,544,642) | **(49,318,143)** | (47,544,642) |
| | අඩමාන ණය වෙන්කිරීම් | **34,774,919** | 30,023,834 | **34,774,920** | 30,023,833 |
| | සේවක ණයගැතියෝ | **28,094,736** | 15,905,835 | **28,094,736** | 15,905,835 |
| | ආථරීක සේවා ගාස්තු | **2,655,338** | 1,708,078 | **2,655,338** | 1,708,078 |
| | දේශීය ආදායම් දෙපා. | **13,352,678** | 11,907,863 | **11,358,183** | 9,782,634 |
| | ලැබිය යුතු එකතු කළ අගය මත බදු | **250,387,644** | 197,005,608 | **248,243,306** | 194,730,534 |
| **15** | **අත්තිකාරම් ,තැන්පතු හා පෙර ගෙවීම්** | | | | |
| | නැවත ගෙවිය යුතු තැන්පතු | **900,000** | 900,000 | **-** | - |
| | තැන්පතු | **2,112,498** | 1,589,791 | **1,488,748** | 954,791 |
| | පෙර ගෙවීම් | **4,818,937** | 10,838,027 | **4,818,937** | 10,838,027 |
| | | **7,831,435** | 13,327,818 | **6,307,685** | 11,792,818 |
| **16** | **වෙනත් ජංගම වත්කම්** | | | | |
| | SLPDC වෙතින් ලැබිය යුතු මුදල් | **2,044,818** | 2,044,818 | **2,044,818** | 2,044,818 |
| | NLDB වෙතින් ලැබිය යුතු මුදල් | **5,071,910** | 5,071,910 | **-** | - |
| | Mahaweli වෙතින් ලැබිය යුතු මුදල් | **5,063,111** | 5,663,112 | **4,184,415** | 4,784,415 |
| | වෙනත් ලැබිය යුතු මුදල් | **73,359,596** | 125,181,509 | **72,572,734** | 124,394,647 |
| | | **85,539,435** | 137,961,349 | **78,801,967** | 131,223,880 |
| **17** | **කෙටිකාලීන ආයෝජන** | | | | |
| | ස්ථාවර තැන්පතු-මහජන බැංකුව | **85,278,123** | 81,115,710 | **61,196,562** | 59,203,462 |
| | ස්ථාවර තැන්පතු-ලංකා බැංකුව | **29,418,736** | 26,983,274 | **447,283** | 403,959 |
| | | **114,696,859** | 108,098,984 | **61,643,845** | 59,607,421 |
| **18** | **මුදල් හා මුදල් සමාන දෑ** | | | | |
| **18.1** | **හිතකර ශේෂ** | | | | |
| | බැංකු ශේෂ | **24,573,079** | 32,432,328 | **23,848,841** | 32,078,116 |
| | ඉතුරුම් ගිණුම | **9,399** | 293,421 | **6,397** | 6,397 |
| | අතැති මුදල් | **6,508,325** | 5,171,854 | **6,397,143** | 5,058,889 |
| | අතැති මුද්දර | **38,922** | 81,745 | **38,922** | 81,745 |
| | මාගර්ස්ථ මුදල් | **794,205** | (67,241) | **794,205** | (67,241) |
| | | **31,923,930** | 37,912,107 | **31,085,508** | 37,157,906 |
| **18.2** | **අහිතකර ශේෂ** | | | | |
| | බැංකු අයිරාව | **14,645,042** | 103,217 | - | - |
| | | **14,645,042** | **103,217** | - | - |

| දෙසැම්බර් 31 දිනට | | සමූහය | | NLDB | |
|---|---|---|---|---|---|
| | | **2017** | 2016 | **2017** | 2016 |
| | | රු. | රු. | රු. | රු. |
| **19** | **පොළී සහිත ණය හා ණය ගැනීම්** | | | | |
| **19.1** | **දිගු කාලීන ණය ගැනීම්** | | | | |
| | ගොවි භාර අරමුදල | **79,212,700** | 84,012,700 | **79,212,700** | 84,012,700 |
| | මහජන බැංකුව | **157,679,425** | 120,333,333 | **156,333,333** | 120,333,333 |
| | ලංකා බැංකුව | **18,043,270** | - | **-** | - |
| | කිරිගව ණය– 1 වන අදියර | **569,551,840** | 762,444,041 | **569,551,840** | 762,444,041 |
| | කිරිගව ණය – 2 වන අදියර | **2,031,102,490** | 2,539,202,366 | **2,031,102,490** | 2,539,202,366 |
| | කල්බදු | **18,019,533** | 32,332,280 | **18,019,533** | 32,332,280 |
| | | **2,873,609,258** | 3,538,324,720 | **2,854,219,896** | 3,538,324,720 |
| **19.2** | **කෙටි කාලීන ණය ගැනීම්** | | | | |
| | මහජන බැංකුව | **51,348,320** | - | **51,348,320** | - |
| | ගොවිපල ජංගම ගිණුම් | **6,520,159** | 816,280 | **6,520,159** | 816,280 |
| | | **57,868,479** | 816,280 | **57,868,479** | 816,280 |
| **19.3** | **මාස 12 ඇතුළත ගෙවිය යුතු ණය** | | | | |
| | කිරිගව ණය– 1 වන අදියර | **1,085,580,761** | 892,688,560 | **1,085,580,761** | 892,688,560 |
| | කිරිගව ණය – 2 වන අදියර | **776,017,565** | 267,917,688 | **776,017,565** | 267,917,688 |
| | මහජන බැංකු ණය මි.100 | **20,000,000** | 20,000,000 | **20,000,000** | 20,000,000 |
| | මහජන බැංකු නව ණය මි.100 | **20,000,000** | - | **20,000,000** | - |
| | මහජන බැංකුව මි.70 | **14,000,000** | 14,000,000 | **14,000,000** | 14,000,000 |
| | ගෙවිය යුතු කල්බදු | **15,810,760** | 12,509,763 | **15,810,760** | 12,509,763 |
| | | **1,931,409,086** | 1,207,116,011 | **1,931,409,086** | 1,207,116,011 |
| **20** | **පාරිතෝෂික** | | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | **191,671,331** | 190,785,037 | **190,245,814** | 189,835,638 |
| | වර්ෂය තුළ ප්‍රතිපාදන | **11,683,058** | 12,677,382 | **11,523,543** | 12,028,995 |
| | ආරම්භක ශේෂය සඳහා පොළිය | **21,878,269** | 21,831,097 | **21,878,269** | 21,831,097 |
| | ආයුගණක (ලාභ) අලාභ | **(11,525,951)** | (10,998,759) | **(11,525,951)** | (10,998,759) |
| | වර්ෂය තුළ ගෙවීම් | **(27,767,519)** | (22,623,427) | **(27,673,334)** | (22,451,157) |
| | දෙසැම්බර් 01 දිනට ශේෂය | **185,939,188** | 191,671,330 | **184,448,341** | 190,245,814 |
| **21** | **කල්බදු වත්කම් මතවූ විලම්භිත ආදායම** | | | | |
| | බ්‍රැන්ඩික්ස් පුද්ගලික සමාගම වෙතින් කල්බදු | **12,473,745** | 13,140,411 | **12,473,745** | 13,140,411 |
| | රජවැල්ල හෝල්ඩින්ස් වෙතින් කල්බදු | **18,984,596** | 19,230,050 | **18,984,596** | 19,230,050 |
| | | **31,458,341** | 32,370,461 | **31,458,341** | 32,370,461 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **22** | **වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ** | | | | |
| | වෙළඳ හා වෙනත් ණයහිමියෝ | **438,075,172** | 505,143,703 | **438,075,172** | 492,390,761 |
| | සේවක ණයහිමියෝ | **21,369,585** | 19,670,583 | **21,369,592** | 19,670,586 |
| | ගෙවිය යුතු ගාස්තු | **20,118,436** | 30,728,503 | **17,585,330** | 27,476,062 |
| | වෙන්කිරීම් | **414,954,719** | 199,258,563 | **414,954,719** | 199,258,563 |
| | තැන්පතු | **24,767,220** | 14,939,533 | **24,767,220** | 14,939,533 |
| | ගෙවිය යුතු සේ.අ.අ. | **7,842,825** | 7,813,267 | **7,842,825** | 7,813,267 |
| | ගෙවිය යුතු සේ.භා.අ. | **1,215,220** | 1,174,508 | **1,215,220** | 1,174,508 |
| | ගෙවිය යුතු එකතු කල අගය මත බදු | **8,873,510** | 8,241,323 | **8,873,510** | 8,241,323 |
| | ගෙවිය යුතු රක්ෂණ වන්දි | **432,759** | 1,154,183 | **432,759** | 1,154,183 |
| | ගෙවිය යුතු LFICO | **4,201,333** | 4,201,333 | **4,201,333** | 4,201,333 |
| | SLPDC අත්තිකාරම් | **-** | - | **140,000,000** | 140,000,000 |
| | | **941,850,779** | 792,325,499 | **1,079,317,680** | 916,320,119 |
| **23** | **ලැබිය යුතු / ගෙවියයුතු බදු** | | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | **1,584,878** | 1,233,241 | - | - |
| | කාලපරිච්ඡේදය සඳහා ආදායම් බදු | **916,390** | 762,485 | - | - |
| | වර්ෂය තුළ ගෙවීම් | **-** | - | - | - |
| | රඳවාගැනීමේ බදු | **(506,828)** | (410,848) | - | - |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,994,440** | 1,584,878 | - | - |

## NATIONAL LIVESTOCK DEVELOPMENT BOARD AND ITS SUBSIDIARY

### පරිපාලිතයන් සමඟ සිදුකරන ගනුදෙනුවල හෙළිදරව් කිරීම් (2014-2017)

| අංකය | ගනුදෙනු ස්වභාවය | වාර්තාකරණ ඒකකයේ නම | 2017 රු. | 2016 රු. | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|---|---|---|
| 1 | පරිපාලිතයෙහි ආයෝජන | එන්එල්ඩීබී | 149,123,327 | 149,123,327 | 149,123,327 | 149,123,327 |

මණ්ඩලය විසින් 51%ක හිමිකම වෙනුවෙන් රු. 15,995,171ක් ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන පුද්ගලික සමාගමෙහි (ලැයිස්තුගත නොවූ ආයෝජන) ආයෝජනය කර තිබුණි. ලිබියාවේ 49% කොටස් හිමිකමක් පැවති ලිබියන් විදේශ ආයෝජන සමාගම 2014 මැයි මස 07 වන දින රු.මි.140ක ප්‍රතිෂ්‍යාවකට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට මාරු කරන ලදී.ඉන්පසු ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට සමාගමෙහි 100% අයිතියක් පැවතුණි. එමෙන්ම එම සමාගමේ නමද ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන සමාගම ලෙස 2014 ජූලි 03 වන දින සිට බලාත්මක වන පරිදි වෙනස් කරන ලදී. 2014 වර්ෂයේ සිට මෙම ආයෝජනය පිරිවැයට වාර්තා කර ඇත.

| අංකය | ගනුදෙනු ස්වභාවය | වාර්තාකරණ ඒකකයේ නම | 2017 රු. | 2016 රු. | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|---|---|---|
| 2 | එන්එල්ඩීබී වෙත ගෙවූ තැන්පතු | SLPDC | 140,000,000 | 140,000,000 | 140,000,000 | 140,000,000 |

මෙයින් ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවන ලද අත්තිකාරම් මුදල පෙන්නුම් කරයි. මෙම මුදල අනාගතයේදී ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම විසින් උපයනු ලබන ලාභ තුළින් හිලව් කිරීමක් සිදුකරනු ලබයි . ලද අත්තිකාරම් මුදලෙහි පසුකාලීනව සිදුකරන ගැලපීම ලාභාංශ මත පදනම්ව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙහි ගිණුම් පොත්වල දක්වනු ලබයි.

| අංකය | ගනුදෙනු ස්වභාවය | වාර්තාකරණ ඒකකයේ නම | 2017 රු. | 2016 රු. | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|---|---|---|
| 3 | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ | | | | | |
| | එන්එල්ඩීබී වෙතින් ලැබිය යුතු | SLPDC | 5,071,910 | 5,071,910 | 5,071,910 | - |
| | SLPDC වෙතින් ලැබිය යුතු | එන්එල්ඩීබී | 2,044,818 | 2,044,818 | 2,044,818 | 2,044,818 |

හඳුනාගනු ලැබූ අන්තර්සමාගම් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ අතර පවතින වෙනස්කම් ඉවත්කිරීම පහසු නොවේ.

## ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
## මූල්‍ය ප්‍රකාශය - 2008-2017

| | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 Rs. | 2015 Rs. | 2016 Rs. | 2017- Consol. Rs. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 957,304,113 | 889,769,026 | 1,099,722,297 | 1,231,958,718 | 1,292,521,701 | 1,313,364,411 | 1,978,846,217 | 2,035,439,080 | 2,534,981,092 | 3,033,375,475 |
| විකුණුම් මිල | 819,504,317 | 718,381,807 | 797,819,226 | 871,843,346 | 1,112,230,863 | 1,178,806,826 | 1,258,115,744 | 1,430,768,667 | 2,038,179,661 | 2,258,254,130 |
| වෙනත් ආදායම් | 26,112,641 | 19,562,865 | 19,625,364 | 29,968,042 | 24,613,907 | 85,033,393 | 48,386,112 | 37,635,778 | 49,329,658 | 50,681,871 |
| බෙදා හැරීමේ පිරිවැය | (4,552,859) | (4,045,274) | (3,574,785) | (4,382,003) | (3,838,749) | (3,790,967) | 2,745,716 | (14,469,311) | (4,981,161) | (6,790,596) |
| පරිපාලන වියදම් | (114,588,230) | (114,209,277) | (107,912,043) | (121,766,384) | (152,758,024) | (195,210,505) | (683,452,715) | (698,980,426) | (849,955,655) | (935,767,119) |
| වෙනත් වියදම් | | (24,498,613) | (10,656,712) | (1,414,972) | (7,015,061) | (8,876,522) | (29,739,428) | (19,641,939) | (6,898,522) | (11,721,077) |
| මූල්‍ය පිරිවැය | (38,292,839) | (37,772,053) | (28,695,065) | (14,017,242) | (29,478,232) | (37,909,314) | (56,168,331) | (89,151,155) | (122,396,709) | (179,613,563) |
| **බදු වලට පෙර ලාභය** | **20,020,563** | **24,561,426** | **178,945,158** | **250,195,158** | **29,421,086** | **2,096,835** | **60,505,358** | **(119,415,763)** | **(413,371,356)** | **(292,804,756)** |
| අඩු - බදු වියදම් | | | (2,481,711) | (1,506,504) | (3,126,841) | | (247,386) | (18,024,305) | (200,000) | (1,159,390) |
| **වසර සඳහා ශුද්ධ ලාභය** | **20,020,562** | **24,561,427** | **176,463,447** | **248,688,654** | **26,294,245** | **2,096,835** | **60,257,972** | **(137,420,063)** | **(413,571,356)** | **(309,248,529)** |
| **දළ ලාභ අනුපාතය** | 14% | 19% | 27% | 29% | 14% | 10% | 36% | 30% | 20% | 26% |
| **වත්මන් අනුපාතය** | 1.06 | 0.94 | 1.21 | 1.31 | 1.11 | 1.25 | 0.79 | 0.41 | 0.36 | 0.26 |
| **ණය ස්කන්ධ අනුපාතය** | 57% | 55% | 47% | 40% | 61% | 68% | 70% | 85% | 92% | 94% |
| **වත්කම් මත ආපසු** | 4.86% | 5.04% | 16.01% | 17.51% | 2.71% | 1.30% | 3.21% | -0.59% | -4.51% | -1.98% |


SUNBIRD

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එෆ්එල්/එස්/සී /එන්එල්ඩීබී/1/17/16 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2021 දෙසැම්බර් 31 දින | | |

සභාපති,

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතයෙහි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවමි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් 1 ලේකම්, මුදල් අමාත්‍යාංශය

2 ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එල්ජ්ඩී/බී /එන්එල්ඩීබී/1/17/16
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2021 දෙසැම්බර් 31 දින

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය -2017**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන හා පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල "සමූහය" ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13.1 වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154.1 ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14.2සී වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකිම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ඡේෂ 1000 - 1810 අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනිම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ 3 සහ 4 උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුමත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලින් හා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01**

I. ප්‍රමිතයෙහි 38 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනයන්හි සියළුම වර්තමාන අගයන් සඳහා අනුරූපී පෙර වර්ෂයේ වටිනාකම් ඉදිරිපත් කල යුතු වුවද දේපල පිරියත හා උපකරණ හා ජීව විද්‍යාත්මක වත්කම් හි කොටසක් වන වගාවන් Plantation සඳහා අනුරූපී පෙර වර්ෂයේ වටිනාකම් ඉදිරිපත් කර නොතිබුණි.

II. ප්‍රමිතයෙහි 10.4 ඡේදය අනුව මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන එකතුව රු.199,599,461ක් වූ විකුණුම් පිරිවැය තුළ එක් එක් ව්‍යාපෘතීන්හි වියදම් වර්ගීකරණය යටතේ, ක්ෂය, ක්‍රමක්ෂය වියදම් හා කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වියදම් ඇතුළුව වියදම්වල ස්වභාවය පිළිබඳ අතිරේක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10**

මණ්ඩලය විසින් වෙලාඩ් රූරල් එක්ස්පෝටඩ් පුද්ගලික සමාගම සමඟ අදියර 2ක් යටතේ කිරි ගවයින් ආනයනය සඳහා ඇමරිකන් ඩොලර් 33,691,351ක ණය මුදලක් ලබාගත් අතර අංක 20/1600/323/010 හා 2020 සැප්තැම්බර් 10 දිනැති කැබිනට් පත්‍රිකාව මඟින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එදිනට පැවති මුළු ණය ශේෂය වූ රු.6,175,407,893ක මුදලක් ප්‍රාග්ධනිත කිරීමටත් ඊට අදාළ මුළු ණය පොලිය කපා හැරීමටත් තීරණය කර තිබුණි. ප්‍රමිතයෙහි 21 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (12)**

ප්‍රමිතය ප්‍රකාරව, මණ්ඩලය විසින් විලම්භිත බදු වත්කම් හෝ විලම්භිත බදු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**ඈ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

I. මණ්ඩලයේ පාලන අයිතිය නොමැති හෙක්ටයාර් 10411.8 ක ඉඩම් සඳහා රු.256,655,083ක වටිනාකමක් ප්‍රමිතයට පටහැනිව මූල්‍ය ප්‍රකාශන තුළ දේපළ පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. එම අගයන් දක්වා ඇත්තේ 2004 වර්ෂයට පෙර සිට වන අතර එම වටිනාකම ගිණුම්වලට ගත් පදනම තහවුරු කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. තවද ඉහත පවරා නොගත් ඉඩම් තුල රු.198,031,557 ක් වටිනා ගොඩනැගිලි හා රු.1,249,663,008 ක් වටිනා ඉදිකිරීම් ද සිදුකර තිබුණි.

II. ප්‍රමිතයෙහි ඡේද 50 හා 51 අනුව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායී ජීවකාලයක් ඇස්තමේන්තු කර ගිණුම්වල ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කල යුතු වුවත්, ස්ථාවර වත්කම් ලේඛණයෙහි සඳහන් රු.82,309,600 ක් වටිනා අයිතම 10,428ක් සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණද ප්‍රමිතය අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

ප්‍රමිතයෙහි 25 ඡේදය ප්‍රකාරව කල්බදු ණයහිමියන් ගිණුම්ගත කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

ප්‍රමිතයෙහි 17 ඡේදය ප්‍රකාරව ආයතනයෙහි ප්‍රධාන කළමණාකරණ පාර්ශවයන්ට සිදුකරන කෙටි කාලීන සේවක ප්‍රතිලාභ, පශ්චාත් සේවක ප්‍රතිලාභ, අනෙකුත් දිගුකාලීන ප්‍රතිලාභ හා සේවාන්ත ප්‍රතිලාභ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36

ප්‍රමිතයෙහි 9 ඡේදය ප්‍රකාරව වාර්ෂික හානිකරණ තක්සේරුවක් සිදු කළ යුතු බව දක්වා තිබූ අතර එය මණ්ඩලයෙහි ගිණුම් ප්‍රතිපත්ති තුළ ද ඇතුළත් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.2,999,249,355ක් වූ වත්කම් සම්බන්ධයෙන් එවැනි හානිකරණ තක්සේරුවක් සිදු කර නොතිබුණි. මණ්ඩලයෙහි භාණ්ඩ සමීක්ෂණ වාර්තා වල භාවිතයට ගත නොහැකි අයිතම 50604ක් දක්වා ඇති අතර ප්‍රමිතයෙහි 12.ඊ ඡේදයෙන් දක්වා ඇති පරිදි එය හානිකරණ තක්සේරුවක් සිදු කළ යුතු බවට වන අභ්‍යන්තර මූලාශ්‍රයක් Internal Source of Information බව නිරීක්ෂණය විය.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

මණ්ඩලයට එරෙහිව පනවාතිබූ නඩු දෙකක් සඳහා වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව අධිකරණය විසින් රු.මි 3.1ක් බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතු බවට තීන්දුවක් ලබා දී තිබුණි. ප්‍රමිතයෙහි 14 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකළ යුතු වුවත් මණ්ඩලය විසින් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදු නොකර ගිණුම් සටහන් යටතේ හෙළිදරව් කිරීම් පමණක් සිදුකර තිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (39

ප්‍රමිතයෙහි 46.ආ ඡේදය ප්‍රකාරව ණය හා ලැබිය යුතු දෑ මැනිය යුත්තේ සඵල පොළී ය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැය මත පදනම්ව වන අතර ඒ අනුව කටයුතු කර නොතිබුණි. ඒ අනුව ලැබිය යුතු දෑ වටිනාකම් ඌන හෝ අධි ගණනය වන බව නිරීක්ෂණය විය.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40

ප්‍රමිතයෙහි 6 ඡේදය ප්‍රකාරව බදු දී ඇති ඉඩම්, ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට බ්‍රැන්ඩික්ස් ඉන්ටිමේට් පුද්ගලික සමාගමට හා රාජවෙල හෝල්ඩින්ස් සමාගමට බදු දී ඇති ඉඩම් වල බදු වටිනාකම රු.මි.31.6ක් හා රු.මි.29.41ක් වූ ඉඩම් හෙක්ටයාර 208.015ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41

I. ප්‍රමිතයෙහි 2 වන ඡේදයෙහි (ආ)වගන්තිය අනුව මෙම ප්‍රමිතයෙහි විෂය පථයට නොගැනෙන මණ්ඩලයේ පවතින රු.761,554,220ක් වූ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 යටතට අයත් වන අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල,පිරියත හා උපකරණ යටතේ දැක්විය යුතු වුවද මණ්ඩලය විසින් එම වටිනාකම ජංගම නොවන වත්කම් හි ජීව විද්‍යාත්මක වත්කම් හි වශයෙන් Plantation ලෙස වෙනම ම ඉදිරිපත් කර තිබුණි. තවද ප්‍රමිතය අනුව එම ශාක වටිනාකම මේරූ හා නොමේරූ ලෙස වෙන් වෙන් ව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ද නොතිබුණි

II. ගම්මිරිස් වගාව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන නොතිබුණි..

**(ඕ) ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත 13**

ප්‍රමිතයේ 91 ඡේදය ප්‍රකාරව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ජීව විද්‍යාත්මක වත්කම් යටතේ වාණිජ වගාවන් ලෙස දක්වා ඇති රු.24,929,309ක රබර්, රු1,335,383 ක කජු හා රු. 1,738,827 ක වෙනත් වගාවන් අගය කර ඇති පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) ණයගැති කාල විශ්ලේෂණ හා අඩමාණ ණය වෙන්කිරීමේ උපලේඛනය අනුව අවුරුදු 3-5 අතර කාලයක සිට අයවිය යුතු රු.8,671,204 ක ණයගැති වටිනාකම සඳහා 50% ක් වූ රු.4,335,602 ක අඩමාණ ණය ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි. ඒ අනුව මණ්ඩලයේ අඩමාණ ණය ප්‍රතිපාදනය සිදුකර ඇත්තේ රු. 49,31.8,143 ක වටිනාකමක් වන නමුත් වෙන් කල යුතු අඩමාණ ණය ප්‍රතිපාදනය වන්නේ රු.53,653,745 කි. ඒ අනුව රු.4,335,602 කින් අඩමාණ ණය අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන ලැබීම් රු.7,175,721ක වූ අතර එය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ රාජ්‍ය ප්‍රදාන ලෙස වෙනම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වනු වෙනුවට ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) රු.4,934,769ක් වූ කෙටිකාලීන ආයෝජන, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි වර්ෂය අවසාන මුදල් හා මුදල් සමාන දෑ යටතට ඇතුළත් විය යුතු වුවද මණ්ඩලය විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම්හි කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ කෙටිකාලීන ආයෝජන අඩුවීම ලෙස සටහන් කර තිබුණි.

(ඈ) වැලිසර ගොවිපොලේ ඉඩම් හෙක්ටයාර් 1.2 152 ක ප්‍රමාණයක කල්බදු වත්කම් මත ලැබිය යුතු වාර්ෂික ආයෝජන ආදායම රු.1,066,667ක් වුවද මූල්‍ය ප්‍රකාශනයන් හි ආයෝජන ආදායම යටතේ සටහන් කර ඇත්තේ රු.666,667ක් පමණක් වූ බැවින් ආයෝජන ආදායම රු.400,000කින් ඌන ගණන වී තිබුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට මහබේරියතැන්න හා මාරවිල ගොවිපලයන්හි එකතු කිරීමේ දෝෂ හේතුවෙන් පොල් හා කොප්පරා තොග වටිනාකම රු.88,071ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශන තුළ ජීව විද්‍යාත්මක වත්කම් අගය වැඩිවීම රු. 160,141,793 ක් වූ අතර 2016 වර්ෂයේදී එම අගය රු.306,842,364 ක අගය අඩුවීමක් වූයෙන් රු.466,984,157 ක් හෙවත් සියයට 152 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නියැදි විගණන පරීක්ෂාවක් වශයෙන් රිදියගම ගොවිපළෙහි 2016 හා 2017 වර්ෂයන්හි ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීමේ වාර්තා පරීක්ෂාවේදී සියළුම සතුන් කිරි නිෂ්පාදනය සඳහා දායක වන බව සලකා එක් සතෙකුගේ සාමාන්‍ය කිරි නිෂ්පාදනය ලීටර් 15 ක් හා ලීටරයකට රු.1,000 ක් බැගින් සියළුම සතුන් සඳහා රු.5,775,000 ක වටිනාකමක් ආගණනයේදී එකතුකර තිබුණි. ගර්භනී බව තහවුරු කර ඇත්තේ සතුන් 305 ක් සඳහා පමණක් වීමත් සෑම සතෙතකුම කිරි ලීටර් 15 ක් ලබාදෙන බවට සලකා තිබීමත් ගැටළු සහගතය. සාමාන්‍යයෙන් දේශීය සතෙකුගෙන් දිනකට ලබාගත හැකි කිරි ප්‍රමාණය ලීටර් 5ක් පමණ වන අතර ආගණනයේදී එය ලීටර්15ක් ලෙස ගැනීමද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව එම අගයන් තක්සේරු කිරීමද කිරි ලීටරයක වටිනාකම රු.1000ක් ලෙස ගැනීමද තාත්ත්වික නොවන බව නිරීක්ෂණය කෙරේ. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ජීව විද්‍යාත්මක වත්කම් අගය වැඩිවීම අධි ගණනය වන බව නිරීක්ෂණය විය.

## 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.98,023,448 ක්වූ ගොවි භාර අරමුදලේ පොලී සඳහා උපලේඛන හා ණය ගිවිසුම් ඉදිරිපත් නොවිය.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහබේරියතැන්න ගොවිපලෙහි ඉඩම් හෙක්ටයාර ප්‍රමාණය ස්ථාවර වත්කම් ලේඛණය අනුව හෙක්ටයාර 94.8ක් ලෙසද ඉඩම් රෙජිස්ටරය තුළ හෙක්ටයාර 174.9 ක් ලෙස හා උපලේඛනයෙහි හෙක්ටයාර 206 ක් ලෙස ද එකිනෙකට වෙනස් ප්‍රමාණයන්ගෙන් සටහන් වී තිබුණි.

(ආ) මණ්ඩලයට අයත් වාහන 04 ක් පිළිබඳ තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වී නොතිබුණි.

(ඇ) මණ්ඩලයට අයත් වාහන 53 ක් උපලේඛන අනුව සහ ස්ථාවර වත්කම් ලේඛනය අනුව අනුයුක්ත කර ඇති ගොවිපොළ එකිනෙකට වෙනස් විය.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ජීව විද්‍යාත්මක වත්කම් එහි සාධාරණ අගයට අගය කිරීමේදී හට ගන්නා ලද ලාභ වටිනාකම රු.12,716,521ක් වුවද ගොවිපල ගිණුම් අනුව වටිනාකම රු.10,766,096ක් වූයෙන් රු.1,950,425 ක වෙනසක් පැවතුණි

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් වෙනස්වීම ලෙස රු. 53,721,222ක් සටහන් වුවත් එය මුදල් ගලා ඒමක් නොවන බව නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට වෙලාඩ් ව්‍යාපෘතියේ ණය ශේෂය රු.4,462,252,656ක් වුවද භාණ්ඩාගාර ගිණුම් පොත් අනුව එදිනට ශේෂය රු.4,473,894,392ක් වූයෙන් රු.11,641,736ක වෙනසක් පැවතුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂ අතරින් අවුරුදු 1-5ත් අතර ණයගැතියෝ රු.58,982,113ක් වූ අතර රු.36,744,288 ක් අවුරුදු 5 ඉක්මවූ ණයගැතියන් විය. එය මුළු වෙළඳ හා අනෙකුත් ණයගැතියන්ගෙන් 17% ක් වූ අතර එම වටිනාකම අයකර ගැනීමට නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) ආනයනය කිරීමේදී මියගිය ගවයින් සදහා 2013 මැයි 13 දිනට ලැබිය යුතු රක්ෂණ වන්දි රු.19,253,926 ක් 2021 ඔක්තෝබර් 15 වන දින දක්වා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී පශු සම්පත් මණ්ඩලයට පවරා ගැනීමට නියෝග කර ඇති මහවැලි පශු සම්පත් සමාග මින් මණ්ඩලයට අයවිය යුතු වසර 4 ට හා 5 ට වඩා පැරණි කාලයක සිට පැවත එන එකතුව රු. 8,243,900ක මුදලක් මේ දක්වා අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) කන්තලේ ව්‍යාපෘතිය සදහා 2008 වසරේ සිට කන්තලේ ලංකා බැංකුවෙන් ලැබිය යුතුව තිබූ රු.2,092,150 ක මුදලක් මණ්ඩලය විසින් 2021 ඔක්තෝබර් 15 වන දින දක්වාම ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 වර්ෂයට පෙර ගොවිපොල 06 ක වටිනාකම රු.200,478 ක් වූ වසර 5 කින් අයකර ගැනිමට කාර්ය මණ්ඩලය සඳහා ලබාදී ඇති ණය මුදල් අදාල වසර 5 තුල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේදී පොල් තැරැව්කරුවන්ගෙන් අයවීමට ඇති රු.19,435,956 ක ණයගැති ශේෂය තුළ හඳුනා නොගත් රු.673,957 ක ණයගැති ශේෂයක්ද, අවුරුදු 5 ට වැඩි රු.11,401,407 ක ණය ශේෂයක්ද, අවුරුදු 3 සිට 5 ට දක්වා වූ රු.4,103,560 ක ණය ශේෂයක්ද විය.

(ඌ) පොල් සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කර ඇති පොල් වෙන්දේසියේ නිති මාලාවේ 24 වගන්තිය අනුව සති 5ක් ඇතුලත ඉවත් කර නොගන්නා පොල් සම්බන්ධව 20% ක වාර්ෂික පොලියක් මත දින 14 ක උපරිම කාලසීමාවකට යටත්ව දඩ ගැසීමක් ගණනය කල හැකි බව දක්වා තිබූ නමුත් මණ්ඩලය මගින් රු.3,749,341ක අයවිය යුතු දඩමුදල් අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඍ) වෙළඳ හා අනෙකුත් ණයහිමි ශේෂය තුළ රු.33,543,461 ක්වූ අවුරුදු 5 ඉක්මවූ ණයහිමියන් වූ අතර එය වෙළඳ හා අනෙකුත් ණය හිමියන් ගෙන් සියයට 8 ක් විය.

(එ) ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගම විසින් 2014 වර්ෂයේදී මණ්ඩලය වෙත රු.140,000,000ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යක් ඉටුකිරීමක් හෝ නැවත ගෙවිමක් සිදු කර නොතිබුණි.

(ඒ) මණ්ඩලය විසින් ගනුදෙනුකරුවන් දෙදෙනෙකුට එරෙහිව ගොනුකර තිබූ නඩු කටයුතු දෙකක් සම්බන්ධයෙන් එම පාර්ශවයන් විසින් මණ්ඩලයට ගෙවීම් කළ යුතු බවට නියෝග කර තිබූ රු.11,947,220ක් හා රු.2,093,175 ක මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ණයගැති ශේෂ තුල වසර 5 කට වඩා පැරණි රු. 366,017 ක ශේෂයක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන එම වටිනාකම ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාවේ රඳවාගත් පාරිතෝෂික ලෙස දක්වා තිබුණි.

(ඕ) ප්‍රධාන කාර්යාලය, ව්‍යාපෘති හා රොසීටා ගොවිපල මගින් අදාල අමාත්‍යාංශය වෙත ලබාදී ඇති වසර 3ක් ඉක්මවූ රු. 10,159,200 ක් වූ ණය ගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ක) වසර 5ට වැඩි සේවක ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.562,750ක මුදලක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

03. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු.309,248,529 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.432,282,544ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.123,034,015 කින් වර්ධනය වී තිබුණි. මෙහෙයුම් ආදායම රු.28,926,560කින් අඩුවීමත් විකුණුම් පිරිවැය, පරිපාලන වියදම හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු.179,730,919ක්, රු.43,401,303ක් හා රු. 57,188,003 කින් වැඩිවුවද ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ අගය වැඩිවීම තුළින් හටගත් ප්‍රතිලාභය රු. 466,984,157කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සංස්ථාවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

## අනුපාතය

| | 2017 | 2016 |
|---|---|---|
| ජංගම අනුපාතය | 0.26 | 0.42 |
| ක්ෂණික අනුපාතය | 0.177 | 0.179 |
| දළ ලාභ අනුපාතය | 26.98% | 17.81% |
| ශුද්ධ ලාභ අනුපාතය | 11% | 15% |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | 13.01 | 15.69 |
| ස්ථාවර වත්කම් පිරිවැටුම් අනුපාතය | 0.92 | 0.90 |
| තෝලන අනුපාතය | 8.07 | 5.61 |
| ණයගැති එකතුකිරීමේ කාලය | 28.36 | 23.27 |

### 6 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණ | ගොවිපල ගිණුම් පිළියෙල කිරීමේදී ඇතැම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම. |
| (ආ) ගොවිපල ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීම. | සතුන් ආගණනය කිරීමේ නිර්ණායක නිවැරදි නොවීම. |
| (ඇ) වත්කම් අගය කිරීම | ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඇගයීම් නොකිරීම. |
| (ඇ) ණය අයකර ගැනීම | දීර්ඝ කාලීනව පවතින ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

